24 වන කාණ්ඩය
16 වන කලාපය

බ්‍රහස්පතින්ද
1983 අගෝස්තු 11

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

අවනත වීමේ ප්‍රතිඥාව

නිවේදනය :
  කථානායකතුමාගේ සහතිකය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ශෝක ප්‍රකාශය : ඩී. එස්. ගුණසේකර මහතා

සමුපකාර සමිති (සංශෝධන) පනත් කෙටුම්පත
  දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

මුස්ලිම් කාන්තා සමාජ කවය (ලංකා) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත :
  සලකා බලා සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී

ලජ්නාතුල් මස්ජ්දුල් ජම්යා සෙයිලන් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත :
  දෙවන වර කියවා " බී " ස්ථාවර කාරක සභාවට පවරන ලදී

ආනයන හා අපනයන (පාලන) පනත : නියෝග

පරිපූරක මුදල් :
  කිරින්ද ධීවර වරාය යෝජනා ක්‍රමය
  පුස්කොළපොත් සූක්ෂ්ම චිත්‍රපටිගත කිරීම

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය :වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව : වාර්ෂික වාර්තාව

කල් තැබීමේ යෝජනාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 24
இல. 16

வியாழக்கிழமை
11 ஒகஸ்ட் 1983

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

•

## பிரதான உள்ளடக்கம்

உறுதிப்பிரமாணம்

அறிவிப்பு :
சபாநாயகரது சான்றிதழ்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

அனுதாபத் தீர்மாணம் : திரு. டீ. எஸ். குணசேக்கர

கூட்டுறவுச் சங்கங்கள் (திருத்தம்) சட்டமூலம் :
இரண்டாம், மூன்றும் மதிப்புக்களிடம்பெற்று, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது.

முஸ்லிம் பெண்களின் சமூக லீக் (இலங்கை) (கூட்டிணைத்தல்) சட்டமூலம்
பரிசீலிக்கப்பட்டு மூன்றும்முறை மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

லஜ்னதுல் மஸ்ஜிதுல் ஜாமியா ஸபிலான் (கூட்டிணைத்தல்) சட்டமூலம் :
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'பி' க்குச் சாட்டப்பட்டது

இறக்குமதி, ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம் : ஒழுங்குவிதிகள்

குறைநிரப்புத் தொகை :
கிரிந்த கடற்றொழில் துறைமுகத்திட்டம்
ஓலைச்சுவடிகளை நுண் ஒளிப்பதிவு செய்தல்

விவசாய அபிவிருத்தி அதிகார சபை : ஆண்டறிக்கை

ஸ்ரீ லங்கா புகையிலைக் கைத்தொழிற் கூட்டுத்தாபனம் : ஆண்டறிக்கை

ஒத்திவைப்புப் பிரேரணை

---

**Volume 24**
**No. 16**

**Thursday**
**11th August 1983**

# PARLIAMENTARY DEBATES

(HANSARD)

OFFICIAL REPORT

**(Uncorrected)**

## PRINCIPAL CONTENTS

AFFIRMATION

ANNOUNCEMENT :
Speaker's Certificate

ORAL ANSWERS TO QUESTINS

VOTE OF CONDOLENCE : MR. D. S. GOONASEKERA

CO-OPERATIVE SOCIETIES (AMENDMENT) BILL :
Read a Second, and the Third time, and passed as amended

MUSLIM WOMEN'S SOCIAL LEAGUE (CEYLON) (INCORPORATION) BILL :
Considered, red the Third time, and passed as amended

LAJNATHUL MASJIDUL JAMIYA SALIAN (INCORPORATION) BILL :
Read a Second time and allocated to Standing Committee "B"

IMPORT AND EXPORT (CONTROL) ACT : REGULATIONS

SUPPLEMENTARY SUPPLY :
Kirinde Fishery Harbour Project
Microfilming of Ola Manuscript

AGRICULTURAL DEVELOPMENT AUTHORITY : ANNUAL REPORT

SRI LANKA TOBACCO INDUSTRIES CORPORATION : ANNUAL REPORT

ADJOURNMENT MOTION

2—ஏ 71161—2,600 (83/8)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

**1983 අගෝස්තු 11 වන බ්‍රහස්පතින්දා**

***வியாழக்கிழமை, 11 ஓகஸ்ட் 1983***

*Thursday, 11th August, 1983*

---

*අ. භා. 3 ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [අල් හාජ් එම්. අබ්දුල් බාකීර් මාකාර් මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் பி. ப. 3 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [அல் ஹாஜ் எம். அப்துல் பாகிர் மாகார்] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 3.00 p.m.* MR. SPEAKER [AL HAJ M. ABDUL BAKEER MARKAR] *in the Chair.*

## අවනත වීමේ ප්‍රතිඥාව
### உறுதிப் பிரமாணம்
### AFFIRMATION

*අබ්දුල් කාදර් ෂාහුල් හමීඩ් මහතා (හාරිස්පත්තුව පළමුවන) සයවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපේක්ෂිත ප්‍රතිඥාව දී පොතෙහි අත්සන් කළේය.*

*(ஜனாப் அப்துல் காதர் ஷாஹுல் ஹமீத் (ஹரிஸ்பத்துவ முதலாம் அங்கத்தவர்) அரசியலமைப்பின் ஆறாவது திருத்தத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப் பிரமாணம் செய்து சபாபீடத்தில் இருந்த புத்தகத்திற் கைச்சாத்திட்டார்.*

*Mr. Abdul Cader Shaul Hameed (First Harispattuwa) made and subscribed the Affirmation required by the Sixth Amendment to the Constitution ; and signed the Book.*

## නිවේදනය
### அறிவிப்பு
### ANNOUNCEMENT

**කථානායකතුමාගේ සහතිකය**

***சபாநாயகரது சான்றிதழ்***

SPEAKER'S CERTIFICATE

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I wish to announce that I have, under the provisions of Article 79 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka, endorsed the Certificate on the following Bill on 11th August, 1983 :

STATE LANDS (RECOVERY OF POSSESSION) (AMENDMENT)

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினாக்களுக்கு வாய்மூல விடைகள்
### ORAL ANSWERS TO QUESTIONS

**කේ. ජේ. ඒ. සෝමසිරි මහතා: වැන්දඹුවට ලැබිය යුතු මුදල්**

***திரு. கே. ஜே. ஏ. சோமசிறி : விதவைக்குச் சேர்மதி***

MR. K. J. A. SOMASIRI : DUES TO WIDOW

228/83

1. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க—காலி)*
(Dr. W. Dahanayake–Galle)

වෙළඳ හා නාවුක කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1982 ඔක්තෝබර් 8 වෙනි දින මරණයට පත්, ගාල්ලේ වරාය අධිකාරියේ පෝර්මන් තනතුරක් දැරූ කේ. ජේ. ඒ. සෝමසිරි මහතාගේ වැන්දඹු භාර්යාව වන ගාල්ලේ මකුළුව මහලියවත්තේ අංක 14 හි පදිංචි ඇස්. ඒ. මිසිනෝනා මහත්මියට ලැබිය යුතු සියලුම ගෙවීම් අප්‍රමාදව ගෙවීමට එතුමා ක්‍රියා කරන්නේද? (ආ) නොඑසේ නම්, ඒ මන්ද?

*வர்த்தக, கப்பற் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) காலித்துறைமுக அதிகார சபை முகாமியாக இருந்து 1982 அக்தோபர் 08 இல் காலஞ் சென்றவரான திரு. கே. ஜே. ஏ. சோமசிறி என்பவரின் கைம்பெண்ணும் 14, மகாலியவத்தை, மக்குலுவ, காலி என்ற முகவரியினருமாகிய திருமதி எஸ். ஏ. மிஸிநோனா என்பவருக்குரிய சேர்மதி அனைத்தையும் மேலும் தாமதமின்றிச் செலுத்துவாரா? (ஆ) இல்லையேல் ஏன்?*

asked the Minister of Trade and Shipping : (*a*) Will he pay without further delay all dues to Mrs. S. A. Missienona, No. 14, Mahaliyawatta, Makuluwe, Galle, whose husband, the late Mr. K. J. A. Somasiri, Foreman, Ports Authority, Galle, died on 8th October, 1982 ? (*b*) If not, why ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශවයේ ප්‍රධාන සංවිධායකතුමා)**

*(திரு. எம். வின்சன்ற் பெரேரா—பாராளுமன்ற அலுவலகள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)*

(Mr. M. Vincent Perera–Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I answer on behalf of the Minister of Trade and Shipping. (*a*) Does not arise as all dues to Mrs. S. A. Missionona have been paid by the Sri Lanka Ports Authority, as follows : (i) on 19.10.82, Rs. 567.12 was paid, being the amount payable in respect of the last month of service ; (ii) Rs. 1,000 was paid on 19.10.1982 as death donation ; (iii) Rs. 2186.88 was paid as arrears on account of salary revision implemented, with effect from 1.8.1979. Mrs. Missinona has confirmed in writing that she has received all monies due to her from the Ports Authority. (*b*) Does not arise.

**ඒ. වී. ජොසිනෝනා මහත්මිය: විශ්‍රාම ප්‍රතිලාභ**

***திருமதி ஏ. வி. ஜொஸிநோனா : இளைப்பாற்று நன்மைகள்***

MRS. A. V. JOSSIENONA : RETIREMENT BENEFITS

229/83

2. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා සහ ආහාර හා සමූපකාර ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලබුදූව ගොවිපලේ ගැහැණු කම්කරු වශයෙන් සේවය කොට 1980 දී විශ්‍රාම ලත්, අක්මීමන තොටගොඩ අංක 3 පදිංචි ඒ. වී. ජොසිනෝනා මහත්මිය තමාට හිමි අර්ථසාධක අරමුදල් ඉල්ලුම් කර ඇති බව එතුමා දන්නවාද? (ආ) ඇයට හිමි සියළුම ගෙවීම් අප්‍රමාදව ගෙවීමට එතුමා පියවර ගන්නේද? (ඉ) නොඑසේ නම් ඒ මන්ද?

*விவசாய, அபிவிருத்தி ஆராய்ச்சி அமைச்சரும், உணவு, கூட்டுறவு அமைச்சருமானவரைக் கேட்ட வினா: (அ) லபுதுவா பண்ணையில் பெண் தொழிலாளியாக இருந்து 1980 இல் ஓய்வுபெற்றவரும் 3 தொட்டகொடை அக்மீமன என்ற முகவரியுடையவருமாகிய திருமதி ஏ. வி. ஜொஸி*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා]

தோனு என்பவர் சேமலாபநிதிக் கொடுப்பனவுகளை கோருகின்றார் என்பதை அவர் அறிவாரா? (ஆ) மேலும் தாமதமின்றி அவருக்குரிய சேர்மதி அனைத்தையும் செலுத்த அவர் நடவடிக்கை எடுப்பாரா? (இ) இல்லையேல் ஏன்?

asked the Minister of Agricultural Development and Research and Minister of Food and Co-operatives: (*a*) Is he aware that Mrs. A. V. Jossienona of No. 3, Totagoda, Akmeemana, who retired in 1980, as female labourer, Labuduwa Farm, claims Provident Fund dues? (*b*) Will he take steps to pay her all dues without further delay? (*c*) If not, why?

එස්. එස්. අබේසුන්දර මහතා (නියෝජ්‍ය කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා)
*(திரு. எஸ். எஸ். அபேசுந்தர—விவசாய அபிவிருத்தி, ஆராய்ச்சிப் பிரதி அமைச்சர்)*
(Mr. S. S. Abeysundera–Deputy Minister of Agricultural Development & Research)

(*a*) Yes. (*b*) Action will be taken to refund the contributions no sooner the Secretary of the Public Service Provident Fund authorises such refund. (*c*) Does not arise.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

Is he aware that this matter has been delayed for nearly three years?

එස්. එස්. අබේසුන්දර මහතා
*(திரு. எஸ். எஸ். அபேசுந்தர)*
(Mr. S. S. Abeysundera)

Application ws made on 23.6.81 for the refund of the provident fund monies due to her. Although severl reminders have been sent so far no reply has been received.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

As far as we are concerned, is it not the fact that we have to hold the Hon. Minister responsible?

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

They have been prompt in taking action, according to the Minister's reply.

එස්. එස්. අබේසුන්දර මහතා
*(திரு. எஸ். எஸ். அபேசுந்தர)*
(Mr. S. S. Abeysundera)

Everyting will be done to expedite it.

### පී. වී. චන්ද්‍රසිරි මහතා: සේවයේ ස්ථිරතාව
### திரு. பீ. வி. சந்திரசிறி : நிரந்தரமாக்கல்
### MR. P. V. CHANDRASIRI : PERMANANCY

230/83

3. ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

කෘෂිකාර්මික සංවර්ධනය හා පයෝෂණ පිළිබද ඇමතිතුමා සහ ආහාර හා සමුපකාර ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අක්මීමන, තොටගොඩ පී. වී. චන්ද්‍රසිරි මහතා ලබුදූව ගොවිපලේ අනියම් කම්කරුවකු වශයෙන් අවුරුදු 12 කට වැඩි කාලයක් සේවය කර ඇති බව එතුමා දන්නවාද? (ආ) චන්ද්‍රසිරි මහතා විශ්‍රාම වැටුප් හිමිකම් සහිතව තනතුරෙහි ස්ථිර කිරීමට එතුමා ක්‍රියා කරන්නේද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சரும், உணவு கூட்டுறவு அமைச்சருமானவரைக் கேட்ட வினா: (அ) தொட்டகொடை, அக்மீமனை என்ற முகவரியிலிருப்பவராகிய திரு. பீ. வி. சந்திரசிறி லபுதுவாப் பண்ணையில் 12 ஆண்டுகளுக்கு மேலாக ஓர் அமயத் தொழிலாளியாக இருக்கின்றார் என்பதை அவர் அறிவாரா? (ஆ) ஓய்வூதிய உரிமையுடன் இவரை நிரந்தரமாக்குவாரா? (இ) இல்லையேல் ஏன்?

asked the Minister of Agricultural Development and Research and Minister of Food and Co-operatives: (*a*) Is he aware that Mr. P. V. Chandrasiri of Totugoda, Akmeemana, has been a casual labourer in Labuduwa Farm for over 12 years? (*b*) Will he make Mr. Chandrasiri permanent with pension rights? (*c*) If not, why?

එස්. එස්. අබේසුන්දර මහතා
*(திரு. எஸ். எஸ். அபேசுந்தர)*
(Mr. S. S. Abeysundera)

(*a*) Yes. (*b*) He will be granted permanent and pensionable status on completion of the requisite period of service. (*c*) *Vide* (*b*) above.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 4.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
*(திரு. எம். வின்சன்ற் பெரோரா)*
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Justice, I ask for two months' time, Sir.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

### එප්පාවල පාෂාණ පොස්පේට් යෝජනා ක්‍රමය
### எப்பாவெல ரொக்பொஸ்பேட் திட்டம்
### EPPAWELA ROCK PHOSPHATE PROJECT

320/83

5. ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—அத்தனகல்ல)*
(Mr. Lakshman Jayakody–Attanagalla)

කර්මාන්ත සහ විද්‍යා කටයුතු පිළිබද ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) එප්පාවල පාෂාණ පොස්පේට් යෝජනා ක්‍රමයේ ශක්‍යතා අධ්‍යයනය සහ වෙනත් කටයුතු ගැන කරුණු පැහැදිලි කිරීමට ප්‍රෙඩ් හියුස් ජී. අයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිග් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ඩී. ඩබ්ලිව්. කල්වර්ට් යන මහතුන්ගෙන් සමන්විතවූ ටෙක්සාස්හි ඇග්‍රිකෝ කෙමිකල් කෝපරේෂන් ආයතනයේ පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණ ජී. වී. පී. සමරසිංහ මහතා සහ දිලිප් ජයවර්ධන මහතා නැමැත්තෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් ලාංකික නිලධාරීන් පිරිසක් හමුවූ බව එතුමා දන්නේද? (ආ) මේ සමාගම ඉදිරිපත් කළ යෝජනාත් විශේෂයෙන්ම රජයේ සහතිකය, බදු සහන, ජාතික ආරක්ෂාව සහ වාසිය පිළිබඳව සැපයූ පිළිතුරක් එතුමා සභාගත කරන්නේද? (ඇ) නොඑසේ නම්, ඒ මන්ද? (ඈ) මේ ව්‍යාපෘතියේ සම්පූර්ණ අයිතිය රජයට තබාගෙන, එහි කළමනාකරණය සහ අලෙවි කටයුතු ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ගෙනයාමට එතුමා ලෝක ටෙන්ඩර් කැඳවන්නේද? (ඉ) නො එසේ නම් ඒ මන්ද ?

*கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா: (அ) டெக்ஸாஸ் விவசாய இரசாயனக் கூட்டுத் தாபனத்தின் பணிப்பாளர் சபைத் தலைவர் திரு. டி. டபிள்யு. கல்வேட், திரு. பிரெட் ஹியூக்ஸ், திரு. ஜி. ஐ. பிக் ஆகியோர் திரு. ஜி. வி. பி. சமரசிங்க தலைமையில் திரு. திலிப் ஜயவர்த்தனவைக் கொண்ட இலங்கை அதிகாரிகள் குழுவைச் சந்தித்து, எப்பாவெல ரொக்பொஸ் பேட் திட்டத்தின் சாத்தியக் கூற்றுய்வு சம்பந்தமான விளக்கம் பெற இயற்கை வந்தார்கள் என்பதை அவர் அறிவாரா? (ஆ) இக் கம்பனியார் சமர்ப்பித்த பிரேரணைகளையும், அதற்கு விடையாக, விசேடமாக அரசாங்க உத்தரவாதம், வரிச் சலுகை, தேசிய பாதுகாப்பு தேசிய நலன் சம்பந்தமாக சமர்ப்பிக்கப்பட்டவற்றையும் அவர் சபையில் சமர்ப்பிப்பாரா? (இ), இல்லையேல் ஏன்? (ஈ) முகாமைத்துவத்தையும் சந்தைப்படுத்தலையும் கூட்டு முயற்சியாகவும், கருத்திட்டத்தின் முழு உரிமையும் அரசுக்குரியதாகவும் அமைய உலகில் எல்லாப் பகுதிகளிலும் இருந்து இக் கருத்திட்டத்தைப் பொறுப்பெடுக்க கேள்விகளைக் கோருவாரா? (உ) இல்லையேல் ஏன்?*

asked the Minister of Industries and Scientific Affairs: (*a*) Is he aware that a team from Agrico Chemical Corporation of Texas comprising Mr. Fred Hughes, Mr. G. I. Pigg and the Chairman of the Board of Directors Mr. D. W. Calvert arrived in Sri Lanka and met a team of Sri Lankan officials headed by Mr. G. V. P. Samarasinghe and one Mr. Dilip Jayawardene to clarify matters pertaining to the feasibility study and other matters in respect of the Eppawala Rock Phosphate Scheme? (*b*) Will he table the proposals submitted by this Company and the submission in reply especially on the subject of State guarantee, tax concessions and national security and interest? (*c*) If not, why? (*d*) Will he call for world-wide tenders to undertake the project, keeping the total ownership of the project to the State and the Management and Marketing done on a basis of joint venture? (*e*) If not, why?

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා (නියෝජ්‍ය කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)**
*(திரு. என். டென்சில் பெர்னாண்டோ — கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் பிரதி அமைச்சர்)*
(Mr. N. Denzil Fernando–Deputy Minister of Industries & Scientific Affairs)

*a*) No. (*b*) Agreement is not finalised. (*c*) Does not arise. (*d*) Ministry of Industries and Scientific Affairs called for tenders in 1978. There is no need to call for world-wide tenders again. (*e*) Does not arise.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

Is the hon. Deputy Minister aware when he says "No" to (*a*)–

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
*(திரு. என். டென்சில் பெர்னாண்டோ)*
(Mr. N. Denzil Fernando)

Pardon!

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

He may not be aware, Sir, but the whole world knows. To the first question "Is he aware?", he said "No".

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
*(திரு. என். டென்சில் பெர்னாண்டோ)*
(Mr. N. Denzil Fernando)

Yes.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

Are you taking responsibility for that statement, "No."?

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
*(திரு. என். டென்சில் பெர்னாண்டோ)*
(Mr. M Denzil Fernando)

Otherwise?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

Then my second question–(*Interruption*). Do not laugh.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
*(திரு. என். டென்சில் பெர்னாண்டோ)*
(Mr. N. Denzil Fernando)

I am not misleading this House.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

He is quite correct in saying that he is accepting responsibility. No Minister makes a statement without taking responsibility.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

Thank you very much. He is taking responsibility.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
*(திரு. என். டெனசில் பெர்னாண்டோ)*
(Mr. N. Denzil Fernando)

Certainly.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

At least there is someone who is taking responsibility. Other Ministers do not take responsibility. I congratulate him on his reply.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please ! Do not imply motives in this House.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

To question (*b*) he said "Agreement is not finalised ". That is because he is having discussions with the persons mentioned in (*a*). Will he, after having discussions with the persons mentioned in (*a*), table the Report in this House before a contract is signed ?

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

If necessary and if the Cabinet allows it, I will do it.

### සීමාසහිත නක්කල සීනි සමාගම
### நக்கல சீனிக் கம்பனி
## NAKKALA SUGAR CO., LTD

324/83

6. ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා සහ ආහාර හා සමුපකාර ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රජය විසින් දැන් අනුමත කොට පිළිගෙන ඇති ප්‍රරෝහණතා, ශක්‍යතා සහ ලාභදායිතා පිළිබඳ වාර්තා සහ ශ්‍රී ලංකා රජයත් සීමා සහිත නක්කල සීනි සමාගමත් අතර වූ සියලු හුවමාරු ලිපි එතුමා සභාගත කරන්නේද? (ආ) නොඑසේ නම් ඒ ඇයි ?

விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சரும் உணவு, கூட்டுறவு அமைச்சருமானவரைக் கேட்ட வினா (அ) அரசாங்கத்தால் ஏற்று அங்கீகரிக்கப்பட்ட நக்கல சீனி கம்பனி லிமிட்டட்டுக்கும் இலங்கை அரசாங்கத்துக்குமிடையில் பரிமாறிக் கொள்ளப்பட்ட சகல கடிதங்களையும் பொருளாதார வாய்ப்பு நிலை, சாத்தியக் கூற்று, இலாபகரத் தன்மை போன்றவை தொடர்பான அறிக்கைகளையும் அவர் சமர்ப்பிப்பாரா? (ஆ) இல்லையேல், ஏன்?

asked the Minister of Agricultural Development and Research and Minister of Food and Co-operatives: (*a*) Will he table the viability, feasibility and profitability reports and all letters of exchange between the Government of Sri Lanka and Nakkala Sugar Co. Ltd., which have now been approved and accepted by the Government ? (*b*) If not, why ?

එස්. එස්. අබේසුන්දර මහතා
(திரு. எஸ். எஸ். அபேசுந்தர)
(Mr. S. S. Abeysundera)

(*a*) No. (*b*) The viability, feasibility and profitability reports and all letters of exchange between the Government of Sri Lanka and Nakkala Sugar Co. Ltd., are of a confidential nature. If these documents are made public, it could prejudice the interests of the Company. It is the responsibility of the Government to maintain confidentiality in the interest of future negotiations for the establishment of joint venture projects of this nature. No foreign investor would be willing to deal with a Government that does not respect confidentiality.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Is the Deputy Minister aware that Treasury money is involved in this business and will he please see that this House, all Members of Parliament are informed about the land that has been given over ? Because it is a business concern of a public nature, will the Hon. Minister see at least that the accounts are submitted through him to the Hon. Finance Minister and then to the Public Accounts Committee ?

එස්. එස්. අබේසුන්දර මහතා
(திரு. எஸ். எஸ். அபேசுந்தர)
(Mr. S. S. Abeysundera)

If and when the time arises and when the agreement is completed, we shall do so.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Is the Deputy Minister aware that the agreement is now completed ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I think the hon. Member has exhausted the number of questions.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

The Deputy Minister says, " If and when the time arises". Is he aware that the agreement has been signed and completed and that we are asking this question after everything is over ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

You are asking too many supplementary questions, all in a bunch.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I am asking three questions.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

All in a bunch !

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

That is a different matter. That is my technique of asking questions.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I can allow you only three Supplementary Questions, whatever form they may take.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Is the Deputy Minister answering my third question ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I think he has said that when the time arises he will consider taking action.

## ශෝක ප්‍රකාශය : ඩී. එස්. ගුණසේකර මහතා
### அனுதாபத் தீர்மானம் : திரு. டீ. எஸ். குணசேக்கர
### VOTE OF CONDOLENCE : MR. D. S. GOONESEKERA

එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(திரு. எம். வின்சன்ற் பெரேரா—பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)
(Mr. M. Vincent Perera – Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

Mr. Speaker, I rise with a sense of profund loss to move a Vote of Condolence on the death of Mr. Don Samuel Goonesekera, a former member of our legislature for nearly 13 years. With his sudden death another link of a distinguished generation of public men has snapped. Born on 13th November, 1896, he passed away on 7th August, 1983.

D. S. who received his education at Mahinda College, Galle, was a student of the late F. L. Woodward. He hailed from the southern landed gentry who were pioneers in the Buddhist Revival. A surveyor by profession, he started work as a Court Commissioner in the Distict Court of Gall in 1919. He entered public life through the Temperance Movement in 1920, when he was elected Vice-Chairman of the Galle MahaJana Sabha and President of the Imaduwa Maha Jana Sabha. Mr. Goonesekera was a founder member of the Young Men's Buddhist Association, Galle, and served as its President for 28 years. He started the first night school in Galle. He was Manager of the Bedipita Buddhist Mixed School and of the Habaraduwa B.T.S. School. He constructed and donated two school buildings. These are but a few instances of his keen interest in promoting education. A dedicated Buddhist worker, he was a devoted *dayaka* of several Buddhist temples including Sudharmalaya Temple in Fort, Galle ; Vidyaloka Pirivena, Galle, and Paragoda Raja Maha Viharaya.

Mr. D. S. Goonesekera has made a significant contribution in the field of local politics. In 1926 he was elected Chairman of the Kodagoda Village Committee and served in that capacity for 44 years. He was also elected a Member for the Bazaar Ward of the Galle Municipal Council and represented that ward for over a decade. Mr. Goonesekera was elected Mayor of Galle in 1944 and participated in the Indo-Ceylon Mayoral Conference held in Calcutta in that year. In recognition of his services in this field, he was elected Chairman of the All-Ceylon Village Committees' Conference.

Mr. Goonesekera who took a keen interest in Agriculture and Commerce, served as President of the Galle Merchants' Chamber and as President of the Katukurunda Rural Development Society.

Turning his attention to national politics, he joined the Ceylon National Congress and later the Sinhala Maha Sabha. Among his close associates were Mr. D. S. Senanayake, Sir John Kotelawala and Mr. S. W. R. D. Bandaranaike. In 1939 he unsuccessfully contested the Udugama-Baddegama Seat in the State Council rendered vacant by the death of Mr. Neil Hewavitarana.

At the first Parliamentary election of 1947 he successfully contested the Udugama Seat as the United National Party nominee. In 1951 he left the UNP along with Mr. S. W. R. D. Bandaranaike to form the Sri Lanka Freedom Party. At the 1956 General Election he contested and won the Udugama Seat as the SLFP nominee. Later he was appointed Parliamentary Secretary to the Minister of Home Affairs. At the General Election of July 1960 he was returned as Member for Habaraduwa by a comfortable majority and was appointed Parliamentary Secretary to the Minister of Commerce, Trade, Food and Shipping. At the Cabinet reshuffle of 1963, he was appointed Minister of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. වින්සන්ට් පෙරේරා මහතා]

Labour & Social Services. This appointment was welcomed by both the Government and the Opposition. In July 1964 he took over the new Ministry of Cultural Affairs and Social Services. A teetotaller and non-smoker, he campaigned both in and out of Parliament for total prohibition and a ban on racing.

A kind husband and a devoted father, he leaves behind his wife and 14 talented children who now serve this country in various walks of life.

His exemplary life has been an inspiration to all those who knew him. The country is poorer by the loss of so honourable a gentleman.

Mr. Speaker, I propose that the condolence of this House be conveyed to the members of the bereaved family.

අ. භා. 3.15

**මෛත්‍රීපාල සේනානායක මහතා** (මැදවච්චිය)
***(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)***
(Mr. Maithripala Senanayeke–Medawachchiya)

ගරු කථානායකතුමනි, 1947 දී මමත් සමග පාර්ලිමේන්තුවට පත්වි පැමිණි ඩී. එස්. ගුණසේකර මහතාගේ අභාවය විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ගේ කනගාටුවට කාරණයක් වන බව පළමුවෙන්ම කියන්න කැමතියි. 1947 දී පාර්ලිමේන්තුවට පැමිණ, 1951 ජූලි මාසයේදී එද පළාත්පාලන හා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් සහ සභානායක වශයෙන් සිටි එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමාත් සමග ගත් ඓතිහාසික පියවරේ ගුණසේකර මැතිතුමා කොටස්කාරයකු වූ බවත් මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. ඒ. පී. ජයසූරිය මැතිතුමා, ජෝර්ජ් ආර්. ද සිල්වා මැතිතුමා, ඩී. ඒ. රාජපක්ෂ මැතිතුමා, ජයවීර කුරුප්පු මැතිතුමා යන මහත්වරුන් හතර දෙනාත් සමග එද ආණ්ඩු පක්ෂයේ සිට විරුද්ධ පක්ෂයට ගිය ඩී. එස්. ගුණසේකර මැතිතුමා එම ඓතිහාසික සිද්ධියට සම්බන්ධ වුණු අයගෙන් ඉතිරිව සිටි අවසාන පුද්ගලයා වන බවත් මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

එතුමා එද ගත් ඒ පියවරින් බිහිවුණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තුන් වරක්ම මේ රටේ පාලන බලය ලබා ගන්නට හැකි වූවා පමණක් නොව, මේ රටේ මහජනතාවට විශාල සේවයක් කිරීමටද හැකියාවක් ලැබුණ බව සඳහන් කරන්න ඕනෑ. ඩී. එස්. ගුණසේකර මැතිතුමා එද ඒ ගත් පියවර නිසා පමණක් නොව ආගමික වශයෙන්, සමාජීයීය වශයෙන් හා දේශපාලන වශයෙන්ද රුහුණේ ජනතාවට විශිෂ්ඨ සේවයක් කළ නිසාද එතුමා ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් හැටියට හඳුන්වන්න පුළුවන්. මෙතුමා දිවංගත අගමැති බණ්ඩාරණායක මැතිතුමාත් සමග එද ආණ්ඩු පක්ෂයේ සිට විරුද්ධ පක්ෂයට ගිය මන්ත්‍රීවරුන් පස් දෙනාගෙන් එක් කෙනෙක් වුණා. සංස්කෘතික කටයුතු සහ සමාජසේවා ඇමතිතුමා වශයෙන්ද කටයුතු කර ඇති මෙතුමා කම්කරු ඇමතිතුමා වශයෙන් කටයුතු කරද්දී ගත් පියවරක් සම්බන්ධවද මෙතුමාගේ නම සඳහන් කිරීමට හැකි වෙන බවත් මේ අවස්ථාවෙහිදී මතක් කරන්නට ඕනෑ. එදා ඩී. එස්. ගුණසේකර මැතිතුමා කම්කරු ඇමති වශයෙන් සිටි කාලයේදී යූ. ආර්. ඩබ්ලිව්. කියන කම්කරු පිරිස පාවිච්චි කරමින්ද අද විශේෂ නගරයක් වශයෙන් පිහිටුවන්නට යන මාලිගාවත්තේ භූමි ප්‍රදේශය ගොඩකිරීමට පළමුවැනි පියවර ගත් බව මේ අවස්ථාවේදී අමතක කරන්න බැහැ. එද ඒ කම්කරු පිරිසට තාවකාලික රක්ෂාවල් සැපයෙන හැටියට ඒ මුඩු බිම් පිරවීමට කටයුතු කළා පමණක් නොව ඒ කම්කරුවන් පසුව ස්ථිර තත්ත්වයට පත් කරන්නටත් කැබිනට් මණ්ඩලයේ විශේෂ සටනක්ගෙන ගිය පුද්ගලයෙක් හැටියටත් ගුණසේකර මහතා හඳුන්වන්න පුළුවන්. 1947 දී එතුමා සමග පාර්ලිමේන්තුව තුළට පැමිණ, එතුමා සමග එකට වැඩ කරන්න ලැබුණ පුද්ගලයන් වැඩි දෙනෙක් අද පාර්ලිමේන්තුවේ නැහැ. අපි කිප දෙනෙක් පමණයි, ඉන්නෙ. එවැනි ඓතිහාසික, ආගමික හා ජාතික වීරයෙක් සමග අපට වැඩ කරන්න ලැබීමත් විශේෂ සතුටක් බව සඳහන් කරන්න ඕනෑ.

එතුමාගේ අභාවය නිසා රුහුණේ මහජනතාවට පමණක් නොව, මේ රටේ වැඩ කරන සාමාන්‍ය පොදු මහජනතාවටද ලොකු පාඩුවක් වුණා. එතුමාගේ අභාවය ගැන අපගේ ශෝකය එතුමාගේ පවුලේ අයට දන්වන හැටියට ගරු කථානායකතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ජී. වී. එස්. ද සිල්වා මහතා** (හබරාදූව)
***(திரு. ஜீ. வீ. எஸ். த சில்வா—ஹபராதுவ)***
(Mr. G. V. de Silva–Habaraduwa)

ගරු කථානායකතුමනි,ඩී. එස්. ගුණසේකර මහතාගේ අභාවය ගැන මේ ගරු සභාවේ ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේදී හබරාදූව ආසනය නියෝජනය කරන මමත් මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කතා කරන්න බලාපොරොත්තු වෙනවා.

හබරාදූව ආසනය පළමුවෙන්ම පටන් ගත්තේ 1960 දියි. ඊට ප්‍රථම එම ප්‍රදේශයත් අයිති වුණේ වැලිගම ආසනයටයි. හබරාදූව ආසනය පටන් ගත් ද සිටම ඩී. එස්. ගුණසේකර මැතිතුමා එහි මන්ත්‍රීවරයා වශයෙන් පත්වී ඇමතිවරයෙකු වශයෙන් කටයුතු කළ බව මේ ගරු සභාවේදී කියැවුණා. එද පුදුම විධියේ හැඟීමකින් යුක්තව හබරාදූව ආසනයේ ජනතාව නියෝජනය කළ බව මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. අවුරුදු 44 ක කාලයක් තිස්සේ හබරාදූව ආසනයේ, පරගොඩ ගම් සභාවේ සභාපතිව සිටිමින් එතුමා වාර්තාවක් පිහිටෙව්වාය කියන්න පුළුවනි. ඒ වගේම එතුමා 1939 සිට 1953 දක්වා ගාල්ලේ නගර සභාවේ නියෝජිතයෙක් වශයෙන් කටයුතු කළ අතර අන්තිමේදී අවුරුද්දක පමණ කාලයක් නගරාධිපති වශයෙනුත් කටයුතු කළා.

ඊටත් වඩා එතුමා ගැන විශේෂයෙන් සඳහන් කළ යුත්තක් තිබෙනවා. එතුමා වැවිලිකරුවෙක්. එතුමාට විශාල වතු රාශියක් තිබුණා. නමුත් දේශපාලන කටයුතුවලට පමණක් නොව ආගමික හා සාමාජික කටයුතු සඳහාත් විශාල මුදලක් වියදම් කරන්න සිදු වුණු නිසා ඒ වතු බොහොමයක් එක්කෝ විකුණන්න, එහෙම නැත්නම් උකස් කරන්න එතුමාට සිදු වුණා. ඇත්ත වශයෙන්ම කියනවා නම් එතුමා මහජනයාට අත් දෙකෙන්ම මුදල් දුන්නා; උදවු දුන්නා. ඒ සම්බන්ධයෙන් හබරාදූව ආසනයේ ජනතාව — විශේෂයෙන් පරගොඩ වාසී ජනතාව — එතුමාට ණයගැතියි. ඒ හැම දෙනාම එතුමාගෙන් යම්කිසි ප්‍රයෝජනයක් ලබා ගත්තා. ඊයේ ඒ ගම්වාසීන් වැඩි දෙනෙක් එතුමාගේ අවමඟුලට පැමිණ සිටි බව මට දැක ගන්නට ලැබුණා. ඇත්ත වශයෙන්ම කියනවා නම් එතුමාගේ විශාල ධනස්කන්ධය වියදම් කරන්න පමණක් නොව විශාල වතු ගණනාවක් විකුණන්න, උකස් කරන්න පවා සිදු වුණේත් ඒ ජනතාවගේ ඕනෑ-එපාකම් පිරිමසාලීම සඳහායි.

ඒ ප්‍රදේශයේ සැම සමාජ කටයුත්තක්ම, ආගමික කටයුත්තක්ම සිදු වුණේ එතුමාගේ පුරෝගාමීත්වයෙන් බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. කොටින්ම කියනවා නම් ඒ ප්‍රදේශයේ එතුමා නොගිය මළ ගෙයක්, සහභාගී නොවුණු අවමංගල්‍ය උත්සවයක් නොතිබුණාය කියන්න පුළුවන්. එතුමා ඒ අවමංගල්‍ය උත්සවවලට සහභාගී වුණා පමණක් නොව විශේෂයෙන් දුප්පත් අයට උපකාරත් කළා.

එතුමා සම්බන්ධයෙන් කැපී පෙනෙන තවත් කාරණයක් තමයි, එතුමා සැම අවස්ථාවකදීම වාගේ බොහොම ලස්සණට ඇඳ පැළඳගෙන සිටිනවා දකින්න ලැබීම. පිරිසිඳුවට, ලස්සණට අඳින්න එතුමා විශේෂ කැමැත්තක් දක්වූවා. මම අන්තිම වතාවට එතුමා අවමංගල්‍ය උත්සවයකදී දකින විටත් එතුමා තරුණයෙක් වගේ බොහොම ලස්සණට ඇඳ — පැළඳගෙන හිටියා. අනෙක් හැම දෙනාම වාගේ ඇඳගෙන හිටියේ වම් විධියටයි. වාම් විධියට වගේම පිරිසිදුව ඇඳීමෙනුත් එතුමා එක්තරා විධියක ආදර්ශයක් දුන්නාය කියන්න පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මගේ ආරංචියේ හැටියට එතුමා අභාවප්‍රාප්ත වන්න දවස් දෙකට කලින් බස් එකෙන් කොළඹ ඇවිත් තිබෙනවා. වයසින් අවුරුදු අසූ ගණනක් වුණත් අවසාන මොහොත දක්වා එතුමා නිරෝගීව සිටියාය කියන්න පුළුවනි. විශේෂයෙන් මද්‍ය පානයෙන් සහ සිගරට් - සුරුට්ටු ආදිය පානය කිරීමෙනුත් එතුමා වැලකී හිටියා. ඒ අනුව බලන විට එතුමා බොහොම ආදර්ශවත් ජීවිතයකුයි. ගත කර තිබෙන්නේ.

එතුමා දේශපාලන කටයුතුවල යෙදුණේත් බොහොම කල්පනාකාරීව හැම දෙනාගේම වාගේ හිත් දිනාගනිමිනුයි. එතුමා මැතිවරණයෙන් පැරදුණු බව ඇත්ත. නමුත් ප්‍රදේශයේ ජනතාවට උපකාර කරමින්, ඔවුන් හැම දෙනාගේම වාගේ හිත් දිනා ගැනීමටත් එතුමාට පුළුවන් වූ බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

අවසාන වශයෙන්, හබරාදුව ආසනයේ ජනතාව වෙනුවෙන් එම ආසනයේ නියෝජිතයා වශයෙන් මගේ කනගාටුවත් එතුමාගේ පවුලේ උදවියට දන්වා යවන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I think we should permit the Leaders of Parties to take precedence over others. Thereafter other Members of Parliament can speak.

**දිනේෂ් ගුණවර්ධන මහතා** (මහරගම)
*(திரு. தினேஷ் குணவர்த்தன—மஹரகம)*
(Mr. Dinesh Gunawardene–Maharagama)

කථානායකතුමනි, ඩී. එස්. ගුණසේකර මැතිතුමාගේ අභාවය පිළිබඳව සංවේගය පළ කෙරෙන යෝජනාවට මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් සහභාගි වීමටයි, මා නැඟී සිටියේ.

මේ රටේ දේශපාලන භූමියේ යුග දෙකකටත් වැඩි කාලයක් මහජනතාවගේ නියෝජිතයෙක් හැටියට පෙනී සිටිමින් පාර්ලිමේන්තුවේදී පමණක් නොව විවිධ ආයතනවලදී මෙතුමා මහජන අදහස් ක්‍රියාත්මක කිරීම සඳහා විශිෂ්ඨ සේවාවක් කර තිබෙනවා. විශේෂයෙන් මේ අවස්ථාවේදී, තරුණයෙක් හැටියට මට මතක තිබෙන සිද්ධියක් ඉදිරිපත් කරන්න කැමැතියි.

1963 වාමාංශික එක්සත් පෙරමුණේ නැඟීමත් සමඟම ඇති වුණු මහා වැඩ වර්ජන ගණනාවක් තිබුණු කාලයේදී ඩී. එස්. ගුණසේකර මැතිතුමා කම්කරු ඇමති වශයෙනුයි, කටයුතු කළේ. ඒ කම්කරු අරගලයන්දී පළමු වරට මේ රටේ දක්ෂ වෘත්තීය සමිති නායකයන් ගණනාවක් සමඟ නොයෙකුත් ප්‍රශ්න සාකච්ඡා කරමින් ඒ ප්‍රශ්න, ඒ වැඩ වර්ජන සාකච්ඡා මට්ටමින් බේරුම්කාර තත්ත්වයට ගෙන ඒම සඳහා කටයුතු කරන්න එතුමාට හැකි වුණා.

ඒ වගේම මෙතුමා ආදර්ශවත් ජීවිතයක් ගත කළා. බොහෝ අවස්ථාවල දුම්රියේදී සහ බස් රියේදී මටත් එතුමා හමු වී තිබෙනවා. බොහොම නිදහස්ව හා වාමව අදහස් පළ කරන්න පුළුවන් ගතිගුණ තිබුණු එතුමා දේශපාලන භූමියේ සිටි අවුරුදු 50 ක පමණ කාලය තුළ මුල් යුගයේ තිබුණු නිහතමානීකම අත හරින්නේ නැතිව ආදර්ශවත් ජීවිතයක් ගත කළ බව මතක් කරන අතර, ඒ වගේ ගතිගුණවලින් යුක්තව විශාල සේවාවක් කළ ගුණසේකර මැතිතුමා අප අතරින් වෙන් වීම පිළිබඳව අපේ ශෝකය එතුමාගේ පවුලේ උදවියටත් පළ කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා (සෞඛ්‍ය ඇමතිතුමා)**
*(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து—சுகாதார அமைச்சர்)*
(Dr. Ranjith Atapattu–Minister of Health)

ගරු කථානායකතුමනි, ඩී. එස්. ගුණසේකර මැතිතුමා ඇත්ත වශයෙන්ම දුර්ලභ ගණයේ පුද්ගලයෙක් හැටියට, දුර්ලභ ගණයේ දේශපාලනඥයෙක් හැටියට අපට සලකන්නට පුළුවනි. එතුමා අවුරුදු 40 ක් ගම් සභාවක සභාපතිවරයෙක් හැටියට සේවය කර තිබෙනවා. අවුරුදු 12 ක් නගරාධිපතිවරයෙක් හැටියටත් තවත් අවුරුදු 12 ක් පමණ නියෝජ්‍ය ඇමතිවරයෙක් හා ඇමතිවරයෙක් හැටියටත් කටයුතු කර තිබෙනවා. එතුමාගේ පෞද්ගලික ජීවිතය පුදුමාකාර එකක්. එතුමා එක පසළොස්වක පෝයක්වත් සිල් සමාදන් නොවී සිටියා කියා මම හිතන්නේ නැහැ. එතුමා අභාවයට පත් වන විට මම හිතන විධියට අවුරුදු 89 ක් පමණ වෙනවා. මේ කාලය තුළ හැම පසළොස්වක පෝය දවසකම එතුමා සිල් සමාදන් වී තිබෙනවා. එතුමා ගාල්ලේ තරුණ බෞද්ධ සමිතියේ ප්‍රමුඛත්වය දරාගෙන කාලයක් තිස්සේ එහි සභාපති හැටියට සේවය කළා. එතුමා අවසන් හුස්ම හෙළන්නට පෙර පෝය දවසේත් කතරගම ගොස් සිල් සමාදන් වී ආපසු කොළඹට බස් එකෙන් ඇවිත් තිබෙනවා. එතුමාගේ දරුවන් බස් එකෙන් යන්න එපාය කිව්වත් එතුමා බස් එකෙන්ම ගෙදර ඇවිත් තමයි, අන්තිම හුස්ම හෙළුවේ.

එතුමාගේ දරුවන් පස් දෙනෙක් වෛද්‍යවරුන් හැටියට සිටිනවා. එයින් දෙදෙනෙක් මා සමඟ වෛද්‍ය විද්‍යාලයේ ඉගෙන ගත්තා. අද අපේ දෙපාර්තමේන්තුවේ එතුමාගේ දරුවන් තුන් දෙනෙක් සේවයේ යෙදී සිටිනවා. තව දෙන්නෙක් පළාත් පාලන ආයතනවලත්, සංස්ථාවලත් සේවය කරනවා. දරුවන් තුන් දෙනෙක් ඉංජිනේරුවන් හැටියට සිටිනවා. ගුරුවරුන් තුන් දෙනෙක් සිටිනවා. හැම දරුවෙක්ම ඒවාගේ වැදගත් රැකියාවල නියුතුව සිටිනවා. දේශපාලන කටයුතුවල නිරත වන ගමන් පියෙක් හැටියට තමන්ගේ දරුවන් වෙනුවෙන් ඉටුවිය යුතු සම්පූර්ණ යුතුකම් එතුමා ඉෂ්ට කළ බව එයින් පෙනෙනවා.

දකුණු පළාතේ එතුමා හඳුනන්නේ නැති පුද්ගලයෙක් නැහැ. 1970 මම පළමුවෙන්ම දේශපාලන භූමියට පැමිණි අවස්ථාවේදී බොහොම කලබල මධ්‍යයේ එතුමා මගේ රැස්වීමකට පැමිණ මට සහයෝගය දුන් හැටි මට මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් වෙනවා. කොපමණ වයස් ගතව සිටියත් පසුගිය අතුරුමැතිවරණයේදීත් හබරාදුව ආසනයට එතුමා ඉදිරිපත් වුණා. මහජන සේවය සඳහා මහජනයා ඉදිරියේ නිතර පෙනී සිටින්නට ඒ තරම් කැමැත්තක් ගුණසේකර මැතිතුමා තුළ තිබුණා.

ඩී. එස්. ගුණසේකර මැතිතුමාගේ අභාවය ගැන මේ අවස්ථාවේ මේ ගරු සභාවෙන් මතු වුණු ශෝකය සමඟ මගේ ශෝකයත් ඒ පවුලේ අය වෙත ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க—காலி)*
(Dr. W. Dahanayake–Galle)

ගරු කථානායකතුමනි, ඩී. එස්. ගුණසේකර මැතිතුමා ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීම මගේ යුතුකමක්ව තිබෙනවා. ඒ මන්ද, ඩී. එස්. ගුණසේකර මැතිතුමා මේ ශත වර්ෂයේ ගාල්ලේ උපන් ඉතාමත්ම ශ්‍රේෂ්ඨ පුත්‍රයා හැටියට සඳහන් කරන්න පුළුවන්. ගාල්ලේ පරම්පරාගත පවුලකට අයිති ගුණසේකර මැතිතුමා මහින්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක්.

මහින්ද විද්‍යාලයේ එදා ඒ මැතිතුමාගේ විදුහල්පති හැටියට සිටියේ එෆ්. එල්. වුඩ්වඩ් මැතිතුමායි. එෆ්. එල්. වුඩ්වඩ් මැතිතුමා මේ රටට පැමිණි විදේශිකයන්ගෙන් ඉතාමත් ශ්‍රේෂ්ඨ උත්තමයෙක් බව අපි සියලු දෙනාම දන්නවා. එෆ්.එල්. වුඩ්වඩ් මැතිතුමාගේ ගෝලයින්—මහින්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයින්—මේ රටේ වැදගත් ප්‍රභූවරයින් හැටියට සිටියා; සිටිනවා. වුඩ්වඩ් මැතිතුමාගේ එවැනි ගෝලයන් අතරින් ඩී. එස්. ගුණසේකර මැතිතුමා ඉතාමත් උතුම් ගෝලයෙක්. ඒ මැතිතුමා ගත කළේ බොහෝම වාම් ජීවිතයක්. ඇඳුමෙන්, පැවතුමෙන් මෙන්ම සියලු චාරිත්‍රවලින්ද ඒ මැතිතුමාගේ ජීවිතය ඉතාමත් වාම් එකක් බවට පත් වුණා. එතුමා මැරෙන තුරු ගමන් කළේ බස් රථයෙන් නැත්නම් පයින්. වාහනයෙන් ගමන් කරන්නය කියා එතුමාගේ පුතුන් නොයෙක් අවස්ථාවල එතුමාට බල කළා. නමුත් එතුමාගේ මරණය සිදුවීමට දින දෙකකට පෙර එතුමා ගාල්ලට ගිහින් නැවත කොළඹට ආවේ බස් රථයෙන්. ඒ මැතිතුමා අපේ රටේ සිටි ඉතාමත්ම උතුම් බෞද්ධ ජන නායකයෙක්. එතුමාගේ ජීවිතයේ ඉතාමත් අලංකාර, ආදර්ශමත් බෞද්ධ ගතිගුණ පෙනෙන්නට තිබුණා. සිල් සමාදන් වීම අනුව පමණක් නොව හැම ක්‍රියාවකින්ම එතුමා තම ජීවිතය හැඩගස්වා ගත්තේ බෞද්ධ ප්‍රතිපත්තිවලින්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා]

එතුමා මහජන සේවය ආරම්භ කරන විට තේ අක්කර 500 ක් පමණ එතුමාට තිබුණා. නමුත් අවුරුදු 50 ක පමණ මහජන සේවයෙන් පසු එතුමාගේ ධනය තේ අක්කර පන්සියයෙන් තේ කෝප්පයට බැස්සා කියා කියන්න පුළුවන්. එතුමාගේ ජීවිතය දෙස බලන විට, එතුමාගේ වස්තුව නැති වුණා. අවුරුදු 50 ක් මහජන සේවය කර අවසන් වන විට ශතයක්වත් නැතිවයි එතුමා මිය ගියේ. මහජන සේවකයෙක් හැටියට එතුමා වාර්තාවක් පිහිටෙව්වා කියා කියන්න පුළුවනි. ඇමති පදවි ඉසිලූ සහ නගර සභාවල සභාපති හැටියට ක්‍රියා කළ අය හුඟ දෙනෙක් අප අතර සිටියා; දැනුත් ඉන්නවා. කෝදගොඩ ගම් සභා කොමිටියේ අවුරුදු 40 ක් සභාපති හැටියටත්, ගාල්ල මහ ගර සභාවේ එක වතාවක් නගරාධිපති හැටියටත් ක්‍රියා කර, මේ ගරු සභාවේ ඇමතිවරයෙක් හැටියටත් ක්‍රියා කර එතුමා වාර්තාවක් පිහිටෙව්වා කියා කියන්න පුළුවනි.

මගේ ජීවිතයේ මම ආශ්‍රය කළ, අඳුනන සියලු දෙනා අතරින් ඩී. එස්. ගුණසේකර මැතිතුමාගේ ජීවිතය අනුව එතුමා බෝධිසත්වයෙක්ය කියා ඊයේ සැන්දෑවේ එතුමාගේ ආදාහනය අවස්ථාවේදී එතුමාගේ මිත්‍රයන් රාශියකට මම කිව්වා. මම මේ අවස්ථාවේදී ඒ මැතිතුමාගේ අභාවය ගැන රුහුණේ ජනතාවගේ බලවත් ශෝකය ප්‍රකාශ කරන අතර, මේ ගරු සභාව මඟින් ඒ මැතිතුමාගේ බිරිඳට සහ දරුවන්ට අපගේ බලවත් කනගාටුව දක්වන්නැයි ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**අනුර බණ්ඩාරනායක මහතා (නුවරඑළිය-මස්කෙළිය දෙවන)**
*(திரு. அனுர பண்டாரநாயக்க—நுவரெலிய-மஸ்கெலிய இரண்டாம் அங்கத்தவர்)*
(Mr. Anura Bandaranaike–Second Nuwara Eliya-Maskeliya)

As a Member of the SLFP it is with a deep sense of sorrow and sadness that I associate myself with the sentiments expressed in this House on the passing away of the late Mr. D. S. Goonesekera.

He is a politician of very rare achievements in that in both spheres, of local government politics and Parliamentary politics, the late Mr. Goonesekera reached the highest positions. As a local government politician he served for 40 years as a V.C. Chairman, for a number of years as a Municipal Councillor, as Mayor of Galle, and he also served as President of the All Ceylon Village Council Chairmen's Congress. Those who have been associated with him in local government politics in the Galle District still talk very highly of the great achievements, the great heights he was able to achieve when he was actively involved as President of the All Ceylon Village Council Chairmen's Congress. Thereafter, the late Mr. Goonesekera entered Parliamentary politics. First, in 1947 he was returned as the Member of Parliament for Udugama from the UNP. Thereafter, when the late Mr. S. W. R. D. Bandaranaike, as Leader of the House, resigned from the UNP, he was one of those few people who not only had the foresight but also the courage to leave a powerful Government which did not seem at that time possible to be defeated, and follow the late Mr. Bandaranaike. With the late Messrs. D. A. Rajapakse and A. P. Jayasuriya and some others they formed the SLFP, which within 31/2 years was able to achieve one of the biggest landslide victories that any party ever scored in this countrty. The late Mr. Goonesekera thereafter served as Junior Minister to several Ministries and in July 1960 was returned as the SLFP Member of Parliament for Habaraduwa. He ended his Parliamentary career having achieved the distinction of being chosen as the Minister of Cultural Affairs and Social Services in the first Sirimavo Bandaranaike Government from 1960 to 1965.

Sir, I think it would suffice to say at this point that the passing away of Mr. Goonesekera is a loss to many. He was not only a very simple and unassuming but also very popular among all politicians who supported him and opposed him. I think his death will be felt very greatly, as the hon. Member for Galle very eloquently put it, not only in the Galle District but among all those who knew him. He lived up to the ripe age of 87 years. He leaves behind 14 children who have achieved great distinction not only as doctors, lawyers and engineers, but also as people who have inherited the father's forthrightness and frankness in dealing with all matters.

I would like to associate myself with the sentiments expressed by the hon. Members of this House and would request you to convey the sentiments of this House to his wife and children.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I associate myself with the sentiments expressed by Members on both sides of the House on the passing away of Mr. D. S. Goonesekera, a former Member of Parliament. I direct the Secretary-General of Parliament to make a Minute of the proceedings of today and have the same communicated to the members of the bereaved family.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### *பாராளுமன்ற அலுவல்*
## BUSINESS OF THE PARLIAMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
*(திரு. எம். வின்சன்ற் பெரேரா—பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)*
(Mr. Vincent Perera–Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I move,

"That the proceedings on items 1 to 8 of Public Business appearing on the Paper be exempted at this day's sittings from the provisions of Standing Order No. 7."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

I move,

"That this Parliament at its rising this day do adjourn until 3 p.m. on Thursday, 25th August, 1983."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put and agreed to.*

## සමුපකාර සමිති (සංශෝධන) පනත් කෙටුම්පත
### கூட்டுறவுச் சங்கங்கள் (திருத்தம்) சட்டமூலம்
## CO-OPERATIVE SOCIETIES (AMENDMENT) BILL

*කල් තබනු ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාල ප්‍රශ්නය [1983 අගෝස්තු 10]*

*"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය "–[ගාමිනී ජයසූරිය මහතා] :*

*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*

*ஒத்திப்போடப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது. வினா—[10 ஒகஸ்ட், 1983]*

*"சட்டமூலம் இப்பொழுது இரண்டாம் முறை மதிப்பிடப்படுமாக" [திரு. காமினி ஜயசூரிய]*

*வினா, மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question–[10th August 1983]*

"That the Bill be now read a Second time"–[*Mr. Gamani Jayasuriya.*]

*Question again proposed.*

අ. භා. 3.40

**රිචඩ් පතිරණ මහතා (අක්මීමන)**
*(திரு. றிச்சட் பத்திரன—அக்மீமன)*
(Mr. Richard Pathirana–Akmeemana)

ගරු කථානායකතුමනි, ඊයේ විවාදය කල් තබන අවස්ථාවෙදී මම පවසමින් සිටියේ සමුපකාර ව්‍යාපාරයේ වර්ධනය සඳහා සමුපකාර බැංකුවක ඇති වැදගත්කම ගැනයි. ඒ අවස්ථාවේ දී මම ප්‍රකාශ කළා සමුපකාර සමිති ව්‍යාපාරයේ වර්ධනය සඳහා මහජන බැංකුව මුලින් ඇති කළත්, එම බැංකුව එම කාර්යය ඉෂ්ට කිරීමට අසමත්ව සිටින නිසා සමුපකාර බැංකුවක අවශ්‍යතාවය අද පැන නැඟී තිබෙන බව.

මේ රටේ ආර්ථික හා සමාජයීය සමීක්ෂණ රාශියකින් හෙළි වී තිබෙන මූලික කරුණක් වන්නේ අපේ රටේ ගම්බද ප්‍රදේශවල ජනතාවගේ ණයගැති භාවයයි. මුලින් සමුපකාර බැංකුව ආරම්භ කිරීමට අදහස් කළේ සමාජයේ පිළිකාවක් වැනිවූ මෙම විෂමතාවය, ග්‍රාමීය ණය ගැති භාවය නැති කරලීම සඳහා කටයුතු කිරීමටයි. නමුත් අදත් මේ ග්‍රාමීය ණය ගැති භාවය ඉතාමත්ම තදින් සෑම ගමකම වාගේ පවතිනවා. යම්කිසි ප්‍රමාණයක පිහිටක් එයට ලැබෙන්නේ සමුපකාර ණය දෙන සමිති මාර්ගයෙන් පමණයි. එමනිසා ග්‍රාමීය ජනතාවට පහසුවෙන් ණය ගැනීමට පුළුවන් වන ආකාරයේ සමුපකාර බැංකුවක අවශ්‍යතාවය අද පැන නැඟී තිබෙනවා.

අනෙක් කාරණය මේකයි : මම දන්නා හැටියට සමුපකාර සංවර්ධන ව්‍යාපාරය සඳහා ව්‍යාපෘති අරමුදලක් තිබෙනවා. ගාල්ලේ තිබෙනවා සමුපකාර රෝහලක්. ඒ වාගේම මා දන්නා ආකාරයට මාතරත් තිබෙනවා සමුපකාර ආරෝග්‍යශාලාවක්. ඒ සමුපකාර ආරෝග්‍යශාලාවලින් ජනතාවට විශාල සේවාවක් සිදුවෙන නිසා මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා ගාල්ලේ සමුපකාර ආරෝග්‍යශාලාවේ වර්ධනය සඳහා මේ දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන්නට පුළුවන් උපරිම සහයෝගය එයට ලබා දෙන හැටියට.

මම වැඩිය දීර්ඝ ලෙස කථා කරන්නට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. විශේෂයෙන්ම ගුරුවරයෙක් හැටියට මගේ අත්දැකීමක් තිබෙනවා මේ පාසල් සමුපකාර සමිති සම්බන්ධයෙන්. දෙපාර්තමේන්තුව මේ පාසල් සමුපකාර සමිති සම්බන්ධයෙන් දක්වන උනන්දුව මදිය කියන එකයි මගේ හැඟීම. පාසල්වල සමුපකාර සමිති ව්‍යාපාරය වඩාත් වර්ධනය කර, ඒවා දියුණු කර, පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මේ සමුපකාර සමිති ව්‍යාපාරයේ වැදගත්කම අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දුන්නොත් ඔවුන් පාසල් වලින් පිටවූවාට පසුව ඒ ව්‍යාපාරයේ වර්ධනයක් ඇතිකර ගන්නට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. පාසල් සමුපකාර සමිතිවල නිළධාරීන් හැටියට ක්‍රියා කරන ගුරුවරුනට කාල සටහනේ යම්කිසි කාල පරිච්ඡේද කිහිපයක් මේ ව්‍යාපාරයේ කටයුතු සඳහා වෙන් කරන්නට—ගරු අධ්‍යාපන ඇමතිතුමාගේද එකඟත්වය ඇතිව—කටයුතු කරනවා නම් එය පාසල් සමුපකාර සමිතිවලට විශාල සේවාවක් වෙනවා.

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කිව්වා, දිවංගත පිලිප් ගුණවර්ධන ඇමතිතුමා එතුමාගේ මුත්තණුවන් කෙනෙක් කියලා. ඒ මුත්තණුවන් ලංකාවේ සමුපකාර සමිති ව්‍යාපාරය වෙනුවෙන් යම්කිසි ආකාරයක සේවාවක් කළා නම් එතුමාගේ නම මේ රටේ ඉතිහාසයේ සමුපකාර සමිති ව්‍යාපාරයේ දියුණුව වෙනුවෙන් කැප වී කළ සේවාව නිසා අමරණීය වෙලා තිබෙනවා නම්, මම බලාපොරොත්තු වෙනවා මේ වර්තමාන ඇමතිතුමාගේ නාමයත් ඒ ආකාරයෙන්ම ඉතිහාසගත වන අන්දමට මේ සමුපකාර සමිති ව්‍යාපාරයේ දියුණුවට යම්කිසි සේවාවක් එතුමාගෙන් සිදු වෙනවා ඇති කියා. එම බලාපොරොත්තුව එසේම ඉටුවේවා කියා පතමින්, තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**වෛද්‍යාචාර්ය ලෙනාඩ් කිරිඇල්ල මහතා (ඇහැලියගොඩ)**
*(வைத்திய கலாநிதி லெனாட் கிரிஎல்ல—எஹெலியகொட)*
(Dr. Leonard Kiriella–Eheliyagoda)

ගරු කථානායකතුමනි, සමුපකාර සමිති සංශෝධන පනත් කෙටුම්පත ගැන මේ සභාවේ ඉදිරිපත් කරන ලද වැදගත් කරුණු රාශියකට අපි ඇහුම්කන් දුන්නා. එම නිසා ඒ සම්බන්ධයෙන් තවදුරටත් කතා කරන්න මම අදහස් කරන්නේ නැහැ. නමුත් මගේ ආසනයට අදාල ප්‍රශ්න දෙකක් ගැන මේ අවස්ථාවේදී මේ සභාවට කරුණු ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, 1972 වර්ෂයේදී තුන් හවුල් ආණ්ඩුව මේ රට පාලනය කරන කාලයේදී වතු ජනසතු කිරීම ඇති වුණා. මේ රටේ සියලුම වතු රජයට අයිති කර ගෙන පාලනය කරන්න පටන් ගත්තා. එම වතු පාලනය කිරීම සඳහා සෑම ආසනයක් තුළම වතු සමුපකාර සමිති පිහිටෙව්වා. මේ සමිති පිහිටුවීම කිසියම් සැලස්මක් අනුව කිසියම් පිළිවෙලක් අනුව කෙරුණේ නැහැ. එය හදිසියෙන් කළ දෙයක් බව අප කවුරුත් හොඳින් දන්නා දෙයක්. ඒ සමගම ඒ සමිතිවලට නුසුදුසු පිරිසකුත් ඇතුළු වී එම වතු පාලනය භාර ගත්තා. මෙම පාලනයෙන් වතුවලටත්, ඒ වතුවල සිටින කම්කරුවන්ටත් සිදු වුණේ ලොකු හානියක්.

ගරු කථානායකතුමනි, ඇහැලියගොඩ ආසනය ඒ කාලයේ හැඳින්වුණේ කිරිඇල්ල ආසනය හැටියටයි. එම ආසනය තුළ ඇති වතුවල සේවය කළ ඉන්දියානු ද්‍රවිඩ කම්කරුවන් විශාල ගණනකට ලැබෙන්නට තිබුණු අර්ථසාධක මුදල් අද දක්වාම ලැබී නැහැ. ඒ පිරිස මට ලිපිවලින් මෙන්ම සාකච්ඡා මගිනුත් දැනුම් දී තිබෙනවා, ඒ ඇත්තන්ගේ පඩියෙන් මේ මුදල අඩු කර ගෙන තිබුණත් තවම අර්ථසාධක මුදල් ලබා ගන්නට බැරි වී තිබෙන බව. ඒ කම්කරුවන් නොයෙක් විට ඒ කාර්යාලවලට පෙත්සම් දමා තිබුණත්, ඉල්ලුම් පත් යවා තිබුණත් ඒ මුදල් ලබා ගන්නට අද දක්වා බැරි වී තිබෙනවා. අද අපේ රටේ පවතින තත්ත්වය උඩ මෙය ඉතා වැදගත් ප්‍රශ්නයක්ය කියා මම හිතනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ලෙනාඩ් කිරිඇල්ල මහතා]

තමන්ගේ රටට ආපසු යාමට ලැහැස්ති වී සිටින ඉන්දියානු ද්‍රවිඩ කම්කරුවන් ගණනාවක්ම ඉන්නවා. ඒ පිරිසට තමන්ගේ රටට ආපසු යන්නට බැරි වී තිබෙන්නේ මේ අර්ථසාධක මුදල් ලබා ගැනීමට නොහැකිවීම නිසයි. එම නිසා මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා, එම කම්කරුවන්ගේ මුදල් ලබා දී ඔවුන්ගේ රටට ආපසු යවන්න කටයුතු කරන්නටය කියා ගරු කෘෂිකර්ම සහ සමුපකාර ඇමතිතුමාගෙනුත්, ගරු කම්කරු ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට මම කියන්නට යන්නේ සමුපකාර සමිති සංගම්වල වැඩ කරන සේවකයින්ගේ පඩිය ගැනයි. මේ සම්බන්ධව ඊයෙත් ගරු මන්ත්‍රීවරු දෙදෙනෙක් කථා කළා. විශේෂයෙන්ම අදත් මම ඒක කියන්නේ එහි ඇති වැදගත්කම නිසයි. ඇහැලියගොඩ ආසනයේ උතුරු කිරිඇල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ සේවක පිරිස මා හමු වී සාකච්ඡාවක් කළා. ඒ අවස්ථාවේදී ඔවුන් මට කියා සිටියා ඔවුන්ගේ පඩිය ඉතා අඩු බව. එපමණක් නොවෙයි, අද ජීවන අංකයේ හැටියට සාමාන්‍යයෙන් රජයේ සේවකයන්ට ගෙවන රු. 100 දීමනාවවත් ඔවුන්ට ලැබෙන්නේ නැහැ. සමුපකාර සේවකයන්ට ඒ කිසිම දීමනාවක් ලැබී නැහැ. අද ජීවන අංකය ඉහළ නැඟ තිබෙන බව අපි දන්නවා. මීට අවුරුදු දෙක තුනකට පෙර කාලයේදී ලැබුණු පඩියෙන් අද ජීවත්වීම අමාරුයි. එම නිසා සමුපකාර සේවකයන් වෙනුවෙන් මම ගරු කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා සහ අහාර හා සමුපකාර ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. රුපියල් 100 දීමනාව වහාම ගෙවන්න බැරි වුණත් හොඳින් සහ අවංකව වැඩ කරන සමුපකාර සේවකයන්ට එයින් යම්කිසි ප්‍රමාණයක්වත් ගෙවා ඔවුන්ගේ වැටුප වැඩි කිරීමට කියම කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**ගාමිනී ජයසූරිය මහතා**
*(திரு. காமினி ஜயசூரிய)*
**(Mr. Gamani Jayasuriya)**

ඒක කිරිඇල්ලෙන්ම පටන් ගත්තොත් හොඳයි. අපේ කිසිම තහනමක් නැහැ.

**වෛද්‍යාචාර්ය ලෙනාඩ් කිරිඇල්ල මහතා**
*(வைத்திய கலாநிதி லெனாட் கிரிஎல்ல)*
**(Dr. Leonard Kiriella)**

ගරු කථානායකතුමනි, 1944 සිටම මේ රටේ සමුපකාර ව්‍යාපාරය සමග මගේ කිට්ටු සම්බන්ධයක් තිබෙනවා. මගේ හැඟීමේ හැටියට ප්‍රජාතන්ත්‍රවදය අනුගමනය කරන රටකට සමුපකාර ව්‍යාපාරය ඉතාම අවශ්‍යයි. මම ඊයේ ඉතාම සතුටින් සවන් දුන්නා අපේ ආහාර හා සමුපකාර ඇමතිතුමාගේ කථාවට. ඒ කථාවෙන් ගරු ඇමතිතුමා අවංක චේතනාවෙන් ප්‍රකාශ කළා මේ රටේ සමුපකාර ව්‍යාපාරය ශුද්ධ කරල, පිරිසිදු කරල මීත් ඉදිරියට මේ ව්‍යාපාරයෙන් රටට සේවයක් ලබා දෙන්නට කටයුතු කරනවාය කීයල. නිදහස් වෙළඳ ප්‍රතිපත්තියක් තිබෙනවා නම්, පෞද්ගලික වෙළඳ ව්‍යාපාරත් තිබෙනවා නම් ඇත්ත වශයෙන්ම සමුපකාර ව්‍යාපාරයත් අවශ්‍යය යන්න මගේ කල්පනාවයි. සමුපකාර ව්‍යාපාරය පොදු ජනතාවගේ නිදහස් ආර්ථික වෙළඳ ව්‍යාපාරයක්. එම නිසා මේ පුංචි රටේ සමුපකාර ව්‍යාපාරය ශුද්ධ කරල පිරිසිදු කරල ඉදිරියට මෙම ව්‍යාපාරය මඟින් අපේ රටට විශාල සේවයක් ඉටු කරන්නට ගරු ඇමතිතුමා පියවර ගැනීම ගැන—ඒ සඳහා සම්පූර්ණ වීර්යය ගැනීම ගැන—අපි ඉතාම සතුටු වෙනවා. ඒ පිළිබඳව අපේ ගෞරවය ඇමතිතුමාට හිමි වෙනවා. මේ රටේ සමුපකාර ව්‍යාපාරය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඉදිරියට තවත් සංශෝධන අවශ්‍ය වේය කීයලත් ඇමතිතුමා ඊයේ කිව්වා. ඒක ඉතාම වැදගත් ප්‍රකාශයක්. ඒ හැර එතුමා කිව්වා බාග වේලාවට මේ තිබෙන පනත අහෝසි කර අලුත් පනතක් වුණත් ගේන්න සිදු වේවි කියා. ඒකත් අප ධෛර්යමත් වන කරුණක්. අවසාන වශයෙන් මම ගරු ඇමතිතුමාට නැවත වරක් ස්තුතිවන්ත වන අතර මේ සභාවේ ආණ්ඩු පක්ෂයේත් විරුද්ධ පක්ෂයේත් සියලුම මන්ත්‍රීවරුන් මෙම පනතට සහයෝගය දේවි කියා මම බලාපොරොත්තු වෙනවා. ඒ මොකද? මෙය අප කාටත් ප්‍රයෝජනවත් ව්‍යාපාරයක් නිසයි. බොහොම ස්තුතියි.

අ. භා. 3.54

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (තිස්සමහාරාම)**
*(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்—திஸ்ஸமஹாராம)*
**(Dr. P. M. B. Cyril–Tissamaharama)**

ගරු කථානායකතුමනි, සමුපකාර සමිති සංශෝධන පනත ඉදිරිපත් කරමින් ගරු ඇමතිතුමා ඊයේ ප්‍රකාශ කරන්න යෙදුණා, මෙම අණපනත් ගේන්නේ සමුපකාරයේ තිබෙන දූෂණ සහ අක්‍රමිකතා නැති කරන්නය කියා. එතුමා තවදුරටත් කිව්වා සියයට සියයක්ම දූෂණ නැති කරන්න බැරි වුවත් මේ සංශෝධනය නිසා සමුපකාර සමිතිවලට වැඩ කටයුතු සෑහෙන ප්‍රමාණයකට සාර්ථක විධියට කරගෙන යන්න පුළුවන් වේවි කියා. මමත් ප්‍රාර්ථනා කරනවා එතුමාට ඒ සමුපකාර සමිති ව්‍යාපාරය යහපත් විධියට කරගෙන යන්නට මේ අණපනත් උපයෝගී වේවා කියා.

සමුපකාරය අද නැතිවම බැරි ආයතනයක් විධියට පරිවර්තනය වී ඇති බව පසුගිය දිනවල ඇති වුණ කලබලකාරී තත්ත්වය තුළින් ජනතාවට දකින්න ලැබුණා. නිදහස් වෙළඳ ප්‍රතිපත්තියක් තිබෙන මෙවැනි රටක ජනතාව තුළ සමුපකාරය කෙරෙහි අද වන තුරු විශ්වාසයක් තිබීම ගැන අපි ඉතාමත් සන්තෝෂ වෙන්න ඕනැ. නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය ඉදිරිපත් කළ අවස්ථාවේදී බොහෝ දෙනකුගේ සැකයක් තිබුණා සමුපකාරය එතැනින් හමාර වේවි කියා. නමුත් ජනතාව ඒක පිළිගත්තේ නැහැ. නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය කොතරම් දියුණු වුවත් මෙරට ජනතාවට එයින් මොන තරම් යහපතක් වුවත් සමුපකාරයට ජනතාව තුළ තිබෙන ඇල්ම හා විශ්වාසය අඩු වුණේ නැහැ. ඒ තත්ත්වය නිසා තමයි පසුගිය දිනවල කලබලකාරී තත්ත්වයක් පැවති අවස්ථාවේදී කරදරයක් නැතිව ජනතාවට පාරිභෝගික ද්‍රව්‍ය ලබාගන්නට පුළුවන් වුණේ. එහෙම නම් අද අපේ යුතුකමක්ව තිබෙනවා ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ මේ සංශෝධනය තුළින් සමුපකාරය ක්‍රමවත් කිරීමට.

මම බලාපොරොත්තු වන්නේ නැහැ මේ පිළිබඳව සමස්තයක් වශයෙන් කරුණු ඉදිරිපත් කරන්න. එහෙත් මම සඳහන් කරන්න කැමතියි හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමුපකාර සමිතිවල ප්‍රතිසංවිධානයක් අවශ්‍ය බව. මට මතක හැටියට ඊයේ ගරු බද්දේගම මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) වෙන්න ඇති ප්‍රකාශ කළා හැම විවිධ සේවා සමුපකාර සමිතියකටම හාල් මෝලක් අවශ්‍යයි කියා. මම ඒ අදහස අනුමත කරනවා. ඇත්ත වශයෙන්ම වී නිෂ්පාදන අතිරික්ත ප්‍රදේශයක් හැටියට හම්බන්තොට ප්‍රදේශය නම් අරගෙනයි තිබෙන්නෙ. එහෙත් ඒ ප්‍රදේශයේ සමුපකාරවලට හාල් බෙදන්න සිද්ධ වෙන්නෙත් කොළඹින් ගෙන ගිහිල්ලයි. මේ සඳහා විශාල වියදමක් දරන්න සිද්ධ වෙනවා. එහෙත් වී කොළඹට ගෙනවිත් කොළඹින් නැවත වරක් ඒවා වී මෝලකට යවල කොටල එහාට හාල් ගෙන ගොස් බෙද දීමයි කෙරෙන්නෙ.

තිස්සමහාරාමයේ විවිධ සේවා සමුපකාර සමිතියට පමණක් විමෝලක් තිබෙනවා. ඒ නිසා ඒ විවිධ සමුපකාර සමිතියට පමණක් හැකියාවක් ඇති වී තිබෙනවා ඒ ප්‍රාදේශික මඟින් පහසු මිලටත් හොඳටත් හාල් බෙද දීමට. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. ඒ ප්‍රදේශයේ තිබෙන සෑම විවිධ සේවා සමුපකාර සමිතියකටම හොඳ ආර්ථිකයක් තිබෙනවා. ඒ වාගේම පරිපාලනයත් දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව කර ගෙන යනවාය කියා මට විශ්වාසයක් තිබෙනව. ඒ නිසා විශේෂයෙන් මේ අලුත් කොමසාරිස්තුමාගෙන් ඉල්ලීමක් කරන්නට සිද්ධ වෙනවා, ඒ සෑම විවිධ සේවා සමුපකාර සමිතියකටම වී කෙටීමට මෝල් ලබා දෙන්නය කියා. මා එසේ කියන්නේ ඒ දිස්ත්‍රික්කය වී නිෂ්පාදන අතිරික්තයක් තිබෙන ප්‍රදේශයක් නිසයි. එසේ කළොත් ප්‍රවාහන කටයුතු සඳහා යන විශාල මුදලක් ඉතිරි කර ගන්නටත් පුළුවන්, පාරිභෝගිකයින්ට හොඳ හාල් ලබා දෙන්නටත් පුළුවන්.

මීළඟට රුපියලේ සාමාජිකයින් ගැන මතක් කරන්නට මට සිද්ධ වෙනවා. ප්‍රාදේශිකවලට රුපියලේ සාමාජිකයින් බඳවා ගැනීමට මහන්සි වෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩල පත් කර ගැනීමට ඡන්ද පවත්වන අවස්ථාවලදී පමණයි. ඉන් එහාට ඒ රුපියලේ සාමාජිකයින් අවශ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නේ නැහැ. කාරක සභාවල් නැහැ. මහා සභාවල් නැහැ. ඇත්ත වශයෙන්ම කල්පනා කර බලනවා නම් මේ රුපියලේ සාමාජිකත්වය නියම සාමාජිකත්වයක් නොවෙයි. කාට හෝ සභාපති වන්නටත් කීප දෙනෙකුට අධ්‍යක්ෂ මණ්ඩලයට රිංගා ගන්නටත් මේ රුපියලේ සාමාජිකත්වය උපයෝගී කර ගන්නවා. මේ සාමාජික මුදල් රු. 50 දක්වා වැඩි කළත් මෙය ක්‍රමවත් කරන්නට හැකියාවක් ඇති වන්නේ නැහැ. ඒ නිසා ඒ සමුපකාර සමිතිවලින් බඩු මිල දී ගන්නා සැම පාරිභෝගිකයෙකුටම නැත්නම් ඒ සමුපකාර සමිතිවලින් බඩු මිල දී ගන්නා හැම ගෘහයකින්ම අඩු ගණනේ එක් කෙනෙකුටවත් අනිවාර්යයෙන් ඉබේම සාමාජිකත්වය ලැබෙනවා නම් අන්න අර අධ්‍යක්ෂ මණ්ඩල තෝරා පත් කර ගන්නා අවස්ථාවලදී පමණක් ලහි ලහියේ රුපියල බඳින සාමාජිකයින්ගේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන් බව ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතිය.

ඒ රුපියල බඳින්නෙත් සාමාජිකයින් නොවෙයි. අධ්‍යක්ෂ මණ්ඩලයට රිංගා ගන්නට ලැහැස්ති වන අයයි ඒ මුදල් බඳින්නේ. එක් කෙනෙක් රු. 1000 ක් පමණ බඳිනවා. ඒ විධියටයි කරන්නේ. එය නියම සාමාජිකත්වයක් නොවෙයි. එතන තිබෙන්නේ ගමේ අයගේ අදහස් නොවෙයි. එවිට අධ්‍යක්ෂ මණ්ඩලය පත් වන්නේ ඒ ගමේ අයගේ අවශ්‍යතාවන් අනුව නොවෙයි. අර අය සල්ලි බඳින නිසා ඔවුන් ඉබේ පත් වන ක්‍රමයක් තිබෙන්නේ. ඒ නිසා හැම පාරිභෝගිකයෙකුකට බැරි නම් එක ගෘහයකින් එක් අයෙකුට—හැම ගෘහ මූලිකයෙකුටම—අනිවාර්යයෙන් සාමාජිකත්වය ලැබෙනවා නම් අන්න එවිට ගමේ හැඟීම් එතන ඇති වෙනවා. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලවලට පත් වෙන්නේත් ගමේ අයගේ අවශ්‍යතාවය උඩයි. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙනුත් කොමසාරිස්තුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. මේ ගැන ටිකක් හිතා බලා සමුපකාර සමිති සංශෝධනයේදී මෙයත් ක්‍රියාත්මක කළොත් එයින් සමුපකාරයට රුකුලක් දෙන්නට හැකියාවක් ඇති වෙනවා.

අපි මොන තරම් අණ පනත් ඇති කළත් වැඩක් නැහැ, සමුපකාර සේවකයින් තෘප්තිමත් සේවකයින් නොවෙතොත්. අපේ කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය ලෙනාඩ් කිරිඇල්ල මහතා) කිව්වා සමුපකාර සේවකයින්ගේ පඩිනඩි බොහොම අඩුයි කියා. එවිට ඇමතිතුමා බොහොම ලෙහෙසියෙන් කිව්වා කිරිඇල්ලෙන් පටන්ගන්නය කියා. ඇත්ත වශයෙන්ම අපට පුළුවන්කම තිබෙනවා, ඒ අයගේ වැටුප් නැත්නම් පඩිනඩි වැඩි කරන්නට. ඇමතිතුමා අත හිත දුන්නොත් පමණයි. ඒ අද සමුපකාර සමිතිවලටත් පිරිවැටුම් බද්ද විශාල වශයෙන් ගෙවන්නට සිදු වී තිබෙනවා. මේ නිසා රු. 100 කික් නොවෙයි, තවත් රු. 25 කින් මේ සේවකයින්ගේ වැටුප් වැඩි කළත්, සමුපකාරය කඩා වැටෙනවා ; බිඳ වැටෙනවා. එහෙනම් එතන ඇති වන්නේ සමුපකාරයක් නොවෙයි. ඒ නිසා මා ගරු ඇමතිතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා. ඊයේ කථා කළ හැම මන්ත්‍රීවරයෙක්ම වාගේ මේ ඉල්ලීම කළා. ගරු ඇමතිතුමා මේ කාරණය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර මුදල් ඇමතිතුමා සමගත් සාකච්ඡා කර, මේ පිරිවැටුම් බද්ද අය කිරීම ඉවත් කරන්න පුළුවන් නම් අනික් පළාත් පාලන ආයතනවලින් පිරිවැටුම් බද්දක් අය කරන්නේ නැහැ—සමුපකාර සේවකයින් තව තවත් නෙරපන්නේ නැතිව ඔවුන්ට තව තවත් බර දෙන්නේ නැතිව අපේ ප්‍රදේශවල සමුපකාර සේවකයින්ට වැඩි වැටුපක් ලබා දෙන්නට අපට හැකියාව ඇති වෙනවා. කිරිඇල්ලේ මන්ත්‍රීතුමාට ගරු ඇමතිතුමා අභියෝගයක් ඉදිරිපත් කළා. ගරු ඇමතිතුමා අපට අත—හිත දෙනොත් ඒ අභියෝගය පිළිගන්නට අපි ලැස්තියි.

ඇත්ත වශයෙන්ම, ලංකාවට සමුපකාරය හඳුන්වා දෙන්නට, සමුපකාර ක්‍රමය උගන්වන්නට කැනඩාවෙන්, ඩෙන්මාර්කයෙන්, ස්වීඩනයෙන් එන්නට අවශ්‍ය නැහැ. සමුපකාරය අපේ රටේ ගමේ—ගොඩේ ජනතාවගේ ශරීරයේ තිබෙන දෙයක්. ඒ ජනතාව එදා වැඩ කළේත් අද වැඩ කරන්නේත් සමුපකාර ක්‍රමයටයි. ඇත්ත වශයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමුපකාර ක්‍රමයේ ස්වර්ණමය යුගයක් තිබුණා නම් එසේ තිබුණේ, කවදාවත් පාසලකට නොගිය. උපාධියක් තබා අධ්‍යාපනයක්වත් නැති කෙනෙක් එහි සභාපතිකම කළ කාලයේදීයි. කොණ්ඩය බැඳපු සිංඤෝරිස් රාළහාමි නමැති අහිංසක මනුෂ්‍යයෙක් එහි සමුපකාරයේ සභාපතිකම කළ කාලයේදී තමයි, විවිධ සේවා සමුපකාරයට නව ගොඩනැගිලි ලැබුණේත්, යාන—වාහන ගන්නට පුළුවන් වුණේත්, ගොවි මහත්වරුන්ට ණය මුදල් ලබා ගන්නට පුළුවන් වුණේත්.

එදාත් කොමසාරිස් මහත්වරුන් සිටියා. ඒ වාගේම පරීක්ෂක මහත්වරුන් සිටියා. නමුත් අද වාගේ සිටියේ නැහැ. එද සිටි ඒ අය අවශ්‍ය උපදෙස් ජනතාවට දුන්නා. ඒවා අකුරටම පිළිගත් ගමේ—ගොඩේ උදවිය ඒ අනුව වැඩ කටයුතු කළා. අදත් ඒ අය තමන්ගේ ගමේ—ගොඩේ වැඩ කරන්නේ, කුඹුරේ වැඩ කරන්නේ ඒ ආකාරයටමයි, සමුපකාර ක්‍රමයටයි. ඒ නිසා සමුපකාර ක්‍රමය ගම්වල ඉතා සාර්ථක අන්දමට එදාත් තිබුණා, අදත් තිබෙනවා. ඉදිරියේදීත් එය ඒ විධියටම තිබෙන්නට නම් අපට ඇමතිතුමාගේ සහයෝගය ලැබෙන්න ඕනෑ. එය ලැබෙනවා නම් සමුපකාරයේ නියම පල නෙලා ගන්නට අපට හැකි වෙනවා.

ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධනය තුළින් සමුපකාරයේ පෙරළියක් කරන්නට, දියුණුවක් ඇති කරන්නට, විප්ලවීය වෙනසක් ඇති කරන්නට හැකි වේ ය යන විශ්වාසය මට තිබෙනවා. ස්තුතියි.

අ. භා. 4.5

**ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා (කළුතර දිසා ඇමතිතුමා)**
*(திரு. இந்ரதாச ஹெற்றியாரச்சி—களுத்துறை மாவட்ட அமைச்சர்)*
(Mr. Indradasa Hettiaratchi–District Minister, Kalutara)

ගරු කථානායකතුමනි, මේ සංශෝධන පනත යටතේ සමුපකාර ආයතන යම් කිසි තත්ත්වයකට ගෙන ඒමට අදාළ වන කරුණු කීපයක් මමත් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. සමුපකාර ව්‍යාපාරය මේ රටේ ජනතාවගේ හදවතට කිට්ටු ව්‍යාපාරයක්. එක් දහස් නමසිය හතළිස් ගණන්වල, යුද්ධ කාලයේදී මේ රටට යම් කිසි ආහාර ප්‍රමාණයක් ලැබුණානම්, එය සාධාරණ ලෙස ජනතාව අතර සාධාරණ ලෙස බෙදන්නට පුළුවන් වුණු ව්‍යාපාරයක් හැටියට සමුපකාර ව්‍යාපාරය මේ රටේ ජනතාව විසින් පිළිගෙන තිබෙනවා. ඊට පසු 1971—1976 කාලයේ පොතකට පරිප්පු අවුන්සය බාගය ගණනේ දුන් කාලය ඇතුළත එම අවුන්සය බාගය ගණනේ බෙදන්නට පුළුවන් වුණෙත් සමුපකාර ක්‍රමය නිසායි. ඊළඟට මේ ළඟදී ඇති වුණු අර්බුද කාලයේදීත් සමුපකාරය ඉතාම උසස් තත්ත්වයකට කටයුතු කළාය කියා හැම දෙනෙක්ම පිළිගන්නවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Hon. Minister wants to reply by 5 p.m. Please co-operate with him and if hon. Members could confine their speeches to a maximum of 10 minutes–

**ඉන්ද්‍රදස හෙට්ටිආරච්චි මහතා**
*(திரு. இந்திரதாச ஹெற்றிஆரச்சி)*
(Mr. Indradasa Hettiaratchi)

Yes, Sir. සමුපකාරය වඩාත් උසස් තත්ත්වයකට ගෙන ඒමට මේ සංශෝධන පනතෙන් බලාපොරොත්තු වන බව ප්‍රකාශ වුණා.

දැන් මේ අවධියේ අපේ රජය අලුත් ව්‍යාපාර පටන්ගැනීම සඳහා නොයෙක් බදු සහන දෙනවා. වෙළඳ ව්‍යාපාර නිදහස් වෙළඳ කලාපයේ නොයෙක් ව්‍යාපාර ආදිය ඇති කරන්නට, රටේ වෙනත් නොයෙක් ව්‍යාපාර ඇති කරන්නට බදු සහන රජයෙන් දෙනවා. ඒ බදු සහන අවුරුදු පහ, දහය ආදී කාල සීමාවන් සඳහා දෙනවා. සමුපකාරය දැන් වැටී තිබෙන තත්ත්වයෙන් නැවත වරක් යථා තත්ත්වයට පත් කිරීම සඳහා, අලුත් ව්‍යාපාරවලට දෙන බදු සහන වාගේ ක්‍රමයක් සමුපකාර ව්‍යාපාරය සඳහාත් ලබා දීමට ගරු ඇමතිතුමා කටයුතු සලස්වනවා නම් එය ඉතාම වැදගත් වෙනවායයි මම හිතනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉන්දුදස හෙට්ටිආරච්චි මහතා]

සමුපකාරවලට අද තිබෙන පරිවැටුම් බද්ද ගැන මන්ත්‍රීතුමන්ලා බොහොම දෙනෙක් මතක් කලා. එම පිරිවැටුම් බද්ද අයින් කරන්නට පුළුවන්. ඊළඟට මුද්දර ගාස්තු අයින් කරන්නත් පුළුවන්. සමුපකාරයකින් කුමන හෝ කොන්ත්‍රාත්තුවක් අත්සන් කළත් බොහොම මුද්දර ගාස්තු යනවා. මුදල් ඇමතිතුමාට පුළුවන් එම මුද්දර ගාස්තු අයින් කරන්න. එසේම ආදායම් බද්දක් ගන්නවා සමුපකාරයෙන්. ඒ ආදායම් බද්දත් අයින් කරන්න පුළුවන්. සමුපකාරයෙන් මේවා අයින් කළහොත් විශාල සහනයක් ඇති වෙනවා. මේ සහන ඇති වෙනවා වගේම මෙම ආයතන දියුණු කරන්නට තවත් වැඩ පිළිවෙලක් ඇති කරන්නට ඕනෑ.

අපේ සමුපකාර තොග වෙළඳ ආයතනය තිබෙනවා. සමුපකාර සංගම් එකතු කොට, එවැනි ආයතනයක් මේ රටේ ඇති කළහොත් සමුපකාර සංගම්වලට එම ආයතනය සමඟ තරග කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති වනවා වගේම මෙම ආයතනවලින් 'සමුපකාර සංගම්වලට අවශ්‍ය බඩු පිටරටින් ගෙන්වන තත්ත්වයක් ඇති කළහොත් සමුපකාර ව්‍යාපාරයට ලොකු ශක්තියක් ඇති වනවාය යන්න මතක් කළ යුතුයි. තොග වෙළඳාම සම්බන්ධයෙනුයි ඒ. ඒජන්සීස් යන නමින් ඒ තොග වෙළඳාමේ නියෝජිත ධුර තිබෙනවා. මේ සමුපකාර ආයතනවලට ඒ නියෝජිත ධුර දෙන්නට පුළුවන්. එවිට බොහෝ දුරට නිදහස් වෙළඳාම තුළින් ඇති වන ඒ තරගයෙන් වැළකී සමුපකාරය දියුණු කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා. ඒ විධියට මුදුන් මට්ටමේ යම්කිසි ආයතනයක් ඇති කළහොත් මුළු රටේම සමුපකාර සංගම්වලින් කොටස් දමා ඒ කටයුත්ත සම්පූර්ණ කරන්නට පුළුවන් වෙනවා. පිටරටවල් සමඟ ගණුදෙනු සම්බන්ධකම් ඇති කරගෙන එංගලන්තය ආදී වෙනත් රටවල තිබෙන සමුපකාර සංගම් සමඟ සම්බන්ධ වී කටයුතු කළහොත් ඒ රටවල නිෂ්පාදනය කරන බඩු මේ රටේ සමුපකාර සංගම් මාර්ගයෙන් විකුණන්නට පුළුවන් වෙනවා. ඒ වාගේම මේ රටේ නිෂ්පාදනය කරන බඩු සමුපකාර සංගම් මාර්ගයෙන් ඒ රටවලට විකුණාගන්නට පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා. එවැනි වැඩපිළිවෙලක් ඇතිකොට නිදහස් වෙළඳ කලාපයේ තිබෙන බදු නිදහස වගේ ක්‍රමයක් ගරු ඇමතිතුමා ඇති කරාවියයි මම කල්පනා කරනවා.

ඊළඟට බැංකු ක්‍රමය ගැන මතක් කළයුතුයි. සමුපකාරය වෙනුවෙන් ඇති කළ බැංකුව ගැන මීට ප්‍රථමයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කලා. එද ඇති කළ ඒ බැංකුව මහජන බැංකුවට පරිවර්තනය වුණා. එසේ පරිවර්තනය වීම නිසා සමුපකාර බැංකුවට ලැබිය යුතු වරප්‍රසාද බොහොම දුරට අඩු වී තිබෙන බව සඳහන් කළ යුතුයි. අපට තිබෙන ලොකුම අමාරුකම තමයි මේ පොලිය. ණය දෙනවා. දුන්නාම පොලිය ගෙවන්නට සිද්ධවීම සමුපකාරවලට උහුලන්නට බැරි බරක් වී තිබෙනවා. මෙම ප්‍රශ්න විසඳන්නට පුළුවන් නම් සමුපකාර සේවකයන්ට වැඩි වැටුප් දෙන්නට පුළුවන්.

අද පෞද්ගලික ආයතවල හා වෙනත් ආයතනවල තත්ත්වය ගැන සසඳා බලන විට සමුපකාර සංගම්වල සේවය කරන අයට ලැබෙන වැටුප ඉතාම සුළුයි. ජීවත් වන්නට බැරි තරම් සුළු වැටුප් ප්‍රමාණයක් සමුපකාරවල සේවය කරන අයට ලැබෙන්නේ. මෙම වැටුප් කෙසේ හෝ වැඩි කළ යුතුයි. මෙම කරුණු ගැන අවධානය යොමු කලොත් එවිට මෙම ආයතන දියුණු කරන්නට පුළුවන් වෙනවා. මෙම ව්‍යාපාරය වැටෙන්නට දෙන්නට පුළුවන් කමක් නැහැ. එහි දියුණුව සඳහා නොයෙකුත් සමුපකාර වැඩපිළිවෙලවල් ඇති කරන්නට පුළුවන්. සමුපකාරය කඩයට පමණක් සීමා වී නැහැ. ණය දෙන සමිතින් තිබෙනවා. ගම්වල සමුපකාර සමිති රාශියක් තිබෙනවා. සමුපකාර සංගම්වලට බැඳී ඒවායේ කොටස්කරුවන් වන්නට මහජනතාව කැමතියි. අපේ ප්‍රදේශවල සමුපකාරය ගැන බැලුවාම මට පෙනෙන විදියට හොඳ වැඩපිළිවෙලක් ඇති වුණොත් මෙම ව්‍යාපාරයට ඕනෑ තරම් මුදල් යොදන්නට මහජනතාව කැමතියි. එම නිසා මෙම පනත තුළින් සැහෙන දියුණු තත්ත්වයක් මේ රටේ සමුපකාරයට ඇති වේවායයි ප්‍රාර්ථනා කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අනිල් මූණසිංහ මහතා (මතුගම)
*(திரு. அனில் மூனசிங்க—மத்துகம)*
(Mr. Anil Moonesinghe–Matugama)

ගරු කථානායකතුමනි, සමුපකාර ව්‍යාපාරය ගැන සැහෙන විග්‍රහයක් කරන්නටයි, මම බලාපොරොත්තුව සිටියේ. එහෙත් මේ අවස්ථාවේදී දීර්ඝ කතාවක් කරන්නට ඉඩක් නැතැයි කියා මා හිතනවා. මේ රට තුළිනුත්, වෙනත් රටවලිනුත් අපට ලබාගන්න තිබුණ අත්දැකීම් අනුව සමුපකාර ව්‍යාපාරය ඉතාමත් වැදගත් ව්‍යාපාරයක් බව අපට පැහැදිලිව් තිබෙනවා. අපේ ආර්ථික ක්‍රමයේ එක් පැත්තකින් සීමාසහිත කොම්පැනි තිබෙනවා. අනිත් පැත්තෙන් පෞද්ගලික ආයතන හා ව්‍යාපාර තිබෙනවා. මේ දෙකට මැද්දෙන් ජනතා ව්‍යාපාරයක් වශයෙන් තමයි, සමුපකාර ව්‍යාපාරය අද ලෝකයේ පවතින්නේ.

බ්‍රිතාන්‍යයේ පළමුවෙන්ම මේ සමුපකාර ව්‍යාපාරය ඇති වුණේ වැඩ වර්ජනයක් කරගෙන යන අවස්ථාවේදී කම්කරුවන්ට කෑම ද්‍රව්‍ය ලබා ගන්නට අමාරු වුණ නිසයි. ඒ අමාරුකම නිසා ඉබේම වාගේ මේ සමුරකාර ව්‍යාපාරය බිහි වුණා. එසේ උප්පත්තිය ලැබ එංගලන්තය, ජර්මනිය සහ ස්කැන්ඩිනේවියානු රටවල 'සමුපකාර ව්‍යාපාරය කොපමණ දියුණු වුණාද කිව්වොත් අද ස්වීඩනයේ පාරිභෝජන භාණ්ඩ බෙද හැරීමේ ව්‍යාපාරය බොහෝ දුරට කෙරෙන්නෙ සමුපකාර මගිනුයි. එය පහළ මට්ටමේ සිට ඉහළ මට්ටමට දියුණු වී තිබෙනවා. නමුත් ඒ රටවල සමුපකාර ව්‍යාපාරයට රජයේ කිසිම මැදිහත්වීමක් නැහැ. ඒ සමුපකාර සමිතිවල රෙජිස්ට්‍රර් කෙනෙකු ඉන්නවා. එම සමුපකාර සමිතිවල හරියාකාරව වැඩ කෙරෙන්නේ නැත්නම් හරියට සීමාසහිත වගකීම් ඇති කොම්පැණිවල රෙජිස්ට්‍රාර් මැදිහත් වෙනවා වගේ මැදිහත්වීමක් පමණයි, රජයෙන් කෙරෙන්නෙ.

ලංකාවේ සමුපකාර සමිතිවල උප්පත්තිය ඇති වුණේ ආණ්ඩුවේ මැදිහත්වීමෙනුයි. පළමුවෙන්ම 1911 දී ණය දෙන සමිති ඇති වුණත් යම්කිසි විධියකට 1942 යුද්ධයත් සමග සමුයකාර සමිති පළමුවෙන්ම බිහි කළේ රජය විසිනුයි. ඇත්ත වශයෙන්ම ඒ උප්පත්තියේ ලකුණු තවමත් අපේ සමුපකාරවල තිබෙනවා. ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම කියන්න යෙදුනා, 1972 දී—පසුගිය ආණ්ඩු කාලයේදී—සමුපකාරයට මන්ත්‍රීවරුන්ගේ මැදිහත්වීම, දේශපාලන මැදිහත්වීම, ඇතිවුණාය කියා. එය හොඳ දෙයක් නොවෙයි. එම විවේචන මම සියට සියයක්ම පිළිගන්නවා, මම හිතන විධියටත් ක්‍රම ක්‍රමයෙන් රජයේ මැදිහත්වීම අයින් කළ යුතුයි. මම හිතන විධියට රජයේ මැදිහත්වීම නැතිව මෙම ආයතන ගෙන යන්නට පුළුවන් නම් ඒවා ආදර්ශමත් ආයතන හැටියට පවත්වාගෙන යන්න පුළුවන් වෙනවා. 1972 දී පමනක් නොව, 1977 න් පසුවත්, වර්තමානයේත් තිබෙන තත්ත්වය අනුව සමුපකාර සමිතිවලට රජයේ ඇඟිලි ගැසීම්, බලපෑම් තිබෙන බව අපට පේන්න තිබෙනවා. ඒ නිසා පළමුවෙන්ම මේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති අපි පිළිගැනීම සුදුසුය කියන බව මගේ කල්පනාවයි. එය දවසින් දවස තහවුරු කිරීමයි, අපි කළ යුතු වන්නේ.

ඇත්ත වශයෙන්ම අද තිබෙන වැදගත්ම ප්‍රශ්නය වන්නේ මේ විවිධ සේවා සමුපකාර සමිති, සමුපකාර ව්‍යාපාරය, විවෘත ආර්ථිකයට මුහුණ දෙන්නේ කොහොමද කියන ප්‍රශ්නයයි. තරඟකාරී තත්ත්වයක් අද තිබෙනවා. සමුපකාර ව්‍යාපාරය මේ තරඟකාරී තත්ත්වයට කොහොමද මුහුණ දෙන්නේ? බොහෝ මන්ත්‍රීවරුන් කිව්වා, පිරිවැටුම් බද්ද අස්කරන්න ඕනෑ,නොයෙක් සහන දෙන්න ඕනෑ කියා. ඒ ආකාරයට පමණක් කටයුතු කළාට ප්‍රමාණවත් වන්නේ නැහැ. මේ සමුපකාර ව්‍යාපාරය අද මේ තරඟකාරී රටාව ඇතුළත ජීවමාන ව්‍යාපාරයක් බවට පත් කරන්නට නම් මේ සමුපකාරවලට වැඩි ධෛයයක් දෙන්නට, වැඩි ශක්තියක් දෙන්නට එහි කටයුතු විවිධ පැතිවලට හරවන්නට අපට සිදුවෙනවා. විශේෂයෙන්ම නිෂ්පාදන පැත්තට හරවන්නට ඕනෑ.

මම උදාහරණයක් දෙන්න කැමතියි. අපේ පළාතේ පැෂන් ෆෘට්—වැල් දොඩම්—සෑහෙන ප්‍රමාණයක් වැවෙනවා. අපේ ප්‍රදේශවල වැවිය හැකි තවත් සුළු අපනයන ද්‍රව්‍ය තිබෙනවා. මේවා වැව්වත් ඒවා එකතු කරන්නට, ඒවාට නියම මිලක් ලබා දෙන්නට, ඒවා පිටරට යවන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිසිම ආයතනයක් නැහැ. මම හිතනවා, විවිධ සේවා සමුපකාර සමිති මාර්ගයෙන් මේ කටයුත්ත කරන්න පුළුවන්ය කියා. අද තිබෙන රැකී-රක්ෂා ප්‍රශ්නය විසඳීමටත් තිබෙන එක මාර්ගයක් තමයි, මේක. අපේ පළාත්වල ඕකිඩ් වගාව කරන්න පුළුවන්. ඒ වගේම සුළු භෝග ආදිය වැඩීම ගෘහ කර්මාන්තයක් නැත්නම් ගෘහ කෘෂි කර්මාන්තයක් වශයෙන් ගෙන යන්න පුළුවන් නම්, ඒ නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ එකතු කර විකිණීම සඳහා මැදිහත් වෙන්න විවිධ සේවා සමුපකාර සමිතිවලට පුළුවනි. එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබෙනවා. ගරු ඇමතිතුමා සමුපකාර ව්‍යාපාරයට නව ජීවනයක් දෙන්න බලාපොරොත්තු වෙනවා නම් මෙවැනි අලුත් ක්‍රම සකස් කිරීමෙන් තමයි, එය කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

ගරු ඇමතිතුමා කීවා, අපේ සමුපකාර සමිතිවලින් සියයට 55 ක් 60ක් පමණම අද ණය වී තිබෙනවාය කියා. ඒ නිසා තමයි, අද හැම ප්‍රශ්නයක්ම මතු වී තිබෙන්නේ. ගරු මන්ත්‍රීවරයෙක් කීවා වාගේ අද බොහොමයක් සමුපකාර කඩ දිහා බැලුවාම පෙනෙන්නේ පුස් කාපු තැන් වගෙයි. ඒවායේ හරිහමන් වහලක් නැහැ ; පාරිභෝගිකයන්ට හිටගෙන ඉන්නවත් නියම තැනක් නැහැ ; සේවකයන්ට වැඩ කරන්නත් අමාරුයි. ඒ විධියට අපි අද සමුපකාර ව්‍යාපාරය ගෙන යන්නේ දුප්පත් ව්‍යාපාරයක් වශයෙනුයි. හැමදාමත් ඒ විධියට සමුපකාර ව්‍යාපාරය ගෙන යන්න බැහැ. විශේෂයෙන් මෙවැනි තරගකාරී යුගයක අපට සිද්ධ වෙනවා, පෞද්ගලික අංශයත් සමඟ තරග කිරීමේ ශක්තිය සමුපකාර ව්‍යාපාරයට ලබා දීම සඳහා ඒවාට ආධාර කරන්න. ස්විඩනයේ නම් සමුපකාර කඩ තමයි, අනෙක් හැම කඩයකටම වඩා බොහොම ලස්සණට තිබෙන්නේ. ඒ විධියේ දියුණුවක් අපේ රටේ සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙනුත් අපි ඇති කරන්න ඕනෑ.

කොහොමද, එය කරන්නේ ? එයට එක වර උත්තරයක් දෙන්න හැමෝටම බැහැ. නමුත් කල්පනා කරන විට අපට පෙනෙනවා, විවිධ ක්‍රමවලින් සමුපකාර සමිතිවලට ආදායම් ලබා දීමේ ශක්තියක් අපට තිබෙනවාය කියා. එහෙම නැතිව හාල්, මිරිස්, සීනි වගේ දේවලින් පමණක් සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්න බැරි බවයි, අපේ මතය.

කළුතර දිසා ඇමතිතුමා කීවා වාගේ අපි පුළුවන් තරම් අපේ විවිධ සේවා සමුපකාර සමිති නිෂ්පාදන පැත්තට හරවන්න ඕනෑ. අද තිබෙන දර්ශනය අනුව පුළුවන් වේවි, රජයෙන් යම්කිසි ආධාරයක් ලබා දීම මඟින් එය කරන්න.

ගරු ඇමතිතුමා කීවා, දිවංගත ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමා එතුමාගේ සීයාය කියා. ඒ වගේම ගරු ඇමතිතුමාගේ මෙන්ම මගේත් සීයා වන අනගාරික ධර්මපාලතුමා කීවා, මේ රටේ පුළුවන් තරම් නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑය කියා. නමුත් අපේ රටේ සමූහ නිෂ්පාදනය දිහා බලන විට නම් මේ ආණ්ඩුව යටතේ නිෂ්පාදන වර්ධනයේ අනුපාතය පහළ වැටී තිබෙන බව කනගාටුවෙන් නමුත් කියන්න සිදු වී තිබෙනවා. අපේ රටේ නිෂ්පාදනය වැඩි නොකලොත්, කාර්මික නිෂ්පාදනය වැඩි නොකලොත් අපට ආර්ථික අනාගතයක් නැති බවයි, අපේ විශ්වාසය. එම නිසා අපේ විවිධ සේවා සමුපකාර සමිති ඒ පැත්තට හරවන්න ඕනෑ බවයි, අපේ මතය.

ඒ සමඟම කිව යුතු තවත් වචනයක් තිබෙනවා. කළුතර දිසා ඇමතිතුමා සමුපකාර තොග වෙළෙඳ ආයතනය ගැන කීවා. ඇත්ත වශයෙන්ම " සමුපකාර තොග වෙළෙඳ ආයතනය " යනුවෙන් එයට දී තිබෙන නම වැරදියි. එය සමුපකාර තොග වෙළෙඳ ආයතනයක් නොවෙයි. ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන්න ඕල්බර්ග් නමැති මහත්මයා පත් කර තිබුණා. කාල-වේලා නැති නිසා එතුමාගේ වාර්තාව කියවන්න මම අදහස් කරන්නේ නැහැ. නමුත් එතුමාගේ වාර්තාවෙන් එතුමා සමුපකාර තොග වෙළෙඳ ආයතනය හඳුන්වා තිබෙන්නේ, හරියට අශ්වයාට ඉස්සරහින් කරත්තය දැමුවා වාගේ එකක් හැටියටයි.

එංගලන්තයේ සී.ඩබ්ලිව්.එස්. එක—Co-operative Wholesale Society—ඇති වුණේ ඒ සමාගම්වල ශක්තියෙනුයි. ඒ සමාගම් දියුණු වන ප්‍රමාණයට ජාතික වශයෙන් සී.ඩබ්ලිව්.එස්. එක ඇති වුණා. ඒ විධියටයි, මේකත් ඇති කළ යුතුව තිබුණේ. නමුත් මේක එහෙම නොවෙයි, ඇති කර තිබෙන්නේ. රජයේ තීන්දුවක් අනුව සී.ඩබ්ලිව්.ඊ. එක වෙළෙඳ ඇමතිතුමා යටතට පත් කර තිබෙනවා. එහෙම නම් ගරු ඇමතිතුමාට සිද්ධ වෙනවා, අලුතින් ආයතනයක් ඇති කරන්න. ඒ මොකද කීවොත් ඒ මට්ටමේ ආයතනයක් නැතිව මේ ව්‍යාපාරය සාර්ථකව කර ගෙන යන්න බැරි නිසයි. එක මට්ටමක විවිධ සේවා සමුපකාර සමිති තිබෙනවා. එයින් එහාට ඉහළ මට්ටමේ සංවිධානයක් ඇති කරන්නට ඕනෑ. ඒ සංවිධානයෙන් තමයි, හුඟක් දුරට විශේෂයෙන් පිටරට බඩු යැවීම ආදිය කරන්නට පුළුවන් වන්නේ. අන්න ඒ වික කරන ලෙස මම විශේෂයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒවාගේම ඊකන් එක්ක යන සමුපකාර බැංකුවක් තිබෙන්නට ඕනෑ. එහෙම නැත්නම් මහජන බැංකුව වැනි වාණිජ බැංකුවකුත් සමඟ මේ ගනුදෙනු කරන්න බොහොම අමාරුයි. මේ සමුපකාර සමිති මාර්ගයෙන් අද විශාල මුදල් සම්භාරයක් එකතු කරන්නට පුළුවන්කම තිබෙනවා. ඒ මුදල් මහජන බැංකුවේ තැන්පත් කරන්නේ නැතිව ජීවමාන සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහා වෙනම සමුපකාර බැංකුවක් ඇති කරන ලෙස මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, සමුපකාර සේවකයන් ගැනත් වචනයක් දෙකක් කියන්නට ඕනෑ. අපි හැමදම මේ සේවකයන්ට ඉතාම අඩු පඩියකුයි ගෙවන්නේ. පඩි වැඩි කරන්නය කියා ගරු ඇමතිතුමා කිව්වා. නමුත් එහෙම කීමෙන් ඇති ප්‍රයෝජනයක් නැහැ. මොකද, ඒ සමිතිවලට පඩි වැඩි කරන්නට ශක්තියක් නැහැ. හැබැයි, සේවකයින් පඩි වැඩි කර ගන්නවා. ඒ අය හැමදම ඒක කර ගන්නවා. ඒ ගැන කවුරුවත් කල්පනා කරන්නේ නැහැ. නොයෙක් අයුතු මාර්ගවලින් සේවකයින් විසින්ම පඩි වැඩි කර ගන්නවා. ඒ නිසා හැමදම "ලීකේජ්" තිබෙනවා, හැමදම අඩුවක් තිබෙනවා. එමනිසා සමුපකාර සේවකයන්ට හරියාකාර පඩියක් ගෙවීම ගැන පරීක්ෂණයක් පවත්වා කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. එහෙම නැත්නම් සමුපකාර කටයුතු කවදාවත් හරියට කරන්නට බැහැ. අද තිබෙන සීමාවන් තුළ ඉඳගෙන මේ කටයුත්ත කරන්නට බැහැ. ඔබතුමා පොරොන්දු වුණු පරිදි මේ පණත ප්‍රමාණවත් නැත්නම් තවත් පනතක් ගෙනැවිත් හෝ මීට වඩා ප්‍රතිසංස්කරණයක් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

අද සමුපකාර සේවකයන්ට තිබෙන අමාරුකම් ගැන කල්පනා කර බලන්න. මතුගම විවිධ සේවා සමුපකාර සමිතියේ ආරියපාල කියා මහත්මයෙක් සිටියා, මම දන්නවා. 1976 දී ඒ මහත්මයාගේ වැඩ නැවැත්වූවා. එවකට හිටපු මන්ත්‍රී පැස්කුවල් මහත්මයාට බැන්නාය, ඒ මන්ත්‍රීතුමා විවේචනය කළාය කියලයි වැඩ නැවැත්වූවේ. පුදුමය මේකයි: 1977 දී අලුත් ආණ්ඩුවක් ආවා. ඒ අලුත් ආණ්ඩුව යටතේත් ඒ මහත්මයාගේ වැඩ එහෙමම තහනම් කර තිබුණා, අවසානයේදී සමුපකාර සේවක කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කරමින් නඩුවක් දැම්මාට පසුවයි. පසුගිය මාසයේ සිට ඒ මහත්මයාට රක්ෂාවත්, පඩිත් ලැබුණේ. බලන්න ගරු කථානායකතුමනි, 1976 සිට 1983 දක්වාම ඒ මහත්මයාට කිසිම රක්ෂාවක් නැතිව ඉන්නට සිදුවුණා. මේ වාගේ වැඩවලට සමුපකාර සේවක කොමිෂන් සභාව ඉඩ තබා ඇත්තේ ඇයි කියා මම මේ අවස්ථාවේදී අහනවා. ඒවාගේම නීති සම්පාදනය කරන මේ ගරු සභාව මේවාගේ දේවල්වලට ඉඩ තබා තිබෙන්නේ ඇයි කියා මම මේ අවස්ථාවේදී තමුන්නාන්සේගෙන් අහන්නට කැමතියි.

ඒ නිසා අවසාන වශයෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, සමුපකාරයෙන් දේශපාලනය අයින් කරන ලෙසයි. දේශපාලනය අයින් කරපු ප්‍රමාණයට තමයි, ඇත්ත වශයෙන්ම සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්නට පුළුවන් වන්නේ. සමුපකාරයක් බඳ ගත්තාම යම් යම් අයට රක්ෂාවල් ලබාදෙන්නට පුළුවන්කම තිබෙනවාය ඊට පසුව නැවතත් පහසුවෙන් පාර්ලිමේන්තුවට එන්නට පුළුවන්කම ලැබෙනවාය කියා සමහර මන්ත්‍රීවරුන් හිතනවා. නමුත් එයින් සිදු වන්නේ හුඟක් මන්ත්‍රීරුන් නරක් වෙන එකයි. මම එය හොඳහැටි දන්නවා. මේවාගේ දේට මැදිහත්වීමෙන් සමහර උදවිය තමන්ගේ දේශපාලන ජීවිතය කෙළසාගෙන තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ අදහස මම මේ අවස්ථාවේදී විශේෂයෙන් අනුමත කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අකිල් මුණසිංහ මහතා]

මම මීට වඩා දීර්ඝ වශයෙන් කතා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඉතාමත් තිවුණු විධියට තම අදහස් ප්‍රකාශ කර, අපක්ෂපාත විධියට පනත ගෙනැවිත්, විරුද්ධ පක්ෂයේ සහයෝගයත් ලබාගෙන වැඩ කිරීමට දක්ෂකමක් තිබෙන ගරු ඇමතිතුමාට ප්‍රශංසා කරමින්, මේ පනත පමණක් නොව මීත් ඉදිරියටත් අවශ්‍ය අණපනත් ගෙනෙමින් සමුපකාර ව්‍යාපාරය අතිශයින් දියුණු අදියරකට ගෙන යාමට එතුමාට පුළුවන් වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I recognize the hon. Member for Mulkirigala. He can start at 5 p.m. The Sitting is suspended till 5 p.m.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිව අත්හිටුවන ලදින්, ප.ව.5.00ට නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி. ப. 5 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 5 p.m. and then resumed,* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *in the Chair.*

අ. භා. 5.00

**කේ. ආනන්ද කුලරත්න මහතා** (මුල්කිරිගල)
*(திரு. கே. ஆனந்த குலரதன—முல்கிரிகல)*
(Mr. K. Ananda Kularatne–Mulkirigala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර සමිති (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී මේ ගරු සභාවේ වචන ස්වල්පයක් කථා කිරීමට මට අවස්ථාව සලසා දීම ගැන ප්‍රථමයෙන්ම මා ස්තුතිවන්ත වෙනවා. මගේ මුල්කිරිගල ආසනයේ සමුපකාර සමිති දෙකක් තිබෙනවා. පසගිය දිනවල කලබලකාරී අවස්ථාවේදී එම සමුපකාර සමිති දෙකෙන් ඉතාමත් හොඳ සේවයක් සිදු වුණා කියා මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය කලට වේලාවට එම සමුපකාර සමිති තුළින් ලබා ගැනීමට අපේ ප්‍රදේශයේ ජනතාවට අවස්ථාවක් ලැබුණ නිසා අපේ ප්‍රදේශයේ ජනතාවගේ අගහිඟකම් සෑහෙන දුරට අඩුවුණාය කියා මා විශ්වාස කරනවා.

පෞද්ගලික වෙළඳුන් සමග කරට කර තරඟ කිරීමට සමුපකාර සමිතිවලට සිදුවී තිබෙන නිසා මෙම සමුපකාර සමිතිවලින් අල, රටඑනු, පිටි, හාල්, සීනී ආදී අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පමණක් බෙදා හැර ලාබදායී විධියට, සාර්ථක විධියට මෙම සමුපකාර සමිති ඉදිරි කාලයේදී පවත්වාගෙන යාමට අවස්ථාවක් නැතිවෙයි කියා මා හිතනවා. අන්න ඒ අවස්ථාවේදී පෞද්ගලික වෙළඳුන් එම සමුපකාර සමිති අභිබවා ඉදිරියට එන තත්ත්වයක් ඇතිවෙනවා. ඒ අවස්ථාවේදී සමුපකාර සමිති බංකොලොත් භාවයට පත්වීමට ඉඩ තිබෙනවා. එම නිසා මෙම සමුපකාර සමිති මාර්ගයෙන් ප්‍රදේශයේ තිබෙන සම්පත් උපයෝගී කර ගෙන සුළු ප්‍රමාණයේ හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත ආරම්භ කළොත් සමුපකාර සමිති ලාභදායී විධියට පවත්වාගෙන යන්නට පුළුවන්වෙයි කියා මා හිතනවා. ඒ මඟින් සෑහෙන පිරිසකට රැකියා පහසුකම් ලබා ගැනීමට හැකිවෙනවා. එම නිසා සමුපකාර සමිති මාර්ගයෙන් ප්‍රදේශයේ තිබෙන සම්පත් උපයෝගී කරගෙන සුළු හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත ආරම්භ කිරීමට ගරු ඇමතිතුමා අවධානය යොමු කරාවි කියා මා හිතනවා.

ඊළඟට, මේ ගරු සභාවේ සවිත සියලු මන්ත්‍රීවරු සඳහන් කළා වාගේම සේවක සේවිකාවන්ගේ වැටුප් සම්බන්ධයෙනුත් මා විශේෂයෙන් මතක් කරනවා. අපට ලැබී තිබෙන පැමිණිලිවලින් විශාල ප්‍රමාණයක් ලැබී තිබෙන්නේ මේ වැටුප් සම්බන්ධවයි. සමහර ප්‍රාදේශිකවල සේවය කරන තරුණ තරුණියන් රුපියල් සියයක පමණ දීමනාවකට යටත්ව සේවය කරන අවස්ථා තිබෙනවා. එබඳු අවස්ථාවලදී අපට බලාපොරොත්තු වෙන්න බැහැ, ඒ අයගෙන් හොඳ සේවාවක්. මම හිතනවා එම සේවකයනට සේවා ස්ථානයට එන්නට බස් ගාස්තුව වශයෙන්වත් එය ප්‍රමාණවත් නොවේය කියා. එමනිසා හොඳ වැටුප් තලයක් මත මෙම සමුපකාර සේවක සේවිකාවන් සේවයෙහි යොදවන්නය කියා මම කියා සිටිනවා.

මම වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මෙම සංශෝධනය තුළින් වඩාත් හොඳ සේවයක්, වඩාත් හොඳ සමුපකාර සේවයක් අපට ලබා ගැනීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**යසපාල හේරත් මහතා** (නැගෙනහිර අනුරාධපුර)
*(திரு. யசபால ஹேரத்—அனுராதபுரம் கிழக்கு)*
(Mr. Yasapala Herath–Anuradhapura East)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කථා කරන්නේ එංගලන්ත රටේ ආරම්භ වුණු රොබට් ඕවන් මැතිතුමාගේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න නොවෙයි. මේ අවස්ථාවේ මම ප්‍රථමයෙන්ම ප්‍රාර්ථනයක් කරන්නට බලාපොරොත්තු වෙනවා, මේ සංශෝධනය තුළින් ලංකාවේ සමුපකාර ව්‍යාපාරයට ප්‍රතිසංවිධානයක් හා නවෝදයක් ලැබේවා කියා.

සමුපකාරිකයකු වශයෙන් අවුරුදු 10 ක් පමණ සමුපකාර ව්‍යාපාරයේ නියුක්තවූ කෙනෙක් හැටියට අත්දැකීම් රාශියක් මට තිබෙන නිසා සුළුවෙන් වුවත් අදහස් කිහිපයක් කැටිකරලා අපේ ගරු ඇමතිතුමාගේ මේ කර්තව්‍යයට උදව්වක් උපකාරයක් කිරීමටයි මම බලාපොරොත්තු වන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මතුගම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ (අකිල් මුණසිංහ මහතා) කථාව ඉතාමත්ම සාරවත් එකක්. මම කතා කරන්න අදහස් කළෙත් ඒ කරුණු ගැනමයි. එතුමා ප්‍රකාශ කර සිටියා එක පැත්තකින් රාජ්‍ය අංශයත්, අනික් පැත්තෙන් පෞද්ගලික අංශයත් අතර කෙරෙන මේ තරගයේදී සමුපකාර සමිතිවලට අවාසනාවන්ත ඉරණමක් අත්වෙනවා කියා රජයෙන් සෑහෙන නිර්දේශයක් සමුපකාර ව්‍යාපාරයට කරන්නේ නැත්නම්.

මම දන්නවා, සමුපකාරිකයකු වශයෙන් තොව්වියාගම, රාජාංගන ප්‍රදේශවල එදා 1970 දී තිබුණු සමුපකාර ප්‍රතිසංවිධානය ගැන. එයින් බලාපොරොත්තු වුණේ ආර්ථික අතින් ඒකකයක් වශයෙන් පවත්වාගෙන යන්නට බැරි ප්‍රාදේශික තිබුණා නම් ඒවා අහෝසි කර විශාල සමිති පිහිටුවන්නටයි Those societies which could not be run as viable economic units were abolished and bigger units were formed. මේ ප්‍රතිසංවිධානයෙන් බලාපොරොත්තු වුණේ සෑහෙන ප්‍රාග්ධනයක් දී මේ සමුපකාර සමිති, සමුපකාර ව්‍යාපාර දියුණු කරන්නයි. මම සභාපති වශයෙන් සිටි කාලේ මම දන්නවා, අපට මුදල් ලැබුණේ නැහැ. එනිසා අපි කල්පනා කළේ පාරිභෝගික ද්‍රව්‍ය පමණක් පාරිභෝගිකයාට ගෙනැවිත් දීමටයි. අපිට වෙළඳ ණයක් දී තිබුණා. ඒ නිසා අපි කොළඹට ලොරියක් යවනවා. ඒ ණය අනුව වෙළඳ භාණ්ඩවලට පමණක් සුදුරු, මාදුරු, උළුහාල්, සීනි, මිරිස් හා පිටි ආදියට පමණක් සීමා වෙලයි අපි ඒ ව්‍යාපාරය කරගෙන ගියේ. අන්තිමට යල් කන්නයේ නැත්නම් මාස් කන්නයේ කුඹුරු වලින් වී ටික එනවිට ඒවා ගන්න අපට මුදල් තිබුණේ නැහැ. ඒ නිසා අපි මහජන බැංකුවට ගිහින් සල්ලි ඉල්ලා සිටිනවා. අපිට වෙළඳ ණයක් දෙනවා ඒ ධාන්‍ය ගොවියාගෙන් ගැනීම සඳහා.

අවාසනාවන්ත ඉරණම කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මුදල වැය කර අපි බඩු ගන්න යන අවස්ථාවේ දී ඇතැම්විට ඒ මුදලින් රුපියල් 10,700 ක් පමණ මුදලක් මාසෙ අන්තිමට තොව්වියාගම ප්‍රාදේශිකයේ සේවකයින්ට පඩිනඩි ගෙවීමසඳහා යෙදවීමටත් සිදු වුණා. අන්න ඒ නිසා අපි සාකච්ඡාවක් පවත්වා, පඩි නඩි ගෙවීම හදිසි කාරණයක් නිසා, අර වෙළඳ ණයෙන් කොටසකින් පඩිනඩි පවා ගෙව්වා. ඒ නිසා අපි අධ්‍යක්ෂක මණ්ඩලය කැඳවා කිව්වා මේක මේ විධියට කරන්න බැහැ, ඒ නිසා අපි යම්කිසි වැඩපිළිවෙලක් ඇති කරන්න ඕනෑ කියා. 1971 කැරැල්ල ඔන්න මෙන්න කියා තිබෙන අවස්ථාවේදී අපි තීරණයක් ගත්තා. මම සභාපති හැටියට කිව්වා, තමුන්නාන්සේලා භය නම් මම මේ කර්තව්‍යයට සූදානම්; අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොහොම හරි මුදල් හදල් සොයා ගන්න ඕනෑ සමුපකාර සමිති දියුණු කරන්නට කියා. එදා මම තුවක්කු හතක් ලොරියක දමා ගෙන ගම්වලට ගිහින් සමුපකාර මට්ටමෙන් තරගකාරී අන්දමට මිරිස් මිලදී ගත්තා. එසේ කටයුතු කර නොච්චියාගම සමුපකාර සමිතියෙන් මම ඉවත් වන අවස්ථාව වන විට එම සමිතියට රුපියල් ලක්ෂ තුනකට වැඩි මුදලක් ඉතිරි කර දී තිබුණා. අන්න ඒ විධියට යම්කිසි තරඟකාරී තත්ත්වයකට මුහුණ දීමට හැකිවන අන්දමට, අප දැන් සිටම ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්න ඕනෑ. සමුපකාර සමිති සැමදාම පාරිභෝගික භාණ්ඩ අලෙවියට පමණක් සීමා කරන්න තරකයි.

මතුගම ගරු මන්ත්‍රීතුමා (අතිල් මුණසිංහ මහතා) කී අන්දමට නෝර්වේ, ස්වීඩන්, ඩෙන්මාර්ක්, එංගලන්තය වාගේ රටවල්වල කරන්නා වාගේ නිෂ්පාදන අංශයටත් යන්නට බැරි මන්ද ? පෞද්ගලික අංශය හා තරගයට බඩු මිලදී ගැනීමට සමුපකාර සමිතිවලට මුදල් දෙන්නට අපහසු ඇයි ? මූලික තර්කය වෙන්නේ මුදල් නැතිකමයි. මහජන බංකුවෙන් මේ සෙත සහ ශාන්තිය අපට ලැබෙයයි කවදාවත් බලාපොරොත්තු වෙන්න බැහැ. බැංකු සමග ගණුදෙනු කරන පුද්ගලයකු වශයෙන් මට අත්දැකීම් රාශියක් තිබෙන නිසයි මම එසේ කියන්නේ. ඒ අය දෙන්නේ සුළු ණයක් පමණයි. අන්තිමට බඩු ගන්නා අවස්ථාව වන කොට, තවත් ණයක් ගන්න ඕනෑ වන විට ඒ අය කියනවා, කලින් දුන් ණයෙන් කොටසක් කපා ගෙන තමයි ඉතුරු ණය දෙන්නේ කියා. අන්න ඒ වාගේ ප්‍රශ්න රාශියකට අපි මුහුණ දුන්නා. එම නිසා, මේ සම්බන්ධයෙන් ඇමතිතුමා විශේෂ නිර්දේශයක් කරනවා ඇත කියා අපි බලාපොරොත්තු වෙනවා.

ගිණුම් අංශය පිළිබඳවත් වචනයක් කියන්න ඕනෑ. 1970 සමුපකාර සමිති ප්‍රතිසංවිධානය කරන අවස්ථාවෙ සමුපකාර සමිතිවල ගිණුම් අංශයක් තිබුණේ නැහැ. එම අවස්ථාවේදී ගිණුම් අංශයක් නැති නිසා පවත්වා ගෙන යන්නට බැරි සමිති සම්බන්ධයෙන් ඇවරකරුවෙක් පත් කළා, එම සමිතිවල තියෙන ණය සහ වත්කම් පිළිබඳව පරීක්ෂණයක් කර අපට වාර්තා කරන්නටය කියා. අද වනතුරුත් ඇතැම් සමුපකාර සමිතිවලින් මිලදී ගත් වී වලට ගොවීන්ට මුදල් ගෙවා නැහැ. ඒ ගොවීන්ට ගෙවන්නට ඇති ණය පිළිබඳව ඇවරකරු අද වනතුරුත් වාර්තා කර නැහැ. මොකද ? පොත්පත්වල ඒ පිළිබඳව සටහනක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභ්‍යන්තර ඔඩිට් ක්‍රමයක් තිබෙනවා. මම දන්නවා, ගැහැණු ළමයෙක් සිටියා අපේ මහ සමුපකාර සමිතියේ. ඒ ළමයා, අධ්‍යක්ෂ මණ්ඩලයට ඇවිත් හැම තිස්සේම කියන්නෙ මේ මාසයෙ ඉඳලා අපට ලාබයි කියලයි. නමුත් මාසය අන්තිමට පඩිනඩි ගෙවන්න විධියක් නැහැ. මොකද ? අභ්‍යන්තර ඔඩිට් ක්‍රමය සම්පූර්ණයෙන්ම වැරදියි. මෙය ප්‍රතිසංවිධානය කරන්න ඕනෑ. එම නිසා සමුපකාර සමිතිවල ගිණුම් අංශය ඉතා වැදගත් වන බව මතක් කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අනුරාධපුර සමුපකාර සමිතිය ගැන කියන විට එය ප්‍රතිසංවිධනය කළ යුතු බව මතක් කරන්න ඕනෑ. මොකද ? මෙවර පොසොන් උත්සව කාලයෙ සමුපකාර සමිතියට අයත් පෙට්රල් ගබඩාවල පෙට්රල් සහ ඩීසල් තිබුණෙ නැහැ. මේවා සම්බන්ධයෙන් ජනතාවට අපි වගකියන්න ඕනෑ. පෞද්ගලික අංශයට අයත්, පෙරේරා මහත්මයාගෙ ෂෙඩ් එකෙන් පෙට්රල් සහ ඩීසල් පොසොන් උත්සව කාලයේදී බෙදා දුන්නා. නමුත් සමුපකාර සමිතියට අයත් ෂෙඩ් එකේ දුන්නෙ නැහැ. මෙන්න මේ වාගේ තත්ත්වයකුයි තිබුණේ. එමනිසා අනුරාධපුර විවිධ සේවා සමුපකාර සමිතියේ කටයුතු සම්බන්ධයෙන් අවධානය යොමු කර, එහි කටයුතු ගැන පරීක්ෂණයක් පවත්වන්නය කියා බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා (නියෝජ්‍ය පේෂකර්ම ඇමතිතුමා)**

*(திரு. ஆர். எம். தர்மதாச பண்டா—புடைவைக் கைத் தொழில் பிரதி அமைச்சர்)*

(Mr. R. M. Dharmadasa Banda–Deputy Minister of Textile Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර සමිති (සංශෝධන) පනත ගැන කතා කරන විට පළමුවෙන්ම මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. පසුගිය කලබලකාරී අවස්ථාවේදී සමුපකාර ව්‍යාපාරයේ අගය ඉතාම හොඳින් කැපී පෙනුණා. ඒ අවස්ථාවේදී ජනතාවට ඕනෑ ආහාර ද්‍රව්‍ය බෙදා දීම සඳහා ඉතා මහන්සියෙන්, ඕනෑකමින් දිවා රෑ නොතකා වැඩ කළ ඇමතිතුමා ඇතුළු එම අමාත්‍යාංශයේ සියලු දෙනාටත්, සමුපකාර දෙපාර්තමේන්තුවේ සියලු දෙනාටත්, විශේෂයෙන්ම සමුපකාර සමිතිවල නිලධාරීන් ඇතුළු සේවකයන්ටත්, අපේ කෘතඥතාව පළ කර සිටින්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා ඉතිහාසයේ සමුපකාර ව්‍යාපාරය ආරම්භ වීමටත් ප්‍රධාන වශයෙන් හේතු වුණේ මේ වාගේ බඩු බෙදා හැරීමේදී ඇති වුණු අපහසු තාවයක්. විශේෂයෙන්ම දෙවන ලෝක මහා යුද්ධයෙන් පසුව බඩු බෙදා හැරීම විධිමත් කරන්න වුවමනා කර තිබුණා. ඒ සඳහා උපයෝගී කර ගත්තේ සමුපකාර ව්‍යාපාරයයි. එදා සිට ඉතා හොඳින් දියුණු වෙමින් ආ සමුපකාර ව්‍යාපාරය නොයෙක් අවස්ථාවලදී නොයෙක් ආකාරයට වෙනස්වීම් වලට මුහුණ දී අද තත්ත්වයට ඇවිත් තිබෙනවා. දෙවන ලෝක මහා යුද්ධයේන් පසුව මේ රටේ ඇති වුණු නොයෙක් කරදරකාරී තත්ත්ව වලදීත්, 1958 දී මෙන්ම 1971 දීත්, අපේ රටේ ජනතාවට පිහිට වුණේ සමුපකාර සමිති බව අපි දන්නවා. මෙයට පසුවත් මේ රටේ ජනතාවට වුවමනා කරන බඩුබාහිරාදිය ලබා ගැනීමට පිහිට වීමට ඇති එකම සංවිධානය සමුපකාර ව්‍යාපාරය බවට අපට කිසිම සැකයක් නැහැ. එහෙම නම් මේ සමුපකාර ව්‍යාපාරය හරියාකාරව සංවිධානය කරගෙන තබා ගත්තොත් එයින් විශේෂයේන්ම ප්‍රයෝජනයක් ලැබෙන්නේ අහිංසක දුප්පත් රටවාසීන්ටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ගෙනැවිත් තිබෙන මේ සංශෝධන ගැන බලන විට ඇත්ත වශයෙන්ම මේවා ගෙනෙන්නට තිබුණේ මීට ටිකක් කලින් බව අපට පෙනෙනවා. නමුත් ප්‍රමාද වී හෝ මෙම සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන අපි ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ සමගම, මේ සංශෝධන පනත් කෙටුම්පතට ඇතුලත් කර තිබෙන ඇතැම් වගන්ති කියවන විට අද වාගේ අවස්ථාවකට මේ පනත ටිකක් සැර වැඩියිදෝ කියලත් මට හිතෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර ව්‍යාපාරය විශේෂයෙන්ම කැපී පෙනුණු අවදිය තමයි 1970-77 කාලය ;බඩු නොතිබුණු කාලය. තිබුණු බඩු ටික—ආහාර, රෙදිපිළි පමණක් නොවෙයි උදැල්ල පවා—බෙදා හරින්නට එදා සමුපකාරය වුවමනා වුණා. සියලුම ජනතාව සමුපකාර කඩ අසල පෝලිම් ගැස්වූ යුගය තමයි 1970-77 කාලය. ඒ යුගයේදී සමුපකාරය ඉතාම වැදගත් ස්ථානයක් දැරුවා. නමුත් 1977 න් පසු මෙම රජය අනුගමනය කරන විවෘත වෙළඳ ක්‍රමය නිසා අද සමුපකාරයට සිද්ධ වී තිබෙනවා රජයේ ආයතන, සංස්ථා සහ පෞද්ගලික ආයතන සමග තරගකාරී තත්ත්වයක් පවත්වාගෙන යන්නට. ඒ තරඟකාරී තත්ත්වය ඇති වූ අවස්ථාවේදී, ඒ කියන්නේ 1977, 1978 කාලයේදී සමුපකාර ව්‍යාපාරය ගැන අපි මීට වඩා පුළුල් වශයෙන් කල්පනා කළ යුතුව තිබුණා. අපි එලෙස කල්පනා කරන්නට ප්‍රමාද වුණා. ඒ නිසාම සමුපකාර සමිති දුර්වල තත්ත්වයකට පත්වුණා. මේ කාලය තුළ සමුපකාර වල ආදයම් තත්ත්වය අඩු වුණේ මක්නිසාද ? එදා ඉඳලම ප්‍රතිපත්තියක් වශයෙන් ඉතාම සුළු ලාභ මට්ටමක් ඇතිවයි සමුපකාර සමිති පවත්වා ගෙන ගියේ. තරඟකාරී තත්ත්වය ඇතිවූවාට පසුවත් සමුපකාර සමිතිවලට ලාභ මට්ටම ඒ ආකාරයෙන්ම තබා ගෙන පුළුල් සේවයක් දෙන්නට සිද්ධ වුණා. නමුත් බොහොමයක් සමුපකාර සමිතිවලට එය කළ නොහැකි වුණා. හොඳ වෙළඳාමක් ඇති ප්‍රාදේශිකයක් වුණත් අද එක නැනැත්තෙකුට පමණක්—කළමණාකරුට පමණක්—ගෙන යන්නට සිද්ධ වී තිබෙනවා. ඔහුගේ සහායට තවත් කෙනෙකු ගත්තොත් ඔහුට පඩිනඩි ගෙවන්නට බැහැ, ලාභ මට්ටම ඉතාම සුළු නිසා. ඒ ක්‍රමය තමයි තවමත් තිබෙන්නේ. එම නිසා සමුපකාර සමිතිවලට ඔළුව උස්සා ගන්නට තවමත් අමාරු වී තිබෙනවා. අර පරණ තිබුණු ආදයම් තත්ත්වය යටතේ පරන ප්‍රතිපත්තිය යටතේ සමුපකාර සමිති තවමත් ඒ විධියටම පවත්වාගෙන යනවා.

මේ සංශෝධන පනත යටතේ සමුපකාර සමිතිවලවලට නියම හැඩරුවක් දෙන්නට පියවර ගෙන තිබීම ගැන මා සතුටු වෙනවා. සමුපකාර සමිතිවල ගණන් හිලව් හරියාකාරව තබා ගැනීමට උපකාරී



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා]

වන විධිවිධාන සලස්වා තිබෙනවා. අද වුණත් ගණන් හිලව් තබා ගන්නට නම් අමාරුවක් නැහැ. දැනට ව්‍යාප්ත කර තිබෙන ක්‍රමය අනුව එෆ් 28 පෝර්මය හරියාකාරව පිරෙව්වොත් සමුපකාර සමිතියක යථා තත්ත්වය බලා ගන්නට පුළුවනි. එෆ් 28 පෝර්මය පුරවන්නට බැහැ, පොත් ටික ඔක්කොම අංග සම්පූර්ණ නැත්නම්. පොත් ටික අංග සම්පූර්ණ වන තෙක් එෆ් 28 පෝර්මය පුරවන්නට බැහැ. ඒ පෝර්මය පිරෙව්වොත් සමිතියේ සම්පූර්ණ තත්ත්වයම දැනගන්නට පුළුවන් වෙනවා. ලාභද, පාඩුද, කොහොමද මේක පවත්වාගෙන ගිහින් තිබෙන්නෙ, ගිය අවුරුද්දට වැඩිය මේ අවුරුද්ද හොඳද, නරකද, වෙළඳාම අඩු වෙලාද, වැඩි වෙලාද යනාදි වශයෙන් මාසයෙන් මාසයට තත්ත්වය දැනගන්නට පුළුවන් වෙනවා. මේ සංශෝධනවලින් ඒ තත්ත්වය තවත් හොඳ වෙයි. ඕනෑම ආයතනයක වැදගත්ම දෙය තමයි ගණන් හිලව් හරියාකාර ව තබා ගැනීම. ඒ අනුව නව සංශෝධනය ඉතාම යෝග්‍ය එකක් හැටියට අපට සලකන්නට පුළුවනි.

ඒ සමගම, මා කලින් කිව්වා වාගේ සමුපකාරවල අධ්‍යක්ෂ මහත්වරුනුත් සේවක මහත්වරුනුත් පාලනය කිරීමට, දැඩි ලෙස පාලනය කිරීමට වගන්ති කීපයක් මේ පනත් කෙටුම්පතට ඇතුළු කර තිබෙනවා. මා ඒකට විරුද්ධ වෙනවා නෙවෙයි. නමුත් මේවා ක්‍රියාත්මක කරීමේදී ප්‍රවේසම් විය යුතු බවයි මා කියන්නේ. අවුරුදු දහයක් දක්වා සිර දඬුවම් පැමිණ විය හැකි සමහර වගන්ති තිබෙනවා. අපරාධ නඩු විධාන සංග්‍රහයේ මොනවා සඳහන් වුනත් මේ දඬුවම පමුණුවන්නට පුළුවන්ය කියනවා. ඒ විධියට ඉතාම බලපතල ලෙස මේ වගන්ති සකස් කර තිබෙනවා. සමුපකාර ව්‍යාපාරය තුළ හොරුන් සිටියා නම් අන්න ඒ හොරුන්ට මේ වාගේ දඬුවම් දුන්නාට කමක් නැහැ. කොරියාව වැනි සමහර රටවල ඒ රටවලට සමුපකාර ව්‍යාපාරය ඉතාම වුවමනා කළ අවස්ථාවලදී—දැන් නම් එහෙම වුවමනාවක් නැහැ—සමුපකාර සේවකයෙකු යම් හොරකමක් කළා නම් ඔහුගේ මුළු දේපළම රාජසන්තක කළ බව මම දන්නවා. මේ රටේ තවමත් එවැනි නීති රීති පනවා නැහැ. නමුත් මේ නීති වුණත් ක්‍රියාත්මක කිරීමේදී අපි ප්‍රවේසම් විය යුතුයි.

46 වන වගන්තිය යටතේ පවත්වන පරීක්ෂණ ගැන අප සියලු දෙනාම දන්නවා. 46 වන වගන්තියට යටත් වුණත් සමහර අවස්ථාවලදී ඉතාම කණගාටුදායක විධියට සිදු වන වැරදි තිබෙනවා. ඉතාම සීමා සහිත සියයට ගණනක් එහා මෙහා වීමෙන් වූ වරදක් වෙන්නට පුළුවනි. මා දොස් කියනවා නොවෙයි. නමුත් මේවා ක්‍රියාත්මක කිරීමේදී අපි ප්‍රවේසම් වෙන්න ඕනෑ. සාධාරණ තීන්දු වලට බසින්නට ඕනෑ. මක්නිසාද? මේ සංශෝධන පනත අනුව ඇමතිතුමාට තිබුණු බලතල සම්පූර්ණයෙන්ම වාගේ රෙජිස්ට්‍රාර්වරයාට නැත්නම් කොමසාරිස්වරයාට පවරා දී තිබෙන නිසයි. මේ බලතල ක්‍රියාත්මක කරන විට කොමසාරිස්තුමා,නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන් සමුපකාර පරීක්ෂකවරුන් ආදී සියලු දෙනාම එකතු වෙලයි ඒ කටයුතු කරන්නෙ. ඔය අතරතුර මේ නීති රීති වෙනුවට තමන්ට ඕනෑ කරන නීතිරීති ක්‍රියාත්මක කරන එක්කෙනෙක්වත් සිටියොත් අන්න එතෙන්දි තමයි අප කවුරුත්වත් නොදැනම සමුපකාර සේවකයන් අමාරුවෙ වැටෙන්නෙ.

එවැයි කතන්දර කීපයක් මම දන්නවා. ඒ නිසයි මම කියන්නෙ අපි ප්‍රවේසම් විය යුතුය කියා. මේ නීති කරන නොවෙයි. මම දන්නවා එක සමිතියක 46 (1) වගන්තිය යටතේ පරීක්ෂණ පවත්වා රුපියල් 700 ක අඩුවක් තිබෙනවාය කියා. අවුරුදු 24 ක සේවයක් තිබුණ තොග කළමණාකරුවෙකු වහාම නෙරපන්නය කියා නියෝගයක් දුන් බව. මම හිතන හැටියට රාජ්‍ය සේවයේවත් ඒ විධියේ දෙයක් කරන්නේ නැහැ. මොහු අවුරුදු 24 ක සේවයක් ඇති කෙනෙක්. ඒ තොග ගබඩාවෙ මාසික වෙළඳාම ලක්ෂ 25 ක් පමණ වෙනවා. ඒ කියන්නෙ දවසකට ලක්ෂයක පමණ තොග වෙළඳාමක් තිබෙන ගබඩාවක්. මේ රුපියල් හත්සිය ගණනක අපනයක් හෝ අඩුවක් හෝ මොකක් හෝ අඩපාඩුවක් තිබෙනවාය නිසා මිනිහා සේවයෙන් පන්නන්න තීරණය කළා. ඊළඟට මෙතැනට එන ප්‍රශ්නය මොකක්ද? එයා සේවයෙන් පැන්නුවොත් එයාට ගෙදර යන්න පුළුවන්. නමුත් ලක්ෂ 25 ක තොග වෙළඳාමක් අර වාගේ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ඊළඟට කෙනෙක්තෝරා ගැනීම පුහුණු කර ගැනීම ප්‍රශ්නයක් වෙනවා. අන්න එවැනි අවස්ථාවකදී ඒ ස්ථානයට නරක මිනිහෙක් ආවොත් අර මුළු සමිතියම ඉවරයි. ඒ නිසයි මම කිව්වෙ මේ කාරණා ගැන ටිකක් ප්‍රවේසම් විය යුතුය කියා.

**නියෝජ්‍ය කථානායකතුමා,**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order please ! The Hon. Minister has to wind up and two more members are listed to speak.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
*(திரு. ஆர். எம். தர்மதாச பண்டா)*
(Mr. R. M. Dharmadasa Banda)

I will take only 5 minutes more.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මෙතෙන්දි ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළා සමුපකාර සේවකයන්ගේ පඩි වැඩි වුණේ නැහැ කියා. අවුරුද්දක් පාසා රජයේ සේවකයන්ට හතර පස්වතාවක්ම පඩි වැඩි කර තිබෙනවා. ඒ විධියේ පඩි වැඩි කිරීම් තුනක් රජයේ සේවකයන්ට කළාට පස්සෙ මගේ ආසනයේ සමුපකාර සමිතියක සේවකයන් ඉතාමත් දරුණු වුණා, එක වරක්වත් ඒ අයට පඩි වැඩිවීමක් වුනේ නැහැ කියා. එහි ඉතාමත් නරක සිද්ධියක් වුණා. ඊට පස්සෙ—රජයේ සේවකයන්ට රුපියල් 206 ක පඩි වැඩිවීමක් වුණාට පස්සෙ—ඒ සමුපකාර සමිතියේ සේවකයන්ට රුපියල් සියයක පඩි වැඩිවීමක් කරන්න ඒ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළා. කියන්න කනගාටුයි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් තීරණය කර මහ සභාවෙන් අනුමත කළා විතරයි දෙපාර්තමේන්තුවෙන් ලියුමක් එනවා කාගේ අවසරයක් ඇතිවද පඩි වැඩි කෙළේ කියා. මෙහෙම දේවලුත් සිද්ධ වෙනවා. එතැන සිටින නිලධාරීන්ගෙන් එකකෙනෙක් වෙන්න පුළුවන් මේ වැරැද්ද කෙළේ. ඒ නිසයි මම කියන්නෙ අපි ප්‍රවේසම් වෙන්න ඕනැය කියා.

ඒ සමුපකාර සමිතියම තීරණය කළා ටෙන්ඩර් කැඳවා ලොරියක් විකුණන්න. මහ සභාව අනුමත කර තිබුණේ රුපියල් අසූදහක ඉහළ ටෙන්ඩරයකට දෙන්නයි. නමුත් ටෙන්ඩර් කැඳවීමේදී වැඩිම ටෙන්ඩරය ලැබුණේ රුපියල් 65,000 ටයි. ඒ ගණනට දුන්නෙ නැහැ. ඊට පසු ලොරි මිල ගණන් පිළිබඳව ලියුමක් ලැබී ඒ අනුව රුපියල් 1,05,000 කට ඉල්ලූ කෙනෙකුට ලොරිය විකුණා තිබෙනවා. මොකක්ද එහි ඇති අපරාධය? මෙන්න අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින හත් දෙනාටම ලියුම් ඇවිල්ල තිබෙනවා වැරැද්දක් කළාය කියා. ඒ නිසා අපි මේ බලතල පාර්ලිමේන්තුවෙන් දුන්නත් මේවා ක්‍රියාත්මක කරන විට සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය සඳහා කටයුතු කරනවා නම් ඔය මම කිව්වා වාගේ තීරණ නිලධාරීන් නොගන්නා බවට අප තුළ පිළිගැනීමක් තිබෙන්න ඕනෑ.

විශේෂයෙන්ම සමුපකාර ව්‍යාපාරය කියන්නේ ඉතාම සුළු පඩියක් දීලා විශාල සේවයක් ලබාගන්නා ව්‍යාපාරයකටයි. නමුත් සැම විටම කවුරුත් සොයන්නේ ඒ සේවකයන්ගේ වැරදියි. වැරදි කරන අය කීප දෙනෙක් ඉන්නවා. ඒ අය අල්ලා ගැනීමට මෙය කරමු.

මෙතෙන්දි කියැවුණා සමුපකාරයට දේශපාලන ඇඟිලි ගැසීම් එපාය කියා. අපි දේශපාලනඥයන් වශයෙන් නොව සමුකාරිකයන් වශයෙන් අපට දෙන්න පුළුවන් උපරිම උදව් අවවාද අනුශාසනා අපට දෙන්න පුළුවන් වුණොත් අපි ඒ උදව් උපකාර කරන විට එය දේශපාලන ඇඟිලි ගැසීමක්ය කියා මා හිතන්නෙ නැහැ. ඒ ආයතනයේ දියුණුවට සමුපකාර ව්‍යාපාරිකයන් වශයෙන් විශ්‍රාම ගිය අයට පවා සේවයක් කරන්න පුළුවනි. දේශපාලනයේ සිටියාය කියා සමුපකාරයෙන් අයින් වෙන්න ඕනෑ නැහැ. දේශපාලන ඇඟිලි ගැසීම් කියන්නේ තමන්ගේ දේශපාලන අදහස් ව්‍යාප්ත කිරීමට යෑමයි. අපේ රජයේ සිටින මන්ත්‍රීවරු සියලු දෙනාම වග කියනවා අප කිසි කෙනෙක් අපේ දේශපාලන අදහස් අපේ ආසනවල සමුපකාර සමිතිවලින් ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන්නේ නැති බවට. ඒ වගකීම අපි බාර ගන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි දැන් මේ සමුපකාරයට ඇඟිලි ගහන්නේ එහි දියුණුව හා උන්නතිය සඳහා පමණයි. ඒ නිසා ගරු ඇමතිතුමාට මා යෝජනා කරනවා මේවා ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික්ක වශයෙන් නැත්නම් උප කොමසාරිස් කාර්යාල වශයෙන් උපදේශක මණ්ඩල පත් කරන්නය කියා. මොකද, කොමිටි විසුරුවා හරින්න පුළුවන්; මාස 6 කට තහනම් කරන්න පුළුවන්; එමෙන්ම සේවකයින් ගෙදර යවන්න පුළුවන්; අවුරුදු 10 කට හිරේ යවන්නත් පුළුවන්. ඒ නිසා අපි ප්‍රවේශම් වන්නට ඕනෑ විශේෂයෙන්ම සමුපකාර කොමිෂන් සභාවෙන් මේවා ක්‍රියාත්මක කරන විට. එහින් දුර්වල තැන් නැතිවා නොවෙයි. සමහර විට සමුපකාර කොමිෂන් සභාවෙන් දුන් තීරණ සමුපකාර සමිති මඟින් නවමත් ක්‍රියාත්ම කර නැහැ. ඇතැම්විට සමුපකාර කොමිෂන් සභාව තීරණ ගන්නෙත් සමිතියෙන් අහලා නොවෙයි. හුඟක් අවස්ථාවල් ගැන මම දන්නවා. හොරකම් කළ අය අස් කර තිබෙනවා නම් fපයිල් එක ගෙන්වාගෙන එය ආපසු යවනවා පඩිත් සමග ඔහු නැවත සේවයට ගන්න කියා. එවැනි අවස්ථා හුඟක් තිබෙනවා. ඕනෑ නම්, නම් ගම් කියන්නම්. එවැනි තීරණ ගත් අවස්ථා තිබෙනවා. fපයිල් එක එවන්න කී විට එය යවනවා. ආපසු තීරණය ගත්තේ මොකක්ද? "ඒ සේවකයා ආපසු ගනිත්" කියලයි. සමිතියෙන් අහන්නේ නැහැ "එයා අස් කළේ ඇයි?" කියා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධන ඉතා ප්‍රවේශමෙන් ක්‍රියාත්මක කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

තවත් එක ඉල්ලීමක් කරන්න ඕනෑ. අපි සමුපකාර ව්‍යාපාරය තුළින් මේ රටේ බැංකුවක් ගොඩනැඟුවා. ඊළඟට ඒ බැංකුව මහජන බැංකුව වුණා. දැන් එය සමුපකාර ව්‍යාපාරයට නැහැ. ඒ නිසා නැවත අපේ සමුපකාර ව්‍යාපාරය සඳහා බැංකුවක් ගොඩනඟා ගන්නට අපට බැරිද? මම හිතනවා පුළුවන් කියා. විවිධ සේවා සමුපකාර සමිති තුන්සිය ගණනක් තිබෙනවා. ධීවර සමිති තිබෙනවා; ගොවි සමිති තිබෙනවා; ණය දෙන සමිති තිබෙනවා. ඔය ආදි වශයෙන් ඕනෑ තරම් සමිති තිබෙනවා. ඒ සැම එකක්ම ඒකරාශි කර ගෙන බැංකුවක් ගොඩනඟා ගන්නට බැරිකමක් අපට නැහැ. මීට වඩා අමාරු කාලවලදී එදා එක් දහස් නවසිය හතළිස් ගණන්වල හා පනස් ගණන්වල සිටි සමුපකාර ව්‍යාපාරිකයන් සමුපකාර බැංකුවක් ගොඩනඟා ගත්තේ අමාරුවෙන්. ඒ දවස්වල මුළු පලාතකට තිබුණේ එකයි. අද නම් ගමෙන් ගමටම තිබෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා සමුපකාරයට වෙනම බැංකුවක් පිහිටුවා ගත යුතුයි කියා. එමෙන්ම සමුපකාර තොග වෙළඳ ආයතනයකුත් ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order please ! You must wind up now.

**ආර්. එම්. ධර්මදාස බණ්ඩා මහතා**
*(திரு. ஆர். எம். தர்மதாச பண்டா)*
(Mr. R. M. Dharmadasa Banda)

Just 2 minutes more.

තොග වෙළඳ ආයතනයක් අපි පිහිටුවා ගත්තා. ඒ සමුපකාර තොග වෙළඳ ආයතනය. සීඩබ්ලිව්ඊ එක. දැන් ඒක සමුපකාරයට නැහැ. ඒ නිසා අපි කල්පනා කරනවා නම් තොග වෙළඳ ආයතනයක් සමුපකාරය සඳහා පිහිටුවා ගැනීමට මේක හොඳ කාලයක්. ඒ සඳහා මේ අවස්ථාව ඉතාමත්ම කාලෝචිතයි. එදා ඇති කළ තොග වෙළඳ ආයතනය පසුගිය කාලයේදී පිහිට වුණා. අතීතයේදීත් පිහිට වී තිබෙනවා. අනාගතයේදී එය මේ රටේ තොග වෙළඳ ව්‍යාපාරයේ පතාක යෝධයෙක් වන බවට සැකයක් නැහැ.

සමුපකාර ව්‍යාපාරයටත් තවත් තොග වෙළඳ ආයතනයක් අවශ්‍යයි. මම එය යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරනවා. කොමසාරිස්තුමාට මා මේ අවස්ථාවේදී ආරාධනා කරනවා තොග වෙළඳ ආයතනයක් පිහිටුවන්නය කියා. දැන් හොඳම අවස්ථාව. සැම නගරයකම විශාල වශයෙන් සිටි ව්‍යාරිකයන් ඒවා නැවත ආරම්භ කිරීම ප්‍රමාද වේවි. එහෙනම් අද සමුපකාර ව්‍යාපාරයට සිදු වී තිබෙනවා, සාමාන්‍ය සිල්ලර වෙළෙඳුන්ට බඩු සැපයීමේ තොග වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන්නට. කරුණාකර එය ආරම්භ කරන්නය කියා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් තව කරුණක් කියන්න කැමතියි. මෙය ක්‍රියාත්මක කිරීම නිලධාරි මහත්වරුන්ට භාරදී තිබෙන එක ඇත්තයි. නමුත් කොමසාරිස්තුමා අපට වග කියන්න ඕනෑ නිලධාරි මහත්වරුන් මෙයින් අයුතු ප්‍රයෝජන නොගන්නා බවට. නිලධාරීන් අයුතු ප්‍රයෝජන නොගන්නා ලෙසට එතුමා කටයුතු කරයි කියා මා විශ්වාස කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Hon. District Minister for Matara will now speak and he will be followed by the hon. Member for Kotmale.

අ. භා. 5.28

**කේ. අබේවික්‍රම මහතා (මාතර දිසා ඇමතිතුමා)**
*(திரு. கே. அபேவிக்ரம—மாத்தறை மாவட்ட அமைச்சர்)*
(Mr. K. Abeywickrema–District Minister, Matara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර සමිති (සංශෝධන) පනත ඉදිරිපත් කර විවාද වන මේ අවස්ථාවේදී ඉතාමත්ම කෙටියෙන් වචන ස්වල්පයක් කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා. සමුපකාර ව්‍යාපාරය මේ රටේ ජනතාවට කොයි තරම් සම්බන්ධද, සමීපද කියන එක පැහැදිලි වෙනවා, ඊයේ සිට මේ දක්වා අපේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් විශාල පිරිසක් මෙයට සහභාගි වීමෙන්ම. මම බොහොම කෘතඥ වෙනවා මේ උතුම් ව්‍යාපාරයට පසුගිය දිනවල සිදු වූ ආහාර බෙදදීමේ අවස්ථාවේදී මේ ව්‍යාපාරය තුළින් වෙළඳ අමාත්‍යාංශයටත්, ආහාර දෙපාර්තමේන්තුවටත්, රටපුරා ක්‍රමවත්ව එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට පුළුවන් වුණාද කියන එක පැහැදිලි වුණා. මම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, මේ රජය 1977 පත් වූ කාලයේ සිට මේ දක්වා විශාල වෙහෙසක් හා මහන්සියක් දරා තිබෙනවා මේ සමුපකාර ව්‍යාපාරය පොදු ජන ස්වාධීන ව්‍යාපාරයක් බවට පත් කරන්නට. මම කලින් තිබුණු රජයට චෝදනා කරනවා නොවෙයි. නමුත් මතුගම මහජන මන්ත්‍රීතුමා කලින් සඳහන් කළ හැටියට 1970 සිට 1977 දක්වා යුගයේදී සමුපකාර ව්‍යාපාරය දේශපාලන ඇඟිලි ගැසීම් නිසා සැහෙන ප්‍රමාණයකින් දුර්වල තත්ත්වයකට පත් වුණු බව කියන්නට ඕනෑ. එය හැම දෙනාම දන්නා කරුණක් නිසා මම ඒ ගැන දීර්ඝ වශයෙන් කතා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

මේ ව්‍යාපාරයට හොඳ නායකත්වයක් දෙන්නට ඕනෑ බව අපි පිළිගන්නට ඕනෑ. සමුපකාර ව්‍යාපාරය ගැන හොඳ අවබෝධයක් තිබෙන පළපුරුද්දක් තිබෙන ඊට නායකත්වයක් දෙන්නට පුළුවන් දේශපාලනඥයන් ලංකාවේ සිටිනවා. සාමාජිකයන් හැටියට හෝ පාරිභෝගිකයන් හැටියට හෝ මේ ව්‍යාපාරයට නායකත්වය දෙන්නට ඒ අයට පුළුවන්කම තිබෙනවා. නමුත් සමුපකාර ව්‍යාපාරය යම්කිසි ප්‍රතිපත්ති මාලාවක් උඩයි සංවිධානය වී තිබෙන්නේ. ඒ නිසා, ඒ ප්‍රතිපත්ති ගැන අවබෝධයක් ඇතුව, මේ ව්‍යාපාරයට අපි නායකත්වය දෙන්නට ඕනෑ, සහයෝගය දෙන්නට ඕනෑ, මෙය සංවිධානය කරන්නට ඕනෑ බව මම මතක් කරනවා.

මේ ගරු සභාවේදී මීට අදාළ ප්‍රශ්න රාශියක් ගැන සාකච්ඡා වුණා. සේවකයන් ගැන සාකච්ඡා වුණා. බැංකු පහසුකම් ගැන සාකච්ඡා වුණා, වෙනත් නොයෙක් අඩුපාඩුකම් ගැන සාකච්ඡා වුණා. මේ ප්‍රශ්න හුඟාක් දුරට නිරාකරණය කර ගැනීම සඳහා ඊට විශාල නායකත්වයක් දෙන්නට මේ පාර්ලිමේන්තුවට, මේ සභාවට පුළුවන්කම තිබෙනවායයි මම කියනවා. හොඳ නායකත්වයක් දීලා හොඳ කළමනාකාරිත්වයක් ඇතුව යම්කිසි සමුපකාර සංගමයක්, සමිතියක්, සංවිධානයක් ක්‍රියාත්මක වෙනවා නම් කවදාවත් එය කඩා වැටෙන්නට බැරි බව මම විශේෂයෙන් ප්‍රකාශ කරන්නට කැමතියි.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අන්දමට මගේ කොට්ඨාශයේ සමුපකාර තේ සමිතියක් තිබෙනවා. කිසිම ප්‍රශ්නයක් නැතුව ඒ සමිතිය බොහෝම සාර්ථක අන්දමට ක්‍රියාත්මක කරන්නට අපට පුළුවන් වී තිබෙනවා. අද සමුපකාරය ගැන සඳහන් කරන විට පාරිභෝගික ද්‍රව්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. අබේවික්‍රම මහතා]

ගැන විතරක් සාකච්ඡා කරන්නට හෝ කටයුතු කරන්නට හෝ අපට පුළුවන්කමක් නැහැ. රටේ ජනතාවගේ අවශ්‍යතාවන් මොනවාද, ඒ අවශ්‍ය තාවන් හා ඕනෑ කම්වලට ගැළපෙන හැටියට පොදු අදහස් ඇතිව මේ ව්‍යාපාරය සංවිධානය කරන්නට ඕනෑය කියන කාරණය මම පැහැදිලිව මතක් කරනවා.

මේ රජය පත් වුණු ද සිට, මේ රජයේ සමුපකාරය බාර අමාත්‍යාවරයාව සිටි එස්. බී. හේරත් මහතාගේ යුගයේ සිට, මේ දක්වාම සමුපකාර ව්‍යාපාරය ස්වාධීන බවට පත් කර, මේ රටේ ජනතාවගේ ඕනෑ එපාකම් ඒ මඟින් ඉෂ්ට වන හැටියට කටයුතු කිරීමට මේ රජය සෑහෙන මහත්සියක් දරා තිබෙන බව මම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. අද මේ සංශෝධන පනත ඉදිරිපත් කර තිබෙන්නේ සමුපකාර කොමසාරිස්තුමාට මේ ව්‍යාපාරය ක්‍රමානුකූලව පාලනය කිරීමට අවශ්‍ය බලතල ලබා දෙන්නටයි.

සමහර රටවල පත්තර විකුණන තැන කිසිම කෙනෙක් නැතිව පත්තර අරගෙන සල්ලි ටික එතැනට දමා යැමට පුරුදු වූ පුද්ගලයන් ජීවත් වන බව අපි දන්නවා. සමහර රටවල බස් එකේ කොන්දෙස්තර කෙනෙක් නැතිව සල්ලි ටික දමා ටිකට් එක ලබාගෙන බස් එකේ යැමට පුරුදු වූ පුද්ගලයන් සිටිනවා. නමුත් මේ රටේ තත්ත්වය නමුන්නාන්සේලා දන්නවා. එය මම නමුන්නාන්සේට අමුතුවෙන් කියන්නට අවශ්‍ය නැහැ. සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්නට අප බලාපොරොත්තු වෙනවා නම් ඒ විධියේ උදරතර අදහස් නැතිව වුවත්, නියම සමුපකාර අදහස් ඇතිව, මේ ව්‍යාපාරය මෙහෙයවන්නට අවශ්‍ය බව මම විශේෂයෙන් සඳහන් කරනවා.

මෙහිදී මහජන බැංකුව ගැන කරුණු සඳහන් වුණා. ඒ ගැන මම සතුටු වෙනවා. මහජන බැංකුව ගැන මොන විධියේ අදහස් ප්‍රකාශ වුණත්, තවමත් මහජන බැංකුව සමුපකාර ව්‍යාපාරයේ දියුණුව සඳහා විශේෂ අනුග්‍රහයක් දී ක්‍රියා කිරීම ගැන අපි ඊට කෘතඥ විය යුතුයි. පෞද්ගලික අංශයට දෙනවාට වඩා විශාල අඩු පොළියකට සමුපකාර ව්‍යාපාරයට මහජන බැංකුව ණය දෙනවා.

ඒ වාගේම සමුපකාර සේවක මණ්ඩල ගැනත් කරුණු සඳහන් වුණා. අඩුපාඩු කොතෙකුත් ඇති වුණත් ඒ ආයතන සාධාරණ සේවයක් කරන බව මෙහිදී කෘතඥතා පූර්වකව මම සඳහන් කරන්නට ඕනෑ. තිබෙන අඩුපාඩු හැම එකක්ම ක්‍රමානුකූලව නැති කර ගන්නට අපට අවස්ථාව තිබෙනවා. කලවානේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විධියට සමුපකාරය දෙස නොයෙක් දෙනා නොයෙක් ඇසින් බලනවායයි මමත් කල්පනා කරනවා. මෙමු ව්‍යාපාරය අපට ඕනෑ, ඕනෑ විධියට බලන්නට පුළුවන් ව්‍යාපාරයක් යයි මම කල්පනා කරන්නේ නැහැ. අප හැම දෙනාම එහි ප්‍රතිපත්ති තුළින් සමුපකාරයක් හැටියට බැලුවොත් මන්ත්‍රීතුමන්ලා සඳහන් කළ හුඟක් ප්‍රශ්න මැඩලීමට පුළුවන් වේය යන්න මම සඳහන් කරන්නට ඕනෑ.

සමුපකාරය දියුණු කරන්නට අපට ස්වාධීන සමුපකාර බැංකුවක් ඇත්නම් එය බොහොම ප්‍රයෝජනවත් වන බව අපි දන්නවා. නමුත්, මම දන්නේ නැහැ කොයි තරම් දුරට ගරු මුදල් ඇමතිතුමාගේ අනුග්‍රහය එසේ නැත්නම් රජයේ අනුග්‍රහය ඒ සඳහා ලබා ගන්නට පුළුවන් වේද කියා. මෙවැනි ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඒ කොපමණ ප්‍රශ්න තිබුණත් උදරතර සමුපකාර ව්‍යාපාරිකයෝ මේ රටේ නායකත්වය ගන්නවා නම් පෞද්ගලික අංශයට හෝ වෙන ඕනෑම අංශයකට තරගයක් දී මේ රටේ පාරිභෝගිකයන්ට සාධාරණ සේවයක් ඉෂ්ට කරන්නට පුළුවන් උදාරතම ව්‍යාපාරය සමුපකාර ව්‍යාපාර බව සඳහන් කරන්නට ඕනෑ. එම නිසා සමුපකාර ව්‍යාපාරය දීර්ඝ කාලයක් තුළ මේ රටේ ජනතාව වෙනුවෙන් සේවය කිරීම ගැන සතුටු වන අතර, මෙමු සංශෝධන පනතින් තව දුරටත් මෙහි මනා පාලන ක්‍රමයක් ඇති කර නමුන්නාන්සේලාගේත් සහාය ඇතිව සමුපකාර ව්‍යාපාරය තවත් පුළුල් කරන්නට ගරු ඇමතිතුමාටත්, කොමසාරිස්තුමාටත් අවස්ථාව සැලසේවායයි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

අ. භා. 5.35

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
*(திரு. ஆனந்த தஸநாயக்க—கொத்மலை)*
**(Mr. Ananda Dassanayake–Kotmale)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ආහාර හා සමුපකාර ඇමතිතුමා විසින් ඉදිරිපත් කළ මෙමු සංශෝධන පනත අද තිබෙන තත්ත්වයේ හැටියට සමුපකාරයේ දියුණුවට අවශ්‍යම පනතක් හැටියට අප සලකනවා. මෙමු පනතේ තිබෙන කරුණු ගැන කථා කරනවා නම්, සමුපකාර ව්‍යාපාරයේ හැටියට, පැය ගණනක් කථා කරන්නට කරුණු තිබෙනවා ; කරුණු ඉදිරිපත් කරන්නට තත්ත්වයක් තිබෙනවා. ගරු ඇමතිතුමාට පිළිතුරු සැපයීමට සැලකිය යුතු කාලයක් ඕනෑ නිසා මම මගේ කථාව කෙටියෙන් –කථාවේ අදහස් ටික පමණක්– ඉදිරිපත් කරන්නට සූදානම් වෙනවා.

සමුපකාර සමිතියක සාමාජිකත්වය මම හිතන හැටියට වෙනස් විය යුතු කාලය දැන් පැමිණ තිබෙනවා. රුපියලේ සාමාජිකයන් බඳවා ගැනීමේ තත්ත්වය උඩ හැම දෙනෙකුගෙන්ම රුපියලක් අය කර සාමාජිකයන් වශයෙන් බඳවා ගන්නවා. ඡන්දය තිබෙන විට සමහර මුදලාලි කෙනෙකුට, පෞද්ගලික වෙළෙන්දෙකුට පුළුවන්කම තිබෙනවා, අර සාමාජිකයන් මිලයට ගෙන රුපියල ගණනේ ගෙවා සමිතියට බඳවා ඔහුට ඕනෑ විධියට ඡන්දය පාවිච්චි කරවා ගන්නට. මෙය තවමත් සිදු වෙනවා. මෙය වැරදි ක්‍රමයක්, කොයි අංශයෙන් වුවත් ඉතාම වැරදි ක්‍රමයක්. පෞද්ගලික අංශයට පෞද්ගලික වෙළඳ අංශයට ඇඟිලි ගැසීමෙන් සමුපකාර ව්‍යාපාරය මර්දනය කිරීමක්, ඊට බාධා කිරීමක් කෙරෙන්නේ. මෙය කවද හෝ වෙනස් විය යුතුයි. ගරු ඇමතිතුමා මේ සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් ගත යුතුයයි මම හිතනවා.

දෙවැනි කරුණ. සමුපකාරය ආරම්භ කරන විට ණය දෙන සමිතින් ආරම්භ වුණා. ණය දෙන සමිතිවල පාලනය ඉතා ක්‍රමවත්. විවිධ සේවා සමුපකාර සමිතිවලට වඩා ක්‍රමවත් පාලනයක් ණය දෙන සමිතිවල තිබෙන්නේ. අදත් පවතින එම සමිතිවලනින් ණය දීම සඳහා විශේෂ ප්‍රයෝජනයක් ගන්නවා. සමහර සමිතිවලින් රුපියල් දහ පහළොස් දහ ණය දෙනවා. ණය දෙන සමිතිවල ආකල්පයටම මෙමු විවිධ සේවා සමුපකාර සමිතිවල සැලැස්මත් සකස් වෙනවා නම් මීට වඩා වැදගත් වේයයි මම හිතනවා. එවිට අපේ ගරු ඇමතිතුමාට ලෙහෙසියෙන් කටයුතු කරගෙන යන්නට පුළුවන් වෙයි. 1940 ස් ගණන්වල සමුපකාරය භාරව හිටපු ඒ. රත්නායක ඇමතිතුමා, හිටපු පිලිප් ගුණවර්ධන ඇමතිතුමා, මෑතකදී හිටපු ඉලංගරත්න ඇමතිතුමා ඒ වාගේම නොබෝද අභාවප්‍රාප්ත වූ අපේ හේරත් ඇමතිතුමා ආදී වශයෙන් මේ අය. මෙමු සමුපකාරයේ සෑහෙන දියුණුවක් ඇති කරන්නට බොහොම උත්සාහ ගත්තා. කාලයාගේ ඇවෑමෙන් එම වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කරන්නට අවස්ථාව ලැබුණේ නැහැ. අපි ඒ අයට සම්පූර්ණ දෝෂාරෝපණයක් කරන්නට සූදානම් වෙන්නෙ නැහැ. ඒ අය එක එක අංශ ඇති කළා. එයින් සමහර අංශ අසාර්ථක වුණා. මේ තත්ත්වය වෙනස් කිරීමට වර්තමාන ඇමතිතුමා දේවනායගම් කොමිටියේ ප්‍රතිපත්ති මත කටයුතු කළ යුතුද? එම කොමිටියේ යෝජනා මොනවාද කියා ගරු මන්ත්‍රීවරුවත්, කැබිනට් මණ්ඩලයවත් දන්නවාද කියා මම දන්නෙ නැහැ. තවම ඒ වාර්තාව පිට වුණේ නැහැ. එම වාර්තාවේ යම්කිසි සැලැස්මක් තිබෙනවා නම් මේ රටේ ඉන්න සමුපකාරිකයන් හැම දෙනාටම දැන ගැනීමට එම වාර්තාව වහාම ප්‍රසිද්ධියට පත් කරන්නය කියා අපි ඉල්ලා සිටිනවා. මෙවැනි සංශෝධනවලත්, මේ විධියේ පැලැස්තර දැමීමෙන් වැඩක් වේවිය කියා අපට නම් කිසිසේත්ම සිතන්නට බැහැ. දේවනායගම් වාර්තාව සාර්ථක එකක් නම්, ඒ අනුව සමුපකාර ව්‍යාපාරය ප්‍රතිසංවිධානය වන විධියට නැවත සැලැස්මක් සකස් කරනවා නම් හොඳයි කියන එක මගේ හැඟීමයි. කෙසේ වෙතත්, එම වාර්තාව පිටවෙන්න ඕනෑ. එය පිට වන තෙක් අපට ඒ ගැන කිසිම දෙයක් කියන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවිධ සේවා සමුපකාර සමිති කියන ඒවා පටන් ගත්තෙ ඇයි? විවිධ සේවාවන් කියා කියන්නෙ මොනවාටද? Multi-purposes. සමහර සමුපකාර සමිති බඩු බෙද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැරීමට පමණක් සීමා වී තිබෙනවා. සද ලංකාවේ සමුපකාර සමිතියක් තිබෙනවා. එම සමුපකාර සමිතියෙන් නිවාස හදනවා. එම සමිතිය මගින් ආරෝග්‍යශාලා පවත්වාගෙන යනවා. බාබර් සාප්පු පවත්වාගෙන යනවා. හෝටල් පාලනය කරනවා. දැන් චිත්‍රපටි නිෂ්පාදනය කිරීමත් කරගෙන යනවා. අන්න නියම Multi-purposes. ඒවා අකුරටම ක්‍රියාත්මක වෙනවා. ඒ වගේම තවත් වැලිමඩ කැප්පෙටිපොල සමුපකාර සමිතිය කියා එකක් තිබෙනවා. ඒ සමිතියෙනුත් විශාල ලාභයක් උපදවනවා. එක් එක් අවුරුද්දට එක් එක් විධියේ වැඩ ආරම්භ කරනවා. මේ ළඟදී කැප්පෙටිපොළින් බස් දිවවීමත් එම සමිතිය මගින් කරන්නට භාරගත්තා. සී. ටී. බී. ඩිපෝ එකකින් කරන තත්ත්වයට අඩු නොවන තත්ත්වයකින් අද එම සමිතිය මගින් එම සේවාව පවත්වාගෙන යනවා. අද කැප්පෙටිපොලින් සී. ටී. බී. බස් දිවවීම කරන්නේ මෙම සමුපකාර සමිතිය මගිනුයි. එපමණක් නොව, පෙට්‍රල් ගබඩා තිබෙනවා, ඩීසල් ගබඩා තිබෙනවා, භූමිතෙල් ගබඩා තිබෙනවා. ඒ සියල්ල බෙද හැරීම අද කරන්නෙ කැප්පෙටිපොල සමුපකාර සමිතිය මගිනුයි. ඒ වගේම ඒ ප්‍රදේශයේ සියලුම කොන්ත්‍රාත්—රජයේ කොන්ත්‍රාත් හා පෞද්ගලික අංශයේ කොන්ත්‍රාත්—අරගන්නෙත් මේ සමිතිය විසිනුයි. ගොවිපළවල් ආරම්භ කර තිබෙනවා. සදලංකාවේ සමුපකාර සමිතියත් එහෙමයි. මේ විධියට කරනවා නම් මේ සමුපකාර සමිති දියුණු කරන්නට පුළුවන්. Multi-purpose Co-operatives ආරම්භ කරමින් පාර්ලිමේන්තුවේදී කතා කළ පිලිප් ගුණවර්ධන ඇමතිතුමා එද කිව්වේ සමුපකාර සමිති ස්ථාවර තත්ත්වයක් හැමදටම දියුණුවෙන් දියුණුවට පත් කරමින් පවත්වාගෙන යායුතු බවයි.

තවත් කාරණා එකක් දෙකක් පමණයි මම කියන්නට බලාපොරොත්තු වන්නෙ. අපේ විවෘත ආර්ථිකයට, පෞද්ගලික අංශයට, දෙන සහනාධාර වැඩිවන විට ඇතිවන තරඟකාරී තත්ත්වයට මුහුණ දෙන්නට සමුපකාරවලට පුළුවන් වන්නෙ නැහැ. ගරු ඇමතිතුමා කොයි තරම් උත්සාහ ගත්තත් සමුපකාරවලට පාඩුමයි සිදු වෙන්නෙ. ලැබෙන ලාභය මදියි. සුළු බඩු ප්‍රමාණයක් පමණක් විකිණීමෙන් මේවා පවත්වාගෙන යන්නට බැහැ. ඒ වගේම වතුවල සමුපකාර සමිති ඇති කිරීම නිසා ගම්බද සමුපකාර සමිති වැසීගෙන යනවා. වත්තෙ ඉන්න සුපුරින්ටෙන්ඩන්ට් මහත්මයා බඩු ටිකක් ගෙනැවිත් බෙද දීමේ ක්‍රමයක් ඇති වී තිබෙනවා. මා හිතන හැටියට ඒවා නවත්වන්නට ඕනෑ. එහෙම නැත්නම් අමාරු තත්ත්වයක් ඇති වෙන්නට පුළුවන්.

අන්තිම වශයෙන් තව එක් කාරණයක් ගැන මතක්කරන්නට කැමතියි. වැරදි කරන සේවකයන්ට දඬුවම් දෙන්නට ඕනෑ ; නමුත් අපේ පේෂකර්ම ඇමතිතුමා මතක් කළා වාගේ පැහැදිලි තත්ත්වයෙන් හරියටම වරද මොකක්ද කියා සොයාගෙන මිසක් කිසිම සේවකයෙකුට දඬුවම් කිරීම සුදුසු නැහැ.

දැනට ඉන්න සමුපකාර කොමසාරිස්තුමා ගැන මම හොඳට දන්නවා. එතුමාට මෙම ව්‍යාපාරය සාර්ථකව ගෙන යන්නට දක්ෂකමක් තිබෙනවා. එතුමාත් සමග ගොස් අපි පසුගිය මාසයේ සපුගන්තලාවේ සමුපකාර බැංකුවක් විවෘත කළා. ඒ සමුපකාර සමිතිය බොහොම නට්ටන් වී තිබුණා ; රු. 21,00,000 ක් පමණ ණය වී තිබුණා. දැන් ඒ ණය ටිකෙන්-ටික අඩු කරගෙන යනවා. ඒ සමිතිය විසුරුවා හරින්නයි, ගියේ. මම ඉදිරිපත් වී එය නැවැත්තුවා, සමුපකාර සේවකයන්ගේ යහපත තකා. දැන් ළඟදී, සමුපකාර බැංකුවකුත් විවෘත කළා. මේ සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කර දෙයි කියා ගරු ඇමතිතුමාගෙනුත්, සමුපකාර කොමසාරිස්තුමාගෙනුත් අපි බලාපොරොත්තු වෙනවා.

එය ආරක්ෂා කරන්න නම් කළ යුතු එක් දෙයක් තිබෙනවා. සමුපකාර සේවකයන්ට සෑහෙන ආදයම් තත්ත්වයක් තිබෙන්න ඕනෑ, ඒවායේ හොඳින් වැඩ කරන්න නම් යම්කිසි කෙනෙක් සමුපකාර සේවයට බැඳුනාම ඔහුට වෙනත් රක්ෂාවක් කරන්න බැරි වන බව ඇමතිතුමා දන්නවා. සමුපකාර සේවයට බැඳී අවුරුදු පහක්-දහයක් ගත වන විට ඉහළ වැටුපක් ලැබෙන රක්ෂාවකට වුණත් යන්න ඔහුට බැරි වෙනවා, වයස පිළිබඳ සුදුසුකම බලපාන නිසා. එම නිසා ඔහු ඒ සමුපකාර ව්‍යාපාරයේම රැඳී ඉන්න ඕනෑ. ඒ විධියට අවුරුදු විසිපහ-තිහ සමුපකාරයේම වැඩ කළ සේවකයන් ගණනාවක් ඉන්නවා. ඒ අය අද බොහොම අමාරුවෙනුයි, ජීවත් වෙන්නේ. [බාධා කිරීම්]

මම පසුගිය කාලය මුළුල්ලේම වරින්-වර ඉදිරිපත් කරන ප්‍රශ්නයක් නැවතත් මේ අවස්ථාවේදීත් ඉදිරිපත් කරන්න කැමතියි. ගරු මුදල් ඇමතිතුමා 1980/81 අයවැය යෝජනාවලින් රජයේ හා සංස්ථා සේවකයන්ගේ වැටුප් රු. 55 කින් වැඩි කළා. 1981/82 අයවැය ලේඛනය මගින් ඒ අයට තවත් රු. 70 ක් දුන්නා. 1982/83 අයවැය යෝජනා මගින් නැවතත් රු. 105 ක් ලබා දුන්නා. ඒ දීමනාවල මුළු එකතුව රු. 230 ක් වෙනවා. රජයේ සේවකයන්ට ඒ විධියට පසුගිය කාලය තුළ රු. 230 කින් පඩිය වැඩි වුණත් සමුපකාර සමිතිවල වැඩ කරන සේවකයන්ට—කලාතුරකින් එක සමිතියක නැත්නම් දෙකක හැරෙන්න—ඒ වැඩි වූ දීමනා ලැබී නැහැ. ඒ අයත් ජීවත් වෙන්න ඕනෑ, තමන්ගේ පඩියෙනුයි. වැඩි වුණු බඩු මිල ඔවුන්ටත් බලපානවා. එම නිසා ඒ සමුපකාර සේවකයන්ට සිදු වී ඇති අසාධාරණය නැති කරන හැටියට මම කීප වතාවක්ම ඉල්ලා සිටියා. රජයේ සේවකයන්ගේ පඩිය ඒ විධියට වැඩි කර තිබෙනවා නම් සමුපකාර සේවකයන්ටත් ඒ වැඩි වූ මුදල දිය යුතුයි නේද? සම්පූර්ණ මුදලම දෙන්න අපහසු නම් අඩු තරමින් එයින් සියයට පහළොවක්-විස්සක්වත් දීමට යුතුකමක් තිබෙනවා නේද? ඒ, එක ප්‍රශ්නයක්.

අනෙක් ප්‍රශ්නය, මේකයි ; සමුපකාර සේවක කොමිෂම මගින් ඒ සේවකයන්ගේ ප්‍රශ්න විසඳීමට අමාරුකම් ඇති වී තිබෙනවා. කලින් සමුපකාර සේවකයන්ට අයිතිය තිබුණා, තමන්ගේ ප්‍රශ්න සම්බන්ධයෙන් 'ලේබර් ට්‍රයිබියුනල්' එකට නැත්නම් කම්කරු විනිශ්චය සභාවට හෙවත් කම්කරු උසාවිය ඉදිරියට යන්න. රජය ඒ අවස්ථාව නැති කර 'කෝපරේටිව් එම්ප්ලෝයීස් කොමිෂන්' එක පත් කළා. ඒ වෙනුවට, සමුපකාර සේවකයන්ට සියලුම ප්‍රශ්න, අරගල ගැන කටයුතු කරන්න තිබෙන්නේ, ඒ සමුපකාර සේවක කොමිසමයි. මට පෙනෙන්නේ නැහැ, එය සාර්ථක ක්‍රමයක්ය කියා.

යම් සමුපකාර සේවකයෙක් යම්කිසි වැරැද්දකට පැටළුණාම ඔහු වැරදිකරු වන තුරු, නිවැරදිකරුව සිටින තාක් කල් තමන්ගේ නිරද්දෝෂී භාවය ඔප්පු කිරීම සඳහා සටන් කරන්න ඔහුට අවස්ථාව තිබෙන්න ඕනෑ. එය මූලික මිනිස් අයිතිවාසිකමක්. නමුත් ඒ මූලික මිනිස් අයිතිය නැහැ, සමුපකාර සේවක කොමිෂමේ. එම නිසා සමුපකාර සේවක කොමිෂම අදට ගැළපෙන්නේ නැහැ. සමුපකාර සේවක කොමිෂම එලෙසම තිබෙන්න ඕනෑ නම් ඊට එහා යන්න, අභියාචන ඉදිරිපත් කරන්න පුළුවන් වන විධියේ 'ලේබර් ට්‍රයිබියුනල්' එකක්, කම්කරු උසාවියක්, 'ඉණ්ඩස්ට්‍රියල් කෝට්' එකක් තිබෙන්න ඕනෑ. ඒ අවස්ථාව සමුපකාර සේවකයන්ට ලබා දීමට හිටපු ඇමතිතුමා—එස්. බී. හේරත් ඇමතිතුමා—කැමැත්ත පළ කර තිබුණා. ඇත්ත වශයෙන්ම වැඩි දෙනෙක් ඊට කැමතියි. සේවක ප්‍රශ්න පිළිබඳව විභාග කර සාධාරණ තීරණයක් දෙන්න සමුපකාර සේවක කොමිසමට බැරි නම්, කලාතුරකින් හෝ දෙන සාධාරණ තීරණයක් ක්‍රියාත්මක කරවා ගන්නත් බැරි නම් ඒ සඳහා යම්කිසි ප්‍රතිකර්මයක් යෙදිය යුතුයි. එම නිසා මේ කරුණු කෙරෙහි ඇමතිතුමාගේ අවධානය යොමු කොට මේ සමුපකාර ව්‍යාපාරය සාර්ථකව ඉදිරියට ගෙන යන හැටියට ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 5.49

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (නියෝජ්‍ය ආහාර හා සමුපකාර ඇමතිතුමා)**

*(திரு. சரத்சந்ர ராஜகருணா—உணவு, கூட்டுறவுப் பிரதி அமைச்சர்)*

(Mr. Sarathchandra Rajakaruna–Deputy Minister of Food & Co-operatives)

නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත පිළිබඳව කථා කිරීමට ප්‍රථමයෙන් ආහාර හා සමුපකාර අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, එතුමාගේ නිලධාරි මණ්ඩලයටත්, ඒ වගේම සමුපකාර කොමසාරිස්තුමාට සහ එතුමාගේ නිලධාරි මණ්ඩලයටත්, සමුපකාර සමිතිවල සභාපති මහතුන්ට, අධ්‍යක්ෂ මහතුන්ට හා ඒවායේ සේවක-සේවිකාවන්ටත් රජය වෙනුවෙන් මගේ ස්තුතිය පුද කිරීමේ යුතුකමක් තිබෙනවා, පසුගිය අවාසනාවන්ත සිද්ධීන් ඇති වුණු කාලයේදී අපට දෙන ලද සහයෝගය සම්බන්ධයෙන්.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත්චන්ද්‍ර රාජකරුණා මහතා]

ඒ වාගේම මේ පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී හිටපු ආහාර හා සමූපකාර ඇමති ගරු එස්. බී. හේරත් මැතිතුමා මට අමතක කරන්නට බැහැ. එතුමා මේ පනත් කෙටුම්පත සකස් කිරීමේදී අපට හුඟක් උදව් වුණා. නමුත් අවසානාවකට එතුමා අප අතරින් සදහටම වෙන් වුණා. එබඳු සහයෝගයක් ලබා දුන් එතුමා මේ අවස්ථාවේදී සිහිපත් කිරීම අපේ යුතුකමක්.

මේ උත්තරීතර සභාවේදී මේ පනත් කෙටුම්පත ගැන ගරු ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු, දිසා ඇමතිවරු ඇතුළුව මන්ත්‍රීවරු දහ අට දෙනෙක් කතා කළා. මම ඒ අයට ඊළඟට ස්තුතිවන්ත වෙනවා. එම කතාවලට සවන් දුන් ගරු ඇමතිතුමාත් මාත් අපේ නිලධාරී මණ්ඩලයත් අපේ තිබෙන අඩුපාඩුකම්, දුර්වලකම් හඳු ගන්නට ඒ කථාවලින් ධෛර්යමත් වුන බව ස්තුති පූර්වකව සඳහන් කරන්නට කැමතියි.

සමූපකාර ව්‍යාපාරය කිසිම කෙනෙකුට යටත් නැති නිදහස් ආයතනයක් බව සමූපකාර සමිති (සංශෝධිත) පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරු මුලින්ම හිතේ තබා ගන්නට ඕනෑ. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ තිබෙන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව එහෙම නැත්නම් සමාජ සේවා අමාත්‍යාංශය යටතේ තිබෙන සමාජ සේවා දෙපාර්තමේන්තුව වගේ දෙපාර්තමේන්තුවක් වශයෙන් ගෙන යන ව්‍යාපාරයක් නොවෙයි, සමූපකාරය. සාමාජිකයන් තුළ පමණක් කටයුතු කරන ව්‍යාපාරයක් හැටියට මතක තබාගෙන මේ ගැන කතා කළා නම් ඉතා වැදගත්ය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. අපේ සමහර ගරු මන්ත්‍රීවරු ඒ ගැන කල්පනා නොකර පිල්ලෙත් විකක් ඉවතට පැන කතා කළා.

කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ සිටින නිසා විශේෂයෙන් එතුමාට එකක් මතක් කරන්නට කැමතියි. රජයේ සේවකයන්ට වැඩි කළ රුපියල් දෙසිය තිහෙන් සියයට පහළොවක් හෝ විස්සක්වත් සමූපකාර සේවකයන්ට ගෙවන්නට කටයුතු කරන ලෙස එතුමා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා. තමුන්නාන්සේගේ සමූපකාර සමිතියට ගෙවන්නට පුළුවන්කම තිබෙනවා නම් රුපියල් දෙසිය තිහ නොවෙයි, රුපියල් හාරසිය තිහක් වුණත් ගෙවන්නට සමූපකාර දෙපාර්තමේන්තුව අවසර දෙන බව මම මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා. [බාධා කිරීමක්] නැහැ. ඒක මම පැහැදිලි කර දෙන්නම්. බිබිලේ විවිධ සේවා සමූපකාර සමිතිය සමූපකාර සේවකයන්ට රුපියල් සියය ගෙවූ අවස්ථාවේදී ඒ රුපියල් සියය ගෙවුවේ කාගෙන් අවසරයක් ඇතුවද කියා සමූපකාර දෙපාර්තමේන්තුව චෝදනා කළ බව නියෝජ්‍ය ජේෂ්ඨකර්ම ඇමතිතුමා ප්‍රකාශ කළා. ලාභ තිබෙනවා නම් ඕනෑම සමූපකාර සමිතියකට මේ විධියට වැඩියෙන් පඩි ගෙවන්නට පුළුවන් විධියටයි, අපි අවසර දී තිබෙන්නේ. බිබිලේ සමූපකාර සමිතිය පසුගිය අවුරුද්දේ රුපියල් දෙලක්ෂ ගණනක පාඩුවක් ලබා තිබෙනවා. එහෙම නම් කොහොමද මේ විධියට මුදල් ගෙවන්නේ? මෙය දෙපාර්තමේන්තුවක් හැටියට සලකන්නට එපාය කියා මම මුලින්ම ඉල්ලා සිටියා.

සමූපකාරය සාමාජිකයන්ගේ සමිතියක්. මේ සමිතිවලට රජයෙන් හුඟක් උදව් කර තිබෙනවා. සමූපකාර සමිතිවලට රජය උදව් කරනවා මදිය කියා සමහර මන්ත්‍රීවරු රජයට දෙස් දකිව්වා. ඒ ලබා ගැනීම සඳහා මහජන බැංකුවෙන් අපට හුඟක් උදව් කරන බව සමහර මන්ත්‍රීවරු දන්නවා ඇති. මහජන බැංකුවෙන් අපට ඒ සඳහා මුදල් දෙන්නේ සියයට හතේ පොලියටයි. ආහාර දෙපාර්තමේන්තුවෙන් මේ හැම සමිතියකටම කිසිම පොලියක් නැතිව විශාල මුදලක් දී තිබෙනවා. මේ විධියට සතොස ආයතනය පොලියක් රහිතව මාසිකව බඩු දෙනවා.

මෙපමණ උදව් කර මේ සමිති ගෙන යන්නට බැරි ඇයි කියන එක මා මේ අවස්ථාවේදී විග්‍රහ කර දෙන්න අවශ්‍යතාවයක් නැහැ. මෙතන තිබෙන ලෙඩේ මොකක්ද කියා තමුන්නාන්සේලා දන්නවා ඇති. සමූපකාර ඇමතිතුමා, සමූපකාර කොමසාරිස්තුමා එහෙම නැත්නම් අපේ ලේකම්තුමා මේවාට දෙස් අහන්න අවශ්‍යතාවයක් නැහැ. දක්ෂ අවංක සේවක පිරිසක් මේ ව්‍යාපාරය තුළ සිටිනවා නම් මේ ව්‍යාපාරය දියුණු කරන්න පුළුවන් බවත්, ඇතැම් ස්ථාන එසේ දියුණු වී තිබෙන බවත් මේ අවස්ථාවේදී මට කියන්න පුළුවන්. ලංකාවේ තිබෙන සමූපකාර සමිතිවලින් දෙකෙන් පංගුවකට වැඩියෙන් පවත්වාගෙන යන්නේ ලාබ ඇතිවයි. උදාහරණයක් වශයෙන් බණ්ඩාරවෙල විවිධ සේවා සමූපකාර සමිතිය පෙන්වන්නට පුළුවන්. එය මොන තරම් ලක්ෂණට, මොන තරම් ලාබ ඇතිව ගෙන යනවද කියා ගිහින් බලන්න පුළුවන්.

සමහර මන්ත්‍රීවරු මේ පනතට වඩා බාහිර ප්‍රශ්න ගැන කථා කළ බව මේ අවස්ථාවේදී මා කියන්න කැමතියි. අපි දන්න විධියට, පුළුවන් විධියට ඒවාට පිළිතුරු දීමත් අපේ යුතුකමක්ව තිබෙනවා. මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) බොහොම උනන්දුවෙන්, ඕනෑකමින් එතුමාගේ ප්‍රදේශයේ තිබෙන සමූපකාර සමිතිය දියුණු කරන්නට කටයුතු කරගෙන යාම ගැන එතුමාට මා ස්තුතිවන්ත වෙනවා. දේවනායගම් මහතාගේ ප්‍රධානත්වයෙන් තිබූ කොමිටියේ වාර්තාව කෝ කියා එතුමාගේ කථාවේදී ප්‍රශ්න කළා. මහරගම ගරු මන්ත්‍රීතුමා නවක මන්ත්‍රීවරයෙක්. 1977 දී එතුමාට පාර්ලිමේන්තුවට එන්න බැරිවීම ගැන මා ශෝකවු වෙනවා. ඒ අවස්ථාවේදී සිටි මන්ත්‍රීවරු සියලු දෙනාටම ඒ කොමිටියෙන් ඉදිරිපත් කළ වාර්තාව අපි බෙදා දුන්නා. මහරගම ගරු මන්ත්‍රීතුමාටත් එය ලබන සතියේ ලබා දීමට කටයුතු කරනවා. [බාධා කිරීම්] ඒ අවස්ථාවේදී අපි සියළු දෙනාටම එවා තිබෙනවා. කාට හරි නොලැබුණා නම් එය අමතක වීමක්.

හුඟක් දෙනෙකුට සමූපකාර ව්‍යාපාරය ගැන අමතක වෙලා තිබුණා. මතක් වුණේ පසු ගිය කලබලකාරී අවස්ථාවේදීයි. මේ අවස්ථාවේදී සමූපකාර ව්‍යාපාරය ගැන මතක්වීම ගැනත් සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මා ස්තුතිවන්ත වෙනවා. සමූපකාර ව්‍යාපාරය අවශ්‍යයයි කියා මුළු රටටම ඔප්පු වී තිබෙනවා.

මහරගම පැට්‍රල් ගබඩාවක කළමනාකාර මහතෙක් සම්බන්ධව ඇති වුණ ප්‍රශ්නයක් ගැන මහරගම ගරු මන්ත්‍රීතුමා මතක් කළා. මා වැඩ බලන ඇමතිවරයා වශයෙන් සිටියදී දන් සිටින සභාපතිතුමා මට අභියාචනයක් ඉදිරිපත් කළා. ඒ අභියාචනය අනුව මා පරීක්ෂණය කර, නැවත වරක් එතුමා පත් කරන්න කියා ඉල්ලීමක් කොමසාරිස්තුමාට භාර දුන්නා. ඒ අනුව කොමසාරිස්තුමා පත් කළා. ඉන්පසුව තමුන්නාන්සේත්, ඒ සභාපතිතුමාත් තවත් ඉල්ලීමක් කළා, ඉතිරි අධ්‍යක්ෂ මණ්ඩලයේ තුන් දෙනෙකුත් පත් කරන්නය කියා. නමුත් සමූපකාර සභාපතිතුමා ඒ අවස්ථාවේදී ඒ කළමනාකාර මහතාව නෙරපන්නට උත්සාහ ගත් බව ඒ පරීක්ෂණය කර ගෙන යන අවස්ථාවේදී මට පෙනී ගියා. නමුත් ඒ උත්සාහයට සහයෝගයක් ඒ අධ්‍යක්ෂවරු තුන් දෙනා නොදුන්න නිසයි, අපි ඒ තුන්දෙනා නැවත පත් නොකළේ කියන එක මා තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම, විශේෂයෙන්ම ව්‍යාපාර පිරිවැටුම් බද්ද ගැන සියලුම මන්ත්‍රීවරු ඉල්ලීම් කිහිපයක් කළා මට මතකයි. මෙය ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය සම්බන්ධව මගේ ගරු ඇමතිතුමා කථා කර තිබෙනවා. ව්‍යාපාර පිරිවැටුම් බද්ද දෙවතාවක් ගෙවන එකම ව්‍යාපාරය සමූපකාර ව්‍යාපාරයයි. බඩු ගැනීමේදීත් බඩු විකිණීමේදීත් බිලක් ඇතිව කටයුතු කරන එකම ආයතනය සමූපකාර ආයතනයයි. රුපියල් සියයකට යම්කිසි භාණ්ඩයක් මිලයට ගන්නවා නම් ඒ සඳහා රුපියල් 4 ක් ව්‍යාපාර පිරිවැටුම් බදු ගෙවන්න ඕනෑ. විකුණනකොට ආයෙත් බිලක් ඇතුව විකුණන නිසා තව සියයට 4 ක් එකතු වෙනවා. එතකොට සියයට අටක් වෙනවා. එවිට රුපියල් සියයට ගන්නා භාණ්ඩයක් රුපියල් 108 කටයි අපට විකුණන්න සිද්ධවෙලා තිබෙන්නේ. පෞද්ගලික ව්‍යාපාරිකයාට රජයෙන් හෝ රාජ්‍ය සංස්ථාවකින් මිලදී ගන්නොත් පමණයි බිලක් ඇතුව ගන්නට සිද්ධ වෙන්නේ; හුඟක් බඩු ගන්නේ බිල් නැතුව. එමනිසා අපිට මේ ව්‍යාපාරික පිරිවැටුම් බද්ද නිසා අපහසු තත්ත්වයක් ඇතිවී තිබෙනවා පෞද්ගලික අංශයත් සමඟ තරග කරන්න.

මේ තත්ත්වය ගැන අපි ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන අපේ ජනාධිපතිතුමාණන්ට කරුණු පැහැදිලි කර දීමෙන් පසුව, එතුමා කියා තිබෙනවා අමාත්‍ය මණ්ඩලයට කැබිනට් පත්‍රයක් ඉදිරිපත් කරන්නය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා. එය යථා කාලයේදීම අපි සූදානම් කර ඉදිරිපත් කරනවා. අපේ ලොකු විශ්වාසයක් තිබෙනවා අපිට ඒ සහනය කැබිනට් මණ්ඩලය ලබා දෙයි කියා.

අපේ මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා)–මා හිතන්නේ එතුමා අළුත් මන්ත්‍රීවරයකු නිසා වෙන්නට ඇති එහෙම කිව්වෙ–අදහසක් පළ කළා රජයේ සියලුම සේවකයින්ට අපහාස වන අන්දමට. එතුමා ඒ අදහස කොයි විධියේ අර්ථයක් ඇතිව ඉදිරිපත් කළාදැයි මම දන්නෙ නැහැ. එතුමා එය ඉදිරිපත් කළ හැටියට නම් රජයේ සේවකයින්ට පමණක් නොවෙයි, විශේෂයෙන්ම සමූපකාර දෙපාර්තමේන්තුවේ ඉන්න නිලධාරී මහත්වරුන්ටත් අපහාසයක් වෙන හැටියටයි එතුමා කථා කළේ. මේ දෙපාර්තමේන්තුවට එන්නේ කොහෙන් කොහෙන් හරි විසි වෙන රොඩ්ඩු ටිකයි කියන එකයි එතුමාගේ කථාවේ කෙටි අදහස.

දිනේෂ් ගුණවර්ධන මහතා
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)

මම එකක් කියන්න ඕනැ. මේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මම අපහාස කළා නොවෙයි. මම කිව්වෙ සමූපකාර දෙපාර්තමේන්තුව ආවෘත දෙපාර්තමේන්තුවක් කරන්නටය කියලයි. ට්‍රාන්ස්ෆර් වී එන නිලධාරීන් ටික කාලයක් සිට ආපසු ගියාට පසුව නවත් අය ඇවිත් ඒ තීරණ වෙනස් කරන තත්ත්වයට පත් නොකර පහළ මට්ටමේ සිට දෙපාර්තමේන්තුවේ ඉහළට යන්නට ඉඩ සලස්වන්නය කියායි මම කිව්වෙ. මම ඒක පැහැදිලි කරන්න ඕනැ. To make it a closed department. That is what I said.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
*(திரு. சரச்சந்திர ராஜகருணா)*
(Mr. Saratchandra Rajakaruna)

සමූපකාර දෙපාර්තමේන්තුව මාරුවීම් සහිත එකක්. ඒක අපට නවත්වන්නට බැහැ දෙපාර්තමේන්තුවක් වශයෙන්. මම කියන්න කැමතියි, අපේ දෙපාර්තමේන්තුවේ ඉන්නවා–මට උදාහරණයක් වශයෙන් නම් කියා කියන්නට පුළුවනි සමූපකාර පරීක්ෂක තනතුරෙන් පටන් අරගෙන වැඩ බලන සමූපකාර කොමසාරිස් තනතුර දක්වා උසස් වී ගිය නිලධාරී මහත්වරු. එහෙම නිලධාරී මහත්වරුන් ඉන්න දෙපාර්තමේන්තුවක් තමයි සමූපකාර දෙපාර්තමේන්තුව. මට මතකයි අපේ හිටපු නියෝජ්‍ය සමූපකාර කොමසාරිස් වරයෙක් වන ආර්. බී. පී. රාජපක්ෂ මහත්මයා. විතාරණ මහත්මයා දැනට සේවය කරමින් ඉන්නවා. ඒ දෙදෙනාම සමූපකාර පරීක්ෂක තනතුරේ සිට සමූපකාර නියෝජ්‍ය කොමසාරිස්, වැඩ බලන සමූපකාර කොමසාරිස් තනතුර දක්වා උසස් වී ගිය නිලධාරීන් කියන එක මම මේ අවස්ථාවේ දී සන්තෝෂයෙන් ප්‍රකාශ කර සිටිනවා.

අපේ දැනට සිටින සමූපකාර කොමසාරිස්තුමා ගැන තමුන්නාන්සේලා හුඟදෙනෙක් දන්නෙ නැතැයි මම හිතනවා. ඉතාමත්ම දක්ෂ කොමසාරිස් වරයෙක් අපට ඉන්නෙ. එතුමා ඒ කොමසාරිස් තනතුරට නොවෙයි, අමාත්‍යාංශයක ලේකම් තනතුරකට සුදුසු පුද්ගලයෙක් කියන එක මම මේ අවස්ථාවේදී නිර්භයව ප්‍රකාශ කරනවා. එතුමා දක්ෂ පළපුරුදු නිලධාරී මහත්මයෙක්. 1967 දී පරිපාලන සේවයට ඇවිත් එතුමා නොයෙක් අමාත්‍යාංශවල සේවය කර, නුවරඑළියේ දිසාපති හැටියටත් අන්තිමට පොලොන්නරුවේ දිසාපති හැටියටත් සේවය කරලයි අපේ සමූපකාර කොමසාරිස් තනතුරට පත්වුණේ. ඒ වාගේම ඊබට් නියෝජ්‍ය කොමසාරිස් තුමාත්, පුත්තලම, කුරුණෑගල, නුවරඑළිය ආදී දිස්ත්‍රික්කවල අතිරේක දිසාපති කෙනෙක් හැටියට සේවය කරලයි දැන් අපේ දෙපාර්තමේන්තුවේ සේවය කරන්නේ. නවත් ඩබ්ලිව්. බී. එස්. ජයවර්ධන මහත්මයා සමූපකාර දෙපාර්තමේන්තුවේ පහළ සිට ආ කෙනෙක්. එතුමා අද නියෝජ්‍ය කොමසාරිස් තනතුරේ වැඩ කරනවා. ඒ වාගේම ධර්මසේන දිසානායක මහතා, කේ. ජී. ඩී. බී. ජයවර්ධන නියෝජ්‍ය කොමසාරිස්තුමා, විමලසිරි මෙනෙවිය, මේ වාගේ දක්ෂ පුද්ගලයෝ අපේ දෙපාර්තමේන්තුවෙ ඉන්නවා. එපමණක් නොවෙයි, අපේ එක් නිලධාරී මහත්මයෙකුට විදේශ රටක සමූපකාර කොමසාරිස් තනතුරක් ලැබී, මේ මාසයේ අන්තිමට අපෙන් විශ්‍රාම යනවා. එම නිසා මොන තරම් දක්ෂ නිලධාරීන් පිරිසක්ද අපේ දෙපාර්තමේන්තුවේ සිටින්නේ කියන කාරණය මේ ගරු සභාවට ඔප්පු කරන්න මට ඉතාම පහසුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ සමාජ සේවා නියෝජ්‍ය ඇමතිතුමා චෝදනාවක් කළා. මම හිතන්නෙ එතුමා මේ චෝදනාව කරන්නෙ හයවැනි වතාවටයි. මුලින්ම 1979 දීයි මේ චෝදනාව කළේ. බිංගිරිය මැතිවරණ කොට්ඨාශයේ සමිති දෙකක් තිබෙනවා. ඒ සමිති දෙකෙන්–

ජේ. එල්. සිරිසේන මහතා
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)

සමිති එකයි තිබෙන්නෙ.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
*(திரு. சரச்சந்திர ராஜகருணா)*
(Mr. Saratchandra Rajakaruna)

පසුගිය ආණ්ඩු කාල සීමාවෙ දෙකක් තිබුණා. රුපියල් දහ හත් ලක්ෂයක වංචාවක් සම්බන්ධයෙනුයි එතුමා කතා කළේ. එතුමාට ඒ කාරණය පැහැදිලි කර දීම මගේ යුතුකමක්. එතුමා ඒ චෝදනාව ඉදිරිපත් කළ හැටියේම අපි නිලධාරී මහත්මයෙක් ඒ වෙනුවෙන් පත් කළා, 46 වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්නට. මේ පරීක්ෂණය කරගෙන යන අවස්ථාවේදී එම පරීක්ෂණයට භාජන වුණු මහත්වරු උසාවියට නඩුවක් ඉදිරිපත් කළා. ඒ අන්දමට උසාවියට නඩුවක් ඉදිරිපත් කළාම, සමූපකාර නිලධාරීන්ට ඉන් එහාට කටයුතු කර ගෙන යන්න බැරි අවස්ථාවකට පත් වෙනවා. ඒ අයගෙ අත්දෙක එකට ගැටගසා තිබෙන තත්ත්වයකට පත් වෙනවා. එහි නඩු තීන්දුව අපට ලැබුණේ අදයි. දැන් අපට ඒ තීන්දුව අනුව කටයුතු කර ගෙන යන්නට පුළුවනි. අන්න ඒ කාරණයයි මේ ප්‍රමාදය ඇති වීමට හේතුව. එහෙම නැතුව අදක්ෂ පාලනය නිසා හෝ කාගේවත් වරදක් නිසා නොවන බව අපේ නියෝජ්‍ය ඇමතිතුමාට මතක් කරන්න කැමතියි.

ජේ. එල්. සිරිසේන මහතා
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)

තීන්දුවෙන් ප්‍රතිඵල ලබන්න අමාරුයි.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
*(திரு. சரச்சந்திர ராஜகருணா)*
(Mr. Saratchandra Rajakaruna)

මහරගම මන්ත්‍රීතුමා (දිනේෂ ගුණවර්ධන මහතා) උතුරු කොළඹ ප්‍රවාහන සමිතිය ගැනත් කතා කළා. දැනට අප එයට තීරකවරයෙක් පත් කර තිබෙනවා. ඒ සමිතිය ගැන කියනවා නම් එය පාඩු පිට පාඩුවට පවත්වා ගෙන ගිය, රුපියල් ලක්ෂ ගණනක පාඩුවක් පිට පවත්වාගෙන ගිය, සමිතියක් හැටියට හඳුන්වා දෙන්න පුළුවනි. අපේ හිටපු සමූපකාර ඇමතිතුමාගේ කාලයෙදී මම බොහොම උත්සාහ කළා, මේ සමිතිය යළිත් ගොඩනගන්නට. දැන් මේකට තීරකවරයෙකු පත් කර ඇති බව ඒ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි.

මතුගම මන්ත්‍රීතුමාත් (අතිල් මුණසිංහ මහතා) නැගෙනහිර අනුරාධපුර මන්ත්‍රීතුමාත් (යසපාල හේරත් මහතා) ඉතාම වැදගත් අදහස් කීපයක් මේ සභාව ඉදිරියේ තැබූ බව මට මතක් වෙනවා. සමූපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්නට නම්, නවත් දියුණු කරන්නට නම් තුන-පහ බඩු ටික විතරක් විකුණා හරියන්නෙ නැහැ, විවිධ ව්‍යාපාර පටන් ගන්න ඕනැය කියා එතුමන්ලා කිව්වා. ඒ මන්ත්‍රීතුමන්ලා දෙපළටත්, අනිකුත් ගරු මන්ත්‍රීවරුන්ටත් මම මතක් කරන්න කැමතියි, සමූපකාර ව්‍යාපාරය, සමූපකාර දෙපාර්තමේන්තුව, විවිධ අංශවලට බැස්සේ දැන් බොහෝ කලකට පෙර බව.

වී මෝල් ගැන කතා කළා. පොලොන්නරු දිස්ත්‍රික්කයට ගිහින් බලන්න. පොලොන්නරු දිස්ත්‍රික්කයේ සමිති නවයක් තිබෙනවා. සමිති නවයෙන් හතක්ම වී මෝල් දමා තිබෙනවා. හිඟුරක්ගොඩ සමූපකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත්චන්ද්‍ර රාජකරුණා මහතා]

සමිතිය ගැන මම විශේෂයෙන්ම කියන්න කැමතියි. මේ සමිතිය 1980 දී වී මිළයට අරගෙන රුපියල් දස ලක්ෂ ගණනක සුද්ධ ලාභයක් ලබා ගෙන තිබුණා. ලැබූ ලාභය වැඩි නිසා, ගොවීන්ට දෙවැනි ගෙවුමකුත් කර තිබෙනවා. ඒ විධියට ගෙවන සමිති හුඟක් තිබෙනවා.

පොල් නිෂ්පාදනය කරන සමිතියක් අපේ තිබෙනවා. ඒ පොල් නිෂ්පාදන කරන ඒ සමිතිය පසුගිය අවුරුද්දේදී රුපියල් දහසය ලක්ෂයක සුද්ධ ලාභයක් ලබා තිබුණා. මා සිතන හැටියට අත්තනගල්ලේ මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ගම්පහ දිසා ඇමතිතුමාත් දන්නවා කොපමණ හොඳට ඒ සමිතිය වැඩ කරගෙන යනවාද කියල.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (තිස්සමහාරාම)**
*(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்—திஸ்ஸமஹாராம)*
(Dr. P. M. B. Cyril – Tissamaharama)
අපටත් දෙන්න බැරිද වී මෝල් ?

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
*(திரு. சரச்சந்திர ராஜகருணா)*
(Mr. Saratchandra Rajakaruna)
හැම කෙනෙකුටම අපට උදව් කරන්නට පුළුවනි. නමුත් තමුන්නාන්සේලා එකක් මතක තබා ගන්න ඕනෑ. අලුතෙන් වී මෝල් ආරම්භ කරනවා නම් ඒවා වී තම්බා කොටන මෝල් විය යුතුයි. මේ රටේ ජනගහනයෙන් සියයට 90 ක්ම තම්බපු හාල්වලටයි කැමති.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
*(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)*
(Dr. P. M. B. Cyril)
නමුත් අපේ ප්‍රදේශවල උදවිය කැකුළටයි කැමති.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
*(திரு. சரச்சந்திர ராஜகருணா)*
(Mr. Saratchandra Rajakaruna)
දැනට තිබෙන මෝල්වලින් මේ රටට ඇති තරම් කැකුළු හාල් නිෂ්පාදනය වෙනවා. එම නිසා අලුතෙන් වී මෝල් ආරම්භ කරනවා නම් ඒවා වී තම්බා කොටන මෝල්ම විය යුතුය යන්නයි අපේ අදහස. ජනගහනයෙන් සියයට 90 ක්ම පාවිච්චි කරන්නේ තැම්බූ හාල්. එමනිසා කවුරුන් හෝ වී තම්බා කොටන මෝල් ආරම්භ කරන්නට ලැස්තිව ඉන්නවා නම් අපි ඒ සියලු දෙනාටම උදව් කරන්නට කැමතියි.

සමුපකාර ව්‍යාපාරය විවිධ අංශවලට යොමු කරන්නය කියාත් ගරු මන්ත්‍රීවරු කිව්වා. අපි දැනටමත් එසේ කර තිබෙනවා. රත්නපුර, කලුතර, ගම්පහ, කොළඹ, කෑගල්ල යනාදී දිස්ත්‍රික්කවල අපි පටන් අරගෙන තිබෙනවා සමුපකාර සමිති මගින් රබර් මිළදී ගන්නට වැඩ පිළිවෙලක්. ඒ සම්බන්ධව දැනට පුහුණු කිරීමේ පන්ති ආරම්භ කර තිබෙනවා. ඇහැළියගොඩ ආසනයේ එවැනි ස්ථානයක් මුල් වරට ආරම්භ කළ අවස්ථාවේදී ඇහැළියගොඩ ගරු මන්ත්‍රීතුමාත් (වෛද්‍යාචාර්ය ලෙනාඩ් කිරිඇල්ල මහතා) ඒකට සහභාගි වුනා. රබර් මිළදී ගැනීමෙන්ම පමණක් අපට ඒ සමුපකාර සමිති පවත්වාගෙන යන්නට පුළුවනි. මතුගම මන්ත්‍රීතුමා (අතිල් මූණසිංහ මහතා) මතුගම සමුපකාරයක් ගැන මතක් කළා. ඒ මන්ත්‍රීතුමාට මා කියන්නට කැමතියි, ඔය පුහු මත අත්හැර ඒ සඳහන් කළ සමුපකාර සමිතියේ සාමාජිකයනුත් සමග එකතුවී ඒ උදවිය සමඟ අත්වැල් බැඳගෙන ඒ සමිතිය දියුණුකර ගන්නට අත දෙන්නය කියා. පාර්ලිමේන්තුවේදී හෝ ඉන් පිටත වේදිකාවේදී හෝ ඔය විධියට කථා නොකර ඒ ජනතාව සමග එක්ව සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්නට අත දෙන්න. ඒ සඳහන් කළ මතුගම සමුපකාර සමිතිය හරියට කළොත් රබර් මිළදී ගැනීමෙන් පමණක් එය ගෙන යන්නට පුළුවනි. මම දන්නවා මතුගම ප්‍රදේශයේ කෝටි ගණන් උපයන පෞද්ගලික වෙළඳුන් සිටින බව. රබර් පිටරට පටවන වෙළඳුන් සිටින බව. ඔය පුහු මත අත්හැර අප සමග එක් වී මතුගම ප්‍රදේශයේ සමුපකාර සමිතිවල සාමාජිකයන් සමග එක් වී ඒ සමිති දියුණු කරන්නට කටයුතු කරන මෙන් මා ඒ ගරු මන්ත්‍රීතුමාගෙන් නැවතත් ඉල්ලා සිටින්නට කැමතියි.

එවාගේම සුළු ගොවීන් තහා සිටුවීමටත් අපි වැඩ පිළිවෙලක් ආරම්භ කර තිබෙනවා. දැනට අපි සුළු ගොවීන් 1,400 ක් පමණ පුහුණු කරගෙන යනවා. අපට මේවාට විදේශාධාර ලැබෙනවා. මේ රටේ සිංහලයින්, සමුපකාර දෙපාර්තමේන්තුවේ සේවය කළ අපේ නිලධාරි මහත්වරු අද විදේශ රටවලට ගිහින් අපට උදව් කරනවා. අපට වෙනත් රටවලින් මුදල් සහ ආධාර ලබා දෙනවා. අපේ හිටපු කොමසාරිස්වරයෙකු වූ ඕල්කට් ගුණසේකර මහත්මයාත් මේ නොබෝද අපේ මේ පුහුණු කිරීමේ වැඩ පිළිවෙලවල්වලට සමහර විදේශ රටවලින් මුදල් සොයා දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත යටතේ උසාවියට නඩු ඉදිරිපත් කරන්නට—ඒ නඩු මෙහෙය වන්නට—සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට බැරිය කියා එක් ගරු මන්ත්‍රීවරයෙකු කිව්වා. අපි දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුව සමග සහයෝගයෙන් උසාවිවල කටයුතු ගැන අපේ නිලධාරීන් පුහුණු කරගෙන යන බව මා කියන්නට කැමතියි. ඒක ඒතරම් අමාරු දෙයක් නොවෙයි. ඒවාගේම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කළයුතු තවත් කාරණයක් තිබෙනවා.

ඇහැළියගොඩ ගරු මන්ත්‍රීතුමා (ලෙනාඩ් කිරිඇල්ල මහතා) අර්ථසාධක මුදල් ගැන කථා කළා. ඒ වතු අංශවල තිබෙන සමුපකාර සමිතිවල සේවකයින්ට පසුගිය රජය කාලයේදී අර්ථසාධක මුදල් ගෙවා නැත. ඒ අයට ඉන්දියාවට යන්න විධියක් නැතුව ඉන්නවාය,ඒ නිසා මේ ගෙවීම් කරන්නය කියා එතුමා ඉල්ලීමක් කළා. මේ ගැන මතක් කරන විට මට මතක් වෙනවා—කොළඹ දිසා ඇමතිතුමා ඉන්නවාද දන්නෙ නැහැ—එතුමාගේ කොට්ඨාශයේ චිත්‍රපටි නිෂ්පාදන කර්මාන්තය සඳහා ඇති කර තිබුණ සමුපකාර සමිතියක් ගැන. එහි පොත් පත් අදවනතුරුම සොයා ගන්න බැහැ. ජේන ඇරලවත් සොයා ගන්න බැහැ. මේ කටයුත්ත කර තිබෙන්නේ ඇමතිවරයෙකුගේ බිරිඳක්. ඒ වගේම නියෝජ්‍ය ඇමතිවරයෙක්. අප මේ දෙගොල්ලන්ම කැඳෙව්වා. නමුත් පොත් පත්වලට වෙච්ච දෙයක් නැහැ. මේවාට සම්බන්ධ වන අයට මේ නීතියත් මදිය කියලයි මගේ විශ්වාසය. අපේ බිබිලේ ගරු මන්ත්‍රීතුමා—නියෝජ්‍ය ඇමතිතුමා—කිව්වා මේ නීති දරදඬු වැඩිය,පරෙස්සම්වෙන්න ඕනෑය, කොමසාරිස්තුමා වගකියන්න ඕනෑය කියා. මම කියන්න කැමතියි මේ නීති රීතිවලට කිසිම කෙනෙක් භය වෙන්න ඕනෑ නැති බව. ඕනෑම කෙනෙකුට අභියාචනයක් කරන්න පුළුවන් මේ නීතියට විරුද්ධව. ඕනෑම කෙනෙකුට දඬුවම්වලට විරුද්ධව අභියාචනා කරන්න පුළුවන් විත්තිය මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමතියි.

ගරු මන්ත්‍රීවරුන් කීප පලක්ම කිව්වා නිදහස් ආර්ථිකය නිසා මේ ව්‍යාපාරයට පහරක් වැදුණාය කියා. මම විශේෂයෙන් කියන්න කැමතියි නිදහස් ආර්ථිකය නිසයි පසුගිය කාල පරිච්චේදය තුළ සිදු වූ අවාසනාවන්ත සිද්ධීන්වලදී අපට සහනයක් සැළසුණේ කියා. මේ රටේ ජනතාව තුළ බියක් තිබුණා පසුගිය ආණ්ඩු කාලයේදී වාගේ, 1971 සිද්ධිවලදී වාගේ බඩගින්නේ ඉන්න වේවි කියා. හුඟාක් දෙනෙක් පෝලිම් ගැහෙන්න පටන් ගත්තා, කඩ ඉදිරිපිට. නමුත් මේ නිදහස් ආර්ථිකය නිසයි අපට පුළුවන්කමක් ඇති වුණේ ඇත්ත වශයෙන්ම මහජනතාවට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ලබා දීමට.

මෙම නිදහස් ආර්ථිකය සමුපකාර ව්‍යාපාරයට බාධාවක් නම් මම අහන එකම ප්‍රශ්නය සියයට 50ක් සමිති ලාබෙට දුවන්නත්, සියයට 50 ක් සමිති පාඩුවට දුවන්නත් හේතුව මොකක්ද කියායි. නිදහස් ආර්ථිකයට භය වෙන්න ඕනෑ නැහැ. නිදහස් ආර්ථිකයත් එක්ක සටන් කරන්න පුළුවනි. ඒ නිසයි අපට වුවමනා කරන්නේ මේ ව්‍යාපාරය තුළට හොඳ පිරිසක් ඇතුළු කර ගැනීමට. ඒ පිරිස ඇතුළු කර ගැනීමේ දී අපේ ගරු මන්ත්‍රීවරු පැහැදිලි කර ඇහැව්වා මේ රුපියලේ සාමාජිකත්වය ගැන. මම කියන්න කැමතියි තමුන්නාන්සේලාට මේ සංශෝධනයෙන් බලතල දී තිබෙන බව රුපියල් දහයේ සාමාජිකත්වය ලබා දීමට වැඩ පිළිවෙලක් ඇති කර ගැනීමට. මහ සභාවේ කැමැත්ත අනුව එය කරන්න පුළුවන්. එපමණක් නොවෙයි, රු. 50 ක් නැත්තම් රු. 100 ක් දක්වා සාමාජික මුදල වැඩි කර ගන්නත් මහා සභාවට බලතල දී තිබෙනවා. දැන් තමුන්නාන්සේලා සාමාජිකයන් නම් තමුන්නාන්සේලා මහා සභාව රැස් කළ අවස්ථාවේදී යෝජනා කරන්න සාමාජික මුදල වැඩි කරන්නය කියා. අපි ඒ කටයුත්තට බලය දී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ නිසා මම හිතන්නෙ මේ ගැන කවුරුත් භය වෙන්න ඕනෑ නැහැ. හුඟාක් දෙනෙක් මේ නීති රීති ගැන දන්නෙ නැහැ. මේ නීති රීති ගැන ඒ නිලධාරීන් සමග සාකච්ඡා කර පැහැදිලි කර ගත්තොත් මීට වඩා ක්ට්ටු සම්බන්ධයක් ඇතිව වැඩ කටයුතු කරන්න පුළුවන් වෙනවා.

මම ස්තුතිවන්ත වෙනවා, අපේ වෙළඳ නියෝජ්‍ය ඇමතිතුමාට එතුමා. ලස්සණට මේ සංශෝධන එකින් එක ගෙන පැහැදිලි කර දීම ගැන. විශේෂයෙන්ම හොඳ සමිතියක් ගැන මතක් වන විට මතක් වෙනවා—මාතර දිසා ඇමතිතුමා සමිතියේ නම කිව්වේ නැහැ—එතුමාගේ කොට්ඨාශයේ තිබෙන මොරවක් කෝරළේ තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය. එය ඉතාමත්ම හොඳින් ගෙන යන සමුපකාර සමිතියක්. එවැනි හොඳ සමිති තිබෙනවා.

ගරු ජේෂකර්ම නියෝජ්‍ය ඇමතිතුමාත් සඳහන් කළ පරිදි දේශපාලන ඇඟිලි ගැසීම් වශයෙන් නොවෙයි, සමුපකාරිකයන් හැටියට ඒවාට අත දී මේ ව්‍යාපාරය දියුණු කර ගන්නට ආධාර කරන්නය කියා තමුන්නාන්සේලා සියලු දෙනාගෙන්ම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 6.21

**ගාමිනී ජයසූරිය මහතා (කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා සහ ආහාර හා සමුපකාර ඇමතිතුමා)**

*(திரு. காமனி ஜயசூரிய—விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சரும் உணவு, கூட்டுறவு அமைச்சரும்)*

(Mr. Gamani Jayasuriya – Minister of Agricultural Development & Research and Minister of Food and Co-operatives)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නියෝජ්‍ය ඇමතිතුමා එතුමාගේ කථාවේදී අපේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ සෑම කරුණකටම වගේ පිළිතුරු දී තිබෙනවා; කරුණු පැහැදිලි කර තිබෙනවා. ඒ නිසා නැවත වරක් ඒ කරුණු ගැනම කථා කර්නට තමුන්නාන්සේලාගේ කාලය ගන්නට වුවමනාය කියා මා හිතන්නේ නැහැ.

අදත් ඊයේත් මේ ගරු සභාවේ ඇති වූ කථා ගැන කල්පනා කරන විට මට පෙනී යන්නේ තමුන්නාන්සේලා සියලු දෙනාගේම සම්පූර්ණ සහයෝගය මේ පනතට ලැබෙන බවයි. එසේ මෙයට සහයෝගය දීමෙන් තමුන්නාන්සේලා ගෞරව කරන්නේ හිටපු ආහාර හා සමුපකාර ඇමති තුමාටයි; පරලෝ සැපත් හේරත් ඇමතිතුමාටයි. මේ අවස්ථාවේදී තමුන්නාන්සේලා ඒ අන්දමට ක්‍රියා කිරීම ගැන මා ස්තුති වන්ත වෙනවා; සන්තෝෂ වෙනවා.

මුලදී මා කළ කථාවේදී මම දීර්ඝ වශයෙන් කරුණු සඳහන් කළා. මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන ගැන ඒ අවස්ථාවේ මා පැහැදිලි කර දුන්නා. ඊට පසුව තමයි, තමුන්නාන්සේලා ඒ ගැන කථා කළේ. ඒ කථාවලින් අපට පෙනී ගියා, අර මා මුලින් කී අන්දමට ඒ සෑම සංශෝධනයක්ම පිළිගැනීමට තමුන්නාන්සේලා සූදානම් බව. අපි ඒ සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ ඉතාමත්ම වැදගත්වූත්, අවශ්‍යවූත් මේ ආයතනය ආරක්ෂා කිරීම පිණිසයි. කොයි තරම් නීති රීති ගෙනාවත් එයින් යම් කිසි ප්‍රයෝජනයක් ලබා ගන්නට නම් ඒවා ගැන කටයුතු කරන පිරිස හරියාකාර කටයුතු කරන්නට ඕනෑ. මෙය ලෙහෙසි පහසු වැඩක් නොවෙයි.

තමුන්නාන්සේලා නොයෙක් අවස්ථාවලදී සමුපකාර ව්‍යාපාරයට නැත්නම් සමුපකාර සමිතිවලට චෝදනා කර තිබෙනවා. නොයෙක් අකටයුතු දේ සිදු වෙනවාය කියනවා. නොයෙක් 'ලීක්' තිබෙනවා කියනවා. ඒ නිසා මුළු රටේම මේ අන්දමට පවත්නා ව්‍යාපාරයක් සකස් කිරීම ලෙහෙසි නැහැ. ඒ නිසයි, තදබල නීති වගයක් ගෙනැවිත් තිබෙන්නේ. ඒවා අපි ක්‍රියාත්මක කරන්න යන විට බොහොම කල්පනාකාරී වන්න ඕනෑ. ලොකු වගකීමක්. අපේ කොමසාරිස්තුමාත් අපේ නිලධාරි මහත්වරුත් ඒ වගකීමේ තිබෙන බරපතලකම තේරුම් ගෙන ක්‍රියා කරනවාට කිසිම සැකයක් නැහැ. ඒවා එසේ කරන්නට අපි සියලු දෙනාම—විශේෂයෙන්ම දේශපාලනයේ යෙදී සිටින අපි, මන්ත්‍රීවරු—බොහොම ඉවසිල්ලෙන් කල්පනාවෙන් කටයුතු කරන්නට ඕනෑ. එකම පරමාර්ථයක් හිතේ තබා ගෙන. ඒ පරමාර්ථය නම් මේ මහජන ව්‍යාපාරය සාර්ථක කර ගැනීමයි. සමහරවිට එය ලෙහෙසි දෙයක් වන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ හිතවත් උදව්ය ඇවිත් නොයෙක් දේවල් කියනවා. එසේ කී පළියට ඒ සෑම දෙයක්ම භාර ගන්න එපා. තමුන්නාන්සේලා ජාති ප්‍රේමීන් හැටියට ඒවා ගැන කල්පනා කරන්න. අපි මේ පාර්ලිමේන්තුවට ඇවිත් සිටින්නේ ජනතාවගේ පොදු යහපත සඳහා කටයුතු කරන්නයි. ඒ නිසා අපි ඒ අන්දමට කටයුතු කරන්නට සූදානම් විය යුතුයි. ඉවසිල්ලෙන් ක්‍රියා කළ යුතුයි.

මේ නීති රෙගුලාසි අද සම්මත වුණාය කියා, මාසයකින්, දෙකකින් එක පාරටම මේ තත්ත්වය වෙනස් වන්නේ නැහැ. හෙමින් සීරුවේ, හොඳ අත්තිවාරමක් උඩ ව්‍යාපාරය ගොඩනගන්නට ඕනෑ. එහෙම කළොත් පමණයි, නිසි ප්‍රයෝජන මෙයින් ලබා ගන්නට පුළුවන් වන්නේ. ඒ අනුව මගේ වගකීම් සාධාරණ අන්දමින් ඉටු කරන්නට විශේෂ මහන්සියක් දරන බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ සඳහා තමුන්නාන්සෙලාගේ සහයෝගය මට ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා. තමුන්නාන්සේලාගේ සහයෝගය, හොඳහිත, ඉවසිල්ල, කරුණාව මට ලැබෙනවාට කිසිම සැකයක් නැහැ. දැන් මම ඉතාමත් සන්තෝෂයෙන් මේ සංශෝධන පනත තමුන්නාන්සේලාගේ අනුමැතිය ලබා ගන්නට තමුන්නාන්සේලා ඉදිරිපිට තබනවා.

ඒ සමගම, මම මගේ නියෝජ්‍ය ඇමතිතුමාටත්, ලේකම්තුමාටත්, කොමසාරිස්තුමාටත්, අධ්‍යක්ෂවරුන්ටත්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ටත්, මගේ දෙපාර්තමේන්තුවල සේවය කරන සෑම කෙනකුටමත් මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම නීතිපතිතුමාටත් ඒ අංශයේ අනෙක් සියලු පිරිසටත් අපේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. දැන් මම මේ සංශෝධන පනත සම්මත කරන ලෙස තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக **மதிப்பிடப் பெற்றது.***

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

*මතු පළ වන යෝජනාව සභාසම්මත විය:*

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය—*[ගාමිනී ජයසූරිය මහතා.]*

*தீர்மானிக்கப்பட்டது :*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." [திரு. காமினி ஜயசூரிய.]*

*Resolved :*

"That the Bill be referred to a Committee of the whole Parliament." – [*Gamani Jayasuriya*]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

*[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் ஆராயப்பட்டது.*

*[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

[MR. DEPUTY SPEAKER *in the Chair.*]

*1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*1 ஆம் வாசகத்திலிருந்து 4 ஆம் வாசகம்வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

Clauses 1 to 4 ordered to stand part of the Bill.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

5 වන වගන්තිය—(ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම)

**வாசகம் 5.**—(*முதன்மைச் சட்டவாக்கத்தின் 44 ஆம் பிரிவைத் திருத்துதல்*)

CLAUSE 5.–(*Amendment of Section 44 of the Principal Enactment*)

ගාමිනී ජයසූරිය මහතා
(*திரு. காமினி ஜயசூரிய*)
(Mr. Gamani Jayasuriya)

I move,

"In page 3 leave out all the words in lines 8 to 16 and insert the following : 'and be entitled to examine all books, documents, accounts and papers, securities and cash in hand of a registered society and every person in charge of or maintaining or having possession of the aforesaid shall produce them to the Registrar or such authorised person or furnish such information in regard to the transactions and working of the society as the Registrar or the authorised person making such inspection or audit may require–' ;"

*සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*5 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Amendment put, and agreed to.*

*Clause 5, as amended , oredred to stand part of the Bill.*

6 වන වගන්තිය—(ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම)

**வாசகம் 6.**—(*முதன்மைச் சட்டவாக்கத்தின் 46 ஆம் பிரிவைத் திருத்துதல்*)

CLAUSE 6.–(*Amendment of Section 46 of the Principal Enactment*)

ගාමිනී ජයසූරිය මහතා
(*திரு. காமினி ஜயசூரிய*)
(Mr. Gamani Jayasuriya)

I move,

"In page 3, line 40, leave out the words 'where there is reason' and insert the words 'where he has reason' "

*සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

*6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*6 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clause 6, as amended , ordered to stand part of the Bill.*

7 වන වගන්තිය—(ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම)

**வாசகம் 7.**—(*முதன்மைச் சட்டவாக்கத்தின் 47 ஆம் பிரிவைத் திருத்துதல்*)

CLAUSE 7.–(*Amendment of Section 47 of the principal enactment.*)

ගාමිනී ජයසූරිය මහතා
(*திரு. காமினி ஜயசூரிய*)
(Mr. Gamini Jayasuriya)

I move,

"In page 4, line 25, leave out the words 'where there is reason' and insert the words 'where he has reason' "

*සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

*7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*7 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clause 7 as amended, ordered to stand part of the Bill.*

*8 සහ 9 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*8 ஆம் 9 ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clauses 8 & 9 ordered to stand part of the Bill.*

10 වන වගන්තිය—(ප්‍රධාන ප්‍රඥප්තියේ 48 (අ) අලුත් වගන්තිය ඇතුළත් කිරීම)

**வாசகம் 10.**—(*முதன்மைச் சட்டவாக்கத்தின் 48 (அ) எனும் புதிய பிரிவை உட்புகுத்துதல்*)

CLAUSE 10.–(*Insertion of new section 48A in the principal enactment.*)

ගාමිනී ජයසූරිය මහතා
(*திரு. காமினி ஜயசூரிய*)
(Mr. Gamani Jayasuriya)

I move,

(1) "In page 6, leave out all the words in line 20 and insert the following : 'such officer or employee from office :

Provided that any employee aggrieved by an Order of removal made under this sub-section, may appeal therefrom to the Co-operative Employees Commission established under Act, No. 12 of 1972 within a period of thirty days, and the decision of such Commission shall be final.' ;"

" (2) In page 6, leave out all the words in line 22 and insert the following : 'removed under sub-section (1) and where such Order for removal has been affirmed by the Co-operative Employees Commission or no appeal against such Order has been preferred within thirty days, another Officer.' "

*සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

*10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*10 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clause 10 as amended, ordered to stand part of the Bill.*

11 වන වගන්තිය.—(ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම)

**வாசகம் 11.**—(*முதன்மைச் சட்டவாக்கத்தின் 49 ஆம் பிரிவைத் திருத்துதல்*)

CLAUSE 11.–(*Amendment of section 49 of the principal enactment.*)

ගාමිනී ජයසූරිය මහතා
(*திரு. காமினி ஜயசூரிய*)
(Mr. Gamani Jayasuriya)

I move,

"In page 6, line 32, immediately after the words 'an application' insert the words 'for its dissolution'."

*සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

11 ஆம் வாசகம், திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.

*Clause 11, as amended, ordered to stand part of the Bill.*

12 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

12 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.

*Clause 12 ordered to stand part of the Bill.*

**13 වන වගන්තිය.–(ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම)**

**வாசகம் 13.**—(முதன்மைச் சட்டவாக்கத்தின் 61 ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 13.–(*Amendment of section 61 of the principal enactment.*)

ගාමිනී ජයසූරිය මහතා
(திரு. காமினி ஜயசூரிய)
(Mr. Gamani Jayasuriya)

I move,

"In page 7, line 16, leave out the word 'for' and insert 'of';"

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Amendment put, and agreed to.*

13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

13 ஆம் வாசகம், திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.

*Clause 13, as amended, ordered to stand part of the Bill.*

**14 වන වගන්තිය.–(ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම)**

**வாசகம் 14.**—(முதன்மைச் சட்டவாக்கத்தின் 66 ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 14.–(*Amendment of section 66 of the principal enactment.*)

ගාමිනී ජයසූරිය මහතා
(திரு. காமினி ஜயசூரிய)
(Mr. Gamani Jayasuriya)

I move,

"In page 7, leave out all the words in lines 33 and 34 and insert the following :

'(*a*) by the substitution for the words 'by the Society', of the words 'by the Registrar'; and ;"

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Amendment put, and agreed to.*

14 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

14 ஆம் வாசகம், திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.

*Clause 14, as amended, ordered to stand part of the Bill.*

**15 වන වගන්තිය.–(ප්‍රධාන ප්‍රඥප්තියේ 66අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම)**

**வாசகம் 15.**—(முதன்மைச் சட்டவாக்கத்தின் 66(அ) எனும் புதிய பிரிவைத் உட்புகுத்துதல்)

CLAUSE 15.–(*Insertion of new section 66A in the principal enactment.*)

ගාමිනී ජයසූරිය මහතා
(திரு. காமினி ஜயசூரிய)
(Mr. Gamani Jayasuriya)

I move,

"In page 8, leave out all the words in line 18 and insert : 'such purpose:

Provided that the number of such nominated members shall be less than one half of the total number of members of such Committee'."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Amendment put, and agreed to.*

15 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

15 ஆம் வாசகம், திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.
*Clause 15, as amended, ordered to stand part of the Bill.*

16 සිට 20 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

16 ஆம் வாசகத்திலிருந்து 20 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.
*Clauses 16 to 20 ordered to stand part of the Bill.*

**21 වන වගන්තිය.–(ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම)**

**வாசகம் 21.**—(முதன்மைச் சட்டவாக்கத்தின் 75 ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 21.–(*Amendment of section 75 of the principal enactment.*)

ගාමිනී ජයසූරිය මහතා
(திரு. காமினி ஜயசூரிய)
(Mr. Gamani Jayasuriya)

I move,

"In page 10, leave out all the words in lines 10 to 16 and insert :

'officer' includes every person who is the president, Vice president, Chairman, Vice Chairman, Secretary, Treasurer or Manager of a Society or any branch thereof, or a member of the Committee of a Society and any other person who is duly empowered to give directions in regard to the affairs of the Society'."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Amendment put, and agreed to.*

21 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

21 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.
*Clause 21, as amended, ordered to stand part of the Bill.*

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.
***Enacting Clause and Title ordered to stand part of the Bill.***
***Bill reported with Amendments.***

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාමිනී ජයසූරිය මහතා
(திரு. காமனி ஜயசூரிய)
(Mr. Gamani Jayasuriya)

I move,

"That the Bill, as amended be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.

*Question put, and agreed to.*

*Bill as amended accordingly read the Third time and passed.*

## මුස්ලිම් කාන්තා සමාජ කවය (ලංකා) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

### முஸ்லிம் பெண்களின் சமூக லீக் (இலங்கை) (கூட்டிணைத்தல்) சட்டமூலம்

## MUSLIM WOMEN'S SOCIAL LEAGUE (CEYLON) (INCORPORATION) BILL

පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවේදී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

(நிலையற் குழுவில்) திருத்தப்பட்டவாறு, பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order for Consideration, as amended (in the Standing Committee), read.*

එම්. එච්. එම්. නයිනා මරික්කාර් මහතා (නියෝජ්‍ය මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා)
(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்—நிதி, அமைப்புத் திட்டப் பிரதி அமைச்சர்)
(Mr. M. H. M. Naina Marikar–Deputy Minister of Finance & Planning)

I move,

"That the Report of the Standing Committee be accepted."

ජබීර් ඒ. කාදර් මහතා (මැද කොළඹ දෙවන)
(ஜனாப் ஜாபிர் ஏ. காதர்—கொழும்பு மத்தி இரண்டாம் அங்கத்தவர்)
(Mr. Jabir A. Cader–Second Colombo Central)

විසින් ස්ථිර කරන ලදී.
அனுவதித்தார்.
*seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

එම්. එච්. එම්. නයිනා මරික්කාර් මහතා
(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்)
(Mr. M. H. M. Naina Marikar)

I move,

"That the Bill, as amended, be now read the Third time."

ජබීර් ඒ. කාදර් මහතා
(ஜனாப் ஜாபிர் ஏ. காதர்)
(Mr. Jabir A. Cader)

විසින් ස්ථිර කරන ලදී.
அனுவதித்தார்.
*seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.

*Question put, and agreed to.*

*Bill as amended accordingly read the Third time and passed.*

## ලජ්නාතුල් මස්ජිදුල් ජමියා සෙයිලන් සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

### லஜ்னத்துல் மஸ்ஜிதுல் ஜாமியா ஸைலான் (கூட்டிணைத்தல்) சட்டமூலம்

## LAJNATHUL MASJIDUL JAMIYA SALIAN (INCORPORATION) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.

இரண்டாம் மதிப்பீடுகான கட்டளை வாசிக்கப்பட்டது.

*Order for Second Reading read.*

එම්. එච්. එම්. නයිනා මරික්කාර් මහතා
(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்)
(Mr. M. H. M. Naina Marikar)

I move,

"That the Bill be now read a Second time."

ජබීර් ඒ. කාදර් මහතා
(ஜனாப் ஜாபிர் ஏ. காதர்)
(Mr. Jabir A. Cader)

විසින් ස්ථිර කරන ලදී.
அனுவதித்தார்.
*seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්. 48 (3) වන ස්ථාවර නියෝගය යටතේ, නියෝජ්‍ය කථානායකතුමා විසින් එය "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

சட்டமூலம், இதன்படி இரண்டாம் முறை மதிப்பிடப்பட்டு, நிலைக் கட்டளை 48(3) இன்படி. நிலைக் குழு "பி" க்கு பிரதிச் சபா நாயகர் அவர்களால் சாட்டப்பட்டது.

*Bill accordingly read a Second time and allocated by* MR. DEPUTY SPEAKER *to Standing Committee "B" under Standing Order 48 (3).*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ආනයන හා අපනයන (පාලන) පනත: නියෝග

### இறக்குமதி, ஏற்றுமதி (கட்டுப்பாட்டு)ச் சட்டம்: ஒழுங்குவிதிகள்

## IMPORT AND EXPORT (CONTROL) ACT : REGULATIONS

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශවයේ ප්‍රධාන සංවිධායකතුමා)**

*(திரு. எம். வின்சன்ற் பெரேரா—பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)*

(Mr. M. Vincent Perera–Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

On behalf of the Minister of Trade and Shipping, I move,

"That the Regulations made by the Minister of Trade and Shipping by virtue of powers vested in him under Section 4(3), 14 and 20 of the Import and Export (control) Act, No. 1 of 1969 and published in the Gazette Extraordinary of the Democratic Socialist Rapublic of Sri Lanka, No. 247/6 of 31st May 1983 and presented on 21.07.1983 be approved."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## පරිපූරක මුදල් : කිරින්ද ධීවර වරාය යෝජනා ක්‍රමය

### குறைநிரப்புத்தொகை : கிரிந்த கடற்றொழில் துறைமுக வேலைத்திட்டம்

## SUPPLEMENTARY SUPPLY : KIRINDA FISHERY HARBOUR PROJECT

**පෙස්ටස් පෙරේරා මහතා (ධීවර ඇමතිතුමා)**

*(திரு. பெஸ்ரஸ் பெரேரா—கடற்றொழில் அமைச்சர்)*

(Mr. Festus Perera– Minister of Fisheries)

I move,

"That a Supplementary sum not exceeding Rupees fifty million (Rs. 50,000,000) be payable out of the Consolidated Fund of the Democratic Socialist Republic of Sri Lanka, or any other Fund or moneys of, or at the disposal of, the Government of the Democratic Socialist Republic of Sri Lanka or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka, for the services of the Financial Year beginning on 01st January, 1983 and ending on 31st December, 1983 and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

| | | *Rs.* |
|---|---|---|
| Head : 136–Minister of Fisheries | | |
| Programme : 1–General Administration and Staff Services | .. | 50,000,000" |

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී*

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

අ.භා. 6.34

**ලක්ෂ්මන් ජයකොඩි මහතා** (අත්තනගල්ල)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—அத்தனகல்ல)*

(Mr. Lakshman Jayakody–Attanagalla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක කාරණයක් ගැන මම ගරු ධීවර ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි. මීගමු දිස්ත්‍රික්කයේ විශාල සංඛ්‍යාවක් සිටින්නේ සංක්‍රමණ ධීවර කාර්මිකයන් බව නමුන්නාන්සේ දන්නවා. නයාරුවල, කොකිලාල්, ත්‍රිකුණාමලය, මුලතිව් පැත්තේ යන අතරම පේසාලේ පැත්තේත් ඒ වාගේම තලෙයිමන්නාරම් තුඩුවේත්, මුල්ලිකුළම, වන්සාලේ, පිලාවතුරේ යන ප්‍රදේශවලටත් මේ අය යනවා. මේ මෑතක සිට යම් යම් ප්‍රශ්න ටිකක් උතුරේ පැන නැගී තිබෙන නිසා සංක්‍රමණ ධීවර කාර්මිකයන්ගේ ආරක්ෂාව සඳහා දැන් සිටම පියවර ටිකක් ගැනීම ගැන මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි. මෙය ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. ඈත අතීතයේදී යම් යම් ප්‍රශ්නවලට තුඩු දුන් නමුත්, මෙය සාමකාමීව තබා ගැනීමට දැන් සිටම පියවර ගත්තොත් ප්‍රදේශවාසීන්ට විශාල ප්‍රයෝජනයක් වන බව මම එතුමාට මතක් කරන්නට කැමතියි. එම කාරණය ගැන ගරු ඇමතිතුමා සලකා බලාවි යයි මම විශ්වාස කරනවා.

අ.භා. 6.35

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා** (තිස්සමහාරාම)

*(வைத்திய கலாநிதி பீ. எம். பீ. சிறில்—திஸ்ஸமஹாராம)*

(Dr. P. M. B. Cyril–Tissamaharama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධීවර ඇමතිතුමා විසින් රුපියල් පන් කෝටියක පරිපූරක මුදලක් ඉල්ලා ඇති මේ කාරණය සම්බන්ධනයෙන් මේ අවස්ථාවේදී මම වචන ස්වල්පයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. මට දැනගන්නට ලැබී තිබෙන පරිදි ගරු ඇමතිතුමා මෙම රුපියල් පන් කෝටිය ඉල්ලන්නේ කිරින්ද ධීවර වරායේ වැඩ කටයුතු ආරම්භ කරන්නටය කියායි මගේ අදහස.

කිරින්ද තිබෙන්නෙ තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාශයේ නිසාත්, මෙම මුදලින් කිරින්දේ ධීවර සංකීර්ණයක් ඉදි වෙන නිසාත් මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. මේ විධියට මේ මුදල් ලබාගෙන ධීවර සංකීර්ණයේ වැඩ කටයුතු කඩිනමින් කරන්නට අධිෂ්ඨාන කිරීම ගැන විශේෂයෙන්ම එතුමාට මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ධීවර කර්මාන්තයට කාලයක් තිස්සේම නොසැලකිලිමත් තත්ත්වයක් තිබුණා. ධීවර කර්මාන්තයේ යෙදුණු අයට අවශ්‍ය තරම් පහසුකම් නොලැබුණු අවස්ථාවක, ඒ වගේම අවශ්‍ය ආම්පන්න නොලැබුණු අවස්ථාවක මේ ධීවර ඇමතිතුමා පත්වීමත් සමගම එතුමා ඒ ප්‍රදේශයේ ධීවර ජනතාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට පටන් ගත්තා. ඒ වගේම හැම වර්ෂයකම වාරකන් කාලයේදී කුනාටු නිසා හැම වරායකම බෝට්ටු දහයක් පහළොවක් පොඩි පට්ටම් වෙනවා. ඒ නිසා මේ ධීවර වරාය ඉදිවීමෙන් ඒ ප්‍රදේශයේ ධීවර ජනතාවට විශාල පහසුවක් ලැබෙනවා. ඔවුන්ගේ බෝට්ටු, යාත්‍රාවල් ආරක්ෂා කර ගැනීමට විශාල රුකුලක් ලැබෙනවා.

මම මේ අවස්ථාවේදී දීර්ඝ වශයෙන් කතා කරන්නට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ජපන් රටෙන් ලැබෙන ආධාරයක් වශයෙන් මේ පන් කෝටියක මුදල ලබාගෙන මේ ධීවර සංකීර්ණය ඉදි කිරීමට කටයුතු කිරීම ගැන මම නැවත වරක් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. පසුගිය දිනක ගරු ඇමතිතුමා එහි ගොස් මුල්ගල් තබා මෙහි වැඩ ආරම්භ කළා. මා නැවත වරක් එතුමාට ස්තුතිවන්ත වෙමින්, ඒ අතරම මේ ව්‍යාපාරය කඩිනම් කරන ලෙසත් ඒ ප්‍රදේශයේ ජනතාවට ධීවර කර්මාන්තයට අවශ්‍ය දේවල් සපුරා දෙන ලෙසත් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ.භා. 6.35

**ෆෙස්ටස් පෙරේරා මහතා (ධීවර ඇමතිතුමා)**

***(திரு. பெஸ்ரஸ் பெரேரா—கடற்றொழில் அமைச்சர்)***

**(Mr. Festus Perera–Minister of Fisheries)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නීතන්තෙ පොඩි වරදක් හරිගස්සන්නට සිදු වී තිබෙනවා. මේ පත් කෝටියක වරායක් නොවෙයි. රුපියල් දස ලක්ෂ 141 ක ඒ කියන්නෙ, කෝටි 14 ක වරායක්. මේ සංකීර්ණය ඉදි කිරීම සඳහා අපට කෝටි 14 ක් ජපන් රටෙන් ලැබෙනවා. මේ වගේ ඉල්ලීම් කීපයක් මුළු රට තුළින්ම ලැබී තිබෙනවා නමුත් මේ අවස්ථාවේදී මුදල් සීමාව නිසා ඒ හැම එකක්ම ඉදි කරන්නට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මෙය ජපන් රටින් ලැබුණු ආධාරයක්. සම්පූර්ණ ආධාරයක්. සියයට සියක ආධාරයක්. අපෙන් යොදවන්නෙ බොහොම සුළු මුදලක්—දස ලක්ෂ එකක මුදලක්—පමණයි. මේ ගැන විශේෂයෙන්ම අපි ජපන් රජයටත්, ජපන් රටේ ජනතාවටත් ස්තුතිවන්ත වෙන්නට ඕනැ. මේ අවස්ථාවේදී පමණක් නොව, මීත් ඉහතත් අපේ රටේ ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා ජපන් රටෙන් විශාල මුදලක් පරිත්‍යාග කර තිබෙනවා. මේ අවස්ථාවේදීත් කර තිබෙන්නෙ සම්පූර්ණ පරිත්‍යාගයක්. ඒ නිසා ඒ ගැන මම වැඩි දුරට කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ.

ධීවර වරායවල් ඇති කිරීමෙන් ධීවරයින්ට විශාල සහනයක් ලැබෙන බව මම කියන්නට කැමතියි. එහෙම නැත්නම් අත්තනගල්ල මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කිව්වා වාගේ ඔවුන්ට සංක්‍රමණය කරන්නට සිදු වෙනවා. එක් පළාතක මුහුදු යාම කරන්නට බැරිනම් මුහුදු යාම සඳහා වෙනත් ප්‍රදේශයකට යන්නට සිදු වෙනවා. එය වැළැක්වීමට තිබෙන එකම මාර්ග නමයි, බෝට්ටු නවත්වා තැබීම සඳහා තැනින් තැන ධීවර වරායවල් ඇති කිරීම. එවිට සංක්‍රමණය ඒ තරම්ම කරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. වරායකින් බලාපොරොත්තු වෙන්නේ ඒ සංක්‍රමණය නතර කිරීමයි. බෝට්ටු නතර කර තැබීමයි. සංක්‍රමණය කරන්නට සිදු වෙන්නේ එම ප්‍රදේශයේ මුහුදේ මාළු අල්ලන්නට බැරි තත්ත්වයක් ඇතිවීම නිසයි. මුහුද සැර වුණු විට මාළු අල්ලන්න යන්නට නොහැකි වෙනවා. ඒ නිසා වෙනත් ප්‍රදේශයකට යන්නට සිදු වෙනවා.

පසුගිය දවස්වල ඇති වුණු සිද්ධීන් නිසා සංක්‍රමණික ධීවරයින්ට මොන විධියේ ආරක්ෂාවක් අපි ඇති කරනවාද කියා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් අසන්නට යෙදුණා. ඇත්ත වශයෙන්ම මම මේ ගැන යුද හමුදාපති සමගත්, රජයේ අනිකුත් අවශ්‍ය නිලධාරීන් සමගත් සාකච්ඡා කලා. මට පෙනුනා යම් යම් අවස්ථාවලදී ඒ ආරක්ෂාව දිය යුතුය කියා. ඔවුන්ට සම්පූර්ණ ආරක්ෂාව සැලසීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු සලසා තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනැ. පසුගිය දවස්වල සමහර ධීවරයින් යම් බියක් නිසා ආපසු ඇවිත් තිබුණා. නමුත් ඒ උදවියට ආපසු යන්නටය කියා මම ඉල්ලීමක් කලා. දැන් ඒ අය ආපසු යන්නට පටන්ගෙන තිබෙනවා. ඒ අයට සම්පූර්ණ ආර්ක්ෂාව සලසා තිබෙනවා. සංක්‍රමණිකයන් පමණක් නොව ඔවුන්ට අමතරව ස්ථිර පදිංචිකාරයිනුත් ඒ ප්‍රදේශවල ඉන්නවා. දැන් ඒ සංක්‍රමණ තත්ත්වය නැති වෙමින් පවතිනවා.

මේ අවස්ථාවේදී 'සංක්‍රමණික' කියන වචනය අපි පාවිච්චි කල යුතු නැහැ. ඒ උදවියට ස්ථිර තත්ත්වයක් ලබා දී පදිංචි කරවීම සඳහා අපි කටයුතු කර තිබෙනවා. ඒ සියලු දෙනාගේම ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් අපි දැනටමත් කටයුතු කර අවසානයි. ඉදිරියටත් අපි ඒ විදිහට කටයුතු කරගෙන යන බව මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි. ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

***வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.***

*Question put, and agreed to.*

## පරිපූරක මුදල : පුස්කොළපොත් සූක්ෂම චිත්‍රපටිගත කිරීම

### குறைநிரப்புத்தொகை : ஓலைச்சுவடிகளை நுண்ணெளிப் பதிவு செய்தல்

## SUPPLEMENTARY SUPPLY : MICROFILMING OF OLA MANUSCRIPTS

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා (සංස්කෘතික කටයුතු ඇමතිතුමා)**

***(திரு. ஈ. எல். பி. ஹுருள்ளே—கலாசார அலுவல்கள் அமைச்சர்)***

**(Mr. E. L. B. Hurulle–Minister of Cultural Affairs)**

නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"1983 ජනවාරි 01 වෙනිදායින් ආරම්භවී 1983 දෙසැම්බර් 31 වෙනිදායින් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ණයට ලබා ගන්නා මුදලකින්හෝ රුපියල් හයලක්ෂ එකොලොස් දහස් අටසියයකට (රු. 6,11,800) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර, එම මුදල මෙහි පහත පෙනෙන උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | | |
|---|---|---|
| ශීර්ෂය : 165—ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | | රු. |
| වැඩ සටහන : 1—ලේඛනාරක්ෂක සේවා—මූලධන වියදම | ... | 3,42,700 |
| පුනරාවර්තන වියදම | ... | 2,69,100 |
| | | 6,11,800" |

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*

***வினா எடுத்தியம்பப்பெற்றது.***

*Question proposed.*

අ. භා. 6.42

**අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)**

***(திரு. அமரசிறி தொடங்கொட—பத்தேகம)***

**(Mr. Amarasiri Dodangoda–Baddegama)**

නියෝජ්‍ය කථානායකතුමනි, සංස්කෘතික ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් වෙන් කර තිබෙන මුදලේ මදිකම ගැනයි, මම අදහස් ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වන්නේ. රාජ්‍ය ලේඛන ආරක්ෂා කිරීම පිළිබඳව ඇති කර තිබෙන දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ඉල්ලුම් කරන මෙම මුදල්වලින් කොටසක් තමයි, පුස් කොළ පොත් සූක්ෂම චිත්‍රපටගත කිරීමට හෙවත් 'microfilming'කිරීමට අවශ්‍ය මුදලුත් ලබා ගන්නේ. එම නිසා ඒ පිළිබඳවත්, රාජ්‍ය ලේඛන ආරක්ෂා කිරීම පිළිබඳවත් අවධානය කොයි ආකාරයෙන් යොමු කල යුතුද කියන කාරණය ගැන අදහස් කීපයක් මේ ගරු සභාව ඉදිරියේ තබන්න මම බලාපොරොත්තු වෙනවා.

මට මුහුණ පෑමට සිදු වුණු ප්‍රශ්නයක් තුළිනුයි, මම මේ අදහස් දක්වන්නේ. මම රාජ්‍ය ලේඛන ආරක්ෂක දෙපාර්තමේන්තුවට ගිහින් 'බ්‍රේස් ග්‍රේඩිල්' සිද්ධිය පිළිබඳ නඩු තීන්දුව ලබා ගන්නට උත්සාහ කලා. අපේ ඉතිහාසයේ දක්වෙන මූලික මිනිස් අයිතිය පිළිබඳ වැදගත් තීන්දුවක් ගත් නඩුවක් තමයි, එය. නමුත් අද ඒ නඩු තීන්දුව විනාශ වී තිබෙනවා. ඒ වගේම, මෑත කාලයේ තිකුත් වුණු පුවත්පත් කොමිෂන් වාර්තාවත් අද විනාශ වෙමින් පවතිනවා. අපේ සංස්කෘතික පදනම පිළිබඳ ශක්තිමත් තත්ත්වයක් ගොඩනගනවා නම් රාජ්‍ය ලේඛන ආරක්ෂා කිරීම පිළිබඳව විශේෂ උනන්දුවක් දැක්විය යුතුය කියන එකයි අපේ අදහස.

ඒවාගේම පුවත්පත් කොමිෂන් සභාවේ වාර්තාව මොන තරම් වැදගත්ද කිව්වොත් පුවත්පත් කලාවේදීන් ඇතුළුව සාක්ෂි දුන් සැහෙන පිරිසකගේ අදහස්, ඒ කලාවට, වෘත්තියට සහ අයිතීන්ට අදාල දේවල් සැහෙන ප්‍රමාණයක් ඒ වාරතාවේ සඳහන් වී තිබෙනවා. එහෙත් අද ඒ වාර්තාවේ මූලික පිටපත රාජ්‍ය ලේඛනාගාරයේ විනාශ වෙමින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පවතිනවා. ඒ වාගේම ලන්දේසි යුගයේ අට දහසකට කිට්ටු "ඩච් වොලියුම්" මේ දක්වාත් සූක්ෂ්ම චිත්‍රපට ගත කිරීමක් නොකිරීමේ හේතුවෙන් ඒවායේ විනාශය කොයි අවස්ථාවේ ළඟා වේද කියන එක ගැන අපට සැකයක් පවතිනවා. ඉංග්‍රීසි යුගයේ මේ විධියේ ලේඛනවලත් ආරක්ෂාව පිළිබඳව ස්ථිර භාවයක් පෙනෙන්නට නැහැ. මේකට හේතු වී තිබෙන්නේ, රාජ්‍ය ලේඛනාගාරයේ අවශ්‍ය වායුසමීකරණයකින් යුතුව ඒ ලේඛන ආර්ක්ෂා කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වී නොතිබීමයි.

තවත් අනතුරක් අපට පෙනෙනවා. පසුගියදා ඇතිවුණු සිද්ධීන්වලින් වැදගත් චිත්‍රපට රැසක් විනාශ වී යාම පිළිබඳව අදහසක් ඊයේ මේ ගරු සභාවේ ප්‍රකාශ කළා. ඒවාගේම අද අපේ රාජ්‍ය ලේඛනාගාරයේ තිබෙන ලේඛන හැරුණාම තවත් ලේඛනවල මූලික පිටපත් සමහරවිට අපි යටත්ව සිටි විදේශ රාජ්‍යවල තිබෙන්නට පුළුවන්. මේ ලියවිලි තැන්පත්ව ඇති එකම ස්ථානය වශයෙන් තිබෙන රාජ්‍ය ලේඛනාගාරයයි. එහි ඇති ලියවිලි පසුගියදා ඇති වුණු සිද්ධිය වැනි සිද්ධියකදී විනාශයට පත් වුණොත් අපට ඒ පැරණි රාජ්‍ය ලේඛන ආදියෙහි ඉතිරියක් ඇති වන්නේ නැහැ. එමනිසා මේ ඕලන්ද යුගයේ සහ ඉංග්‍රීසි යුගයේ පැරණි ලේඛන සූක්ෂම චිත්‍රපටගත කිරීමක් මගින් වහාම ආරක්ෂා කර ගැනීමට අපි ඉල්ලීමක් කළ යුතුයි. ඒ මොකද, සීගිරි ගලේ සිතුවම්වලට මේවාගේ විනාශයක් සිදු වුණා. අපේ ඓතිහාසික, පෞරාණික සහ සංස්කෘතික වැදගත්කම රැක ගැනීමට පෞද්ගලික සන්තකයේ තිබෙන පුස්කොල පොත් වගේම රාජ්‍ය ලේඛනාගාරයේ තිබෙන ඒ පැරණි ලේඛනත් සූක්ෂ්ම චිත්‍රපටගත කිරීමක් සඳහා මුදලක් යොදවන ලෙස මම මේ ගරු සභාවේදී ඉල්ලා සිටිනවා. ඒවාගේම චිත්‍රපට ඉතිහාසයේ මේ පසුගිය දා සිදු වුණු විනාශය පිළිබඳව සලකන විට සියලුම ලේඛන එක තැනක තිබීමෙන් එම ස්ථානයට විනාශයක් සිදුවීම වැළැක්වීම සඳහා විශේෂ පියවරක් ගත යුතුව තිබෙනවා.

ඒ වාගේම මම මේ අසවිථාවේදී තවත් කාරණයක් මතක් කරන්නට කැමතියි. ගරු අධිකරණ ඇමතිතුමා ස්ථිර ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කරන අවස්ථාවේ රාජ්‍ය ලේඛනාගාරයේ කටයුතු පිළිබඳව සොයා බැලීමට පසුගිය රජය විසින් කොමිෂන් සභාවක් පත් කරනු ලැබුවා. එම කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳව මතක් කරන අතර, එම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් ඇතැම් නිලධාරි මහත්වරුන් සහ සේවක පිරිස් ඒ අය සිටි මට්ටම්වලින් පහත හෙළීමෙන් දඬුවම් කිරීම පිළිබඳවත් මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුව තිබෙනවා.

එමනිසා ෆෝඩ් පදනම වැනි විදේශීය ආයතනයක් මගින් වෙන් කරන මුදලක් යොදවා පෞද්ගලික සන්තකයේ තිබෙන පුස්කොල පොත් සූක්ෂ්ම චිත්‍රපට ගත කරන්නා වගේම රාජ්‍ය ලේඛනාගාරයේ තැන්පත්ව තිබෙන ලියවිලිවල වැදගත්කම සලකා, එහි තිබෙන විනාශ වී යා හැකි ඓතිහාසික ලියවිලි, අපේ ඉතිහාසයට වැදගත් වන ලියවිලි, සූක්ෂ්ම චිත්‍රපටගත කිරීම සඳහා මුදලක් වෙන් කිරීම ගැනත් සලකා බලන ලෙස මම නැවතත් ඉල්ලා සිටිනවා. 'ෆෝඩ්' පදනම මගින් මෙම මුදල වෙන් කර අපේ පෞද්ගලික සන්තකයේ තිබෙන පුස්කොල පොත් චිත්‍රපටගත කරන අතරම කවර කොන්දේසියක් රාජ්‍ය ලේඛනවල ආරක්ෂාව සඳහා අපට දී තිබෙනවාද කියන එක ගැනත් අපි දැන ගන්නට කැමති බව මතක් කරමින්, ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ මේ යෝජනාවට සහාය දක්වමින්, ඒ මුදල පුළුවන් තරම් වැඩි කර අපේ ගරු රාජ්‍ය ලේඛනාගාරයේ තිබෙන සියලු ලේඛන ආරක්ෂා කිරීම සඳහා සූක්ෂ්ම චිත්‍රපටගත කරන ලෙස ඉල්ලමින් මම නිශ්ශබ්ද වෙනවා.

අ. භා. 6.48

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා (සංස්කෘතික කටයුතු ඇමතිතුමා)**
*(திரு. ஈ. எல். பி. ஹுருள்ளே—கலாசார அலுவல்கள் அமைச்சர்)*
(Mr. E. L. B. Hurulle–Minister of Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැදගත් කාරණා ස්වල්පයක් ඉදිරිපත් කිරීම ගැන බද්දේගම ගරු මන්ත්‍රීතුමාට (අමරසිරි දොඩන්ගොඩ මහතා) මා ස්තුතිවන්ත වෙනවා. රාජ්‍ය ලේඛනාගාරයේ තිබෙන ලේඛණ යනාදිය ආරක්ෂා කිරීම පිණිස වායු සමීකරණය කළ ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා අපේ අතිගරු ජනනාධිපතිතුමා 1965-70 කාලය තුළ රාජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කරණ කාලයේදී එතුමා විසින් මුල්ගල තැබූ බව මා මතක් කර දෙන්නට කැමතියි. භාණ්ඩාගාරයෙන් රුපියල් දස ලක්ෂ 30 කට අධික මුදලක් වෙන් කර ඒවා ආරක්ෂා කිරීම සඳහා විශාල ගොඩනැගිල්ලක් ඉදිවෙමින් පවතින බව අද තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති. අපේ බලාපොරොත්තුව එය සම්පූර්ණයෙන්ම වායු සමීකරණය කරන්නටයි. ඒ හැර, ඉන්දියාවේ ෆෝඩ් පදනමෙන් මේ මුදල අපට පරිත්‍යාග කර තිබෙන්නේ පෞද්ගලික සන්තකයේ තිබෙන පුස් කොළ පොත් සූක්ෂ්ම චිත්‍රපටි ගත කිරීමටයි. ඒ අතර රාජ්‍ය ලේඛනාගාරයේ තිබෙන වටිනා ලේඛනත් ඒ ආකාරයෙන්ම සූක්ෂ්ම චිත්‍රපට ගත කිරීමට අප ක්‍රියා කර ගෙන යනවා. එම නිසා මේවා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කිසිම බියක් ඇති කර ගන්නට අවශ්‍ය නැහැ.

රාජ්‍ය ලේඛනාගාරයේ කටයුතු පිළිබඳව සොයා බැලීමට පසුගිය රජය විසින් පත් කරන ලද කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් ස්වල්ප දෙනෙක් ඒ අයගේ තනතුරුවලින් පහත් මට්ටමට දමා තිබෙනවා කියා දුන් බද්දේගම ගරු මන්ත්‍රීතුමා මතක් කළා. මෙවැනි දෙයක් මා ඇසූ පළමු වතාව මෙයයි. ඒ සම්බන්ධ විස්තර මා හට ලැබෙන්නට සැලැස්සුවහොත් මොන විධියේ අසාධාරණයක් සිදුවෙලා තිබෙනවාද නැද්ද කියා මට සොයා බලන්නට පුළුවන්.

මෙය ඉතාමත් වැදගත් වැය ශීර්ෂයක්. මේ විධියෙන් අපට ආධාර කිරීම ගැන ඉන්දියාවේ ෆෝඩ් පදනමට මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අවශ්‍ය උපකරණ ලබා ගෙන අවුරුදු තුනක් තුළ මෙය අවසන් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. එම නිසා මා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා මෙම පරිපූරක ඇස්තමේන්තුව ඒකච්ඡන්දයෙන් සම්මත කරන්නය කියා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය : වාර්ෂික වාර්තාව
### *கமத்தொழில் அபிவிருத்தி அதிகாரசபை : ஆண்டறிக்கை*
## AGRICULTURAL DEVELOPMENT AUTHORITY : ANNUAL REPORT

**ගාමිනී ජයසූරිය මහතා**
*(திரு. காமினி ஜயசூரிய)*
(Mr. Gamani Jayasuriya)

I move,

"That in terms of Section 23 of the State Agricultural Corporation Act, No 11 of 1972 read with Sub-Section (3) of Section 14 of the finance Act, No. 38 of 1971, the Annual Report and the Statement of Accounts including the observations of the Auditor-General for the year 1982 which was presented on 21.07.1983, be approved."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව : වාර්ෂික වාර්තාව

## ஸ்ரீ லங்கா புகையிலைக் கைத்தொழில் கூட்டுத்தாபனம் : ஆண்டறிக்கை

## SRI LANKA TOBBACCO INDUSTRIES CORPORATION : ANNUAL REPORT

සිරිල් මැතිව් මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)
(திரு. சிறில் மத்திவ்—கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(Mr. Cyril Mathew – Minister of Industries & Scientific Affairs)

I move,

"That in terms of Section 14(3) of the Finance Act, No. 38 of 1971, the Annual Report and the Statement of Accounts of Sri Lanka Tobbacco Industries Corporation, being report incorporating the Auditor-General's observations for the year ended 31st December, 1981, which was presented on 21.07.1983 be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Item No. 9

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

This item can stand down.

## කල්තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Parliament do now adjourn"

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)
(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)
(Mr. Sarath Muttetuwegama – Kalawana)

I have given notice of a question to the Minister of Internal Security. Unfortunately he may have been of the view that because Standing Orders were suspended there might be no questions at Adjournment today. He is not here today but anyway I would like to ask this question. It pertains to the detenues who have been taken into custody under the present Emergency Regulations.

Sir, there are a large number of detainees from several political parties ; and some people who I believe are not even members of any party have been taken into detention. I am not talking of the people who have been taken into custody with possession of looted goods or caught in the act of looting. I am talking of persons who have been taken into custody on detention orders served on them.–(*Interruption*). No, not persons violating the curfew but persons who have been taken into custody on detention orders, probably on suspicion or on some material that the Government has. They are bieng held in the Negombo remand prison.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! The Hon. Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, කථානායකතුමා [අල් හාජ්ජ්ම්. අබ්දුල් බාකීර් මාකාර් මහතා] මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr Sarath Muttetuwegama)

At the moment these detainees are being held in the Negombo remand prison. A number of people including lawyers acting on their behalf have made applications to visit them and to talk to them. I understand that right up to now neither lawyers nor members of their immediate families nor other visitors are being allowed to see these detainees. I do not know, Sir, whether there is any reason why lawyers, in particular, and members if their immediate families are not being allowed to see the detainees. I would like to inform the Government that there have been instances earlier at different times in the history of our country when people have been held under detention and they have always had access to lawyers, or at least on most occassions they have had access to visitors. Certainly members of their families have been given the unfettered right to see them during certain hours.

I also understand that meals are not being allowed to be supplied to the detainees. That may be for some security reason. But at least, where lawyears and members of the immediate families of the detainees want to see them, I do not think the Government can have any serious objection. So I would like to ask the Government to make an authoritative statement that this policy which has been hitherto followed will be reversed and that these detainees will be allowed access to their lawyears, relatives and friends.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I have given notice of a question yesterday to the Hon. Minister of Justice.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I do not see your name in today's list.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I gave it yesterday.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Have you informed the Minister? Did you give notice of your question to the Hon. Minister?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Yes, yesterday.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)
(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)
(Mr. Sarath Muttetuwegama-Kalawana)

Now the procedure is to give the question to the Secretary-General and he transmits it. That was the agreement that we arrived at and that is being followed.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Have you seen to it that it was sent to the Hon. Minister? Yes, carry on.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

About a week ago during the troubled times the caretaker of Horogalla, Mr. R. A. H. Ranassinghe–he is about 65 years of age–and seven others were taken into custody either on suspicion or for some reason which is not known to us even now. He was taken to the Nittambuwa police station. From there they were remanded and taken to the Mahara prison. From Mahara prison they were brought to the Welikada prison. At Welikada prison they made and application for bail. apparently, under the Emergency law no person can be given bail, and therefore they are being just kept there. There is no charge against them.

Yesterday an unfortunate situation arose when some meals were taken for them. The officers there did not permit the meals to be given and the people who took the meals were treated very badly. They did not permit even that.

Therefore, Sir, I think it is time now that the Government categorized these people. Here is a gentleman 75 years of age. I just cannot imagine that he went to loot. There is no reason what soever given. I was told that when bail was asked the police had no objection and the Magistrate did give bail, but then suddenly in the afternoon they withdrew bail. Therefore, Sir, there is something wrong somewhere. Either these orders are wrong or contravening orders are being given by various authorities. There are Competent Authorities, there are Essential Competent Authorities, there are Minor Competent Authorities; the whole works in in an unfortunate situation including even the judiciary. That is what I feel.

Therefore, I would like, through you, Sir, to appeal to the Government. If it is Emergency law I can understand, but this does not come under any Emergency law because we do not know what the charge is. We do not know whether he has actually violated any rule under the Emergency or whether he comes under the ordinary law. If it is under the ordinary law he should have been out two days ago, but he is kept under custody yet.

There are seven others like that. One is a gentleman called Sugathadasa Senarath, who had just got married. He came with a curfew pass for his first night and he was taken into custody. Do you think that a gentleman will go within a day or two his wedding night to loot? There is another gentleman, whom I know, who is having tractors. He is a businessman and I know him very well. This happened in the Attanagalla Electorate. He is a person from a very respectable family called Alagiyawanna. He is Muhandiram Alagiyawanne's grandson. There is another gentleman–Mr. Podiappuhamy's son. We call him "G" Mahatmaya. He is ordinary peasant. I do not think he would ever have gone to loot. I do not think he knows what looting is.

There are four responsible Minisers here and I hope they will bring these matters to the notice of the Government and see that these people are released.–(*Interruption.*) Mr. Paul Perera is here. I am sure he will testify to what I have said. I am sure he will agree to their release. I do not think he is involved in this. He could take up this matter. Apparently Mrs. Paul perera is the UNP organizer. I am sure he could bring pressure on Mrs. Paul Perera and she will be able to free them from jail. I am sure Hon. Ministers will kindly look into this.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Anyone in a position to answer these questions ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

I will bring these matters to the notice of the Ministers concerned. In regard to bail under the Emergency Regulations, I am aware that there is a certain procedure to be followed.

අනිල් මූණසිංහ මහතා
*(திரு. அனில் முனசிங்ஹ)*
(Mr. Anil Moonesinghe)

Where in a court of law a person has been enlarged on bail and a bail bond has been posted, nevertheless the person has not been released.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

Although the Magistrate had granted bail, the question is whether he has the right to grant bail. That is the important thing, Sir.

අනිල් මූණසිංහ මහතා
*(திரு. அனில் முனசிங்ஹ)*
(Mr. Anil Moonesinghe)

But who determines that ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

There are certain regulations. I am no lawyer, Sir, I have been a lawyer's clerk. My friend is a lawyer. From the little law I have learnt I know there is a certain procedure to be followed. So I think if you consult the hon. Member for Kalawana, he might be able to help you.

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
*(திரு. ஆனந்த தஸநாயக்க—கொத்மலே)*
(Mr. Ananda Dassanayake – Kotmale)

ගරු කථානායකතුමනි, මම වැඩිවෙලා ගන්නෙ නැහැ. මිනිත්තුවක් පමණයි ඕනෑ වෙන්නෙ. 1983 අගෝස්තු 9 වැනි අඟහරුවාද හැන්සාඩ් වාර්තාවේ 1524 තීරුවේ සඳහන් වෙනවා, නැගෙනහිර අනුරාධපුර මන්ත්‍රීතුමා (යසපාල හේරත් මහතා) කළ කථාව. ඒ මන්ත්‍රීතුමාගේ කථාවේදී කියා තිබෙනවා "කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) අනුරාධපුරයට ඇවිල්ලා තඹුත්තේගමට පැමිණ රාත්‍රී ගෙදරක නිදාගෙන හිටියා" කියා. මේක සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශයක්. මම හිතන හැටියට ඒක 'ජෝක්' එකක් නැත්නම් විහිළුවක් වශයෙන් කිව්ව දෙයක්. ඒක ඇතිවෙලා තිබෙන්නෙ – ගරු කථානායකතුමනි,

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

රාත්‍රී ගේක බුදියාගෙන හිටියා කියලයිද, කියා තිබෙන්නෙ ?

ආනන්ද දසනායක මහතා
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

I am denying this. You have to accept my denial.

සිරිල් මැතිව් මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)
*(திரு. சிறில் மத்திவ்—கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)*
(Mr. Cyril Mathew – Minister of Industries & Scientific Affairs)

He was there that day. තමුන්නාන්සේ ඔතන හිටිය නේ. ඊයේ ?

ආනන්ද දසනායක මහතා
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

I have never been at Anuradhapura during the Presidential Election campaign. I was in Kotmale and I was doing my work there. I confined myself to campaigning Kotmale. I was never at Anuradhapura during that period.

සිරිල් මැතිව් මහතා
*(திரு. சிறில் மத்திவ்)*
(Mr. Cyril Mathew)

No, no, you were there the day that was said. You never objected to it that day.

ආනන්ද දසනායක මහතා
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

He said I was sleeping with some woman !

මන්ත්‍රීවරයෙක්
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)

ජේන් නෝනා කෙනෙක් ගැන කියනවා.

ආනන්ද දසනායක මහතා
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

That is, I think, in a way vulgar. Really speaking our MP–

සිරිල් මැතිව් මහතා
*(திரு. சிறில் மத்திவ்)*
(Mr. Cyril Mathew)

Sleeping is not vulgar.

ආනන්ද දසනායක මහතා
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

I think something is wrong with him after his return from England. Something must have happened in England.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

Therefore, I am very sorry, Sir. I deny totally that I had been to Anuradhapura–

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Your denial can be noted.

ආනන්ද දසනායක මහතා
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

I had never been to Anuradhapura during that period.

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.08 ට, අද දින පාර්ලිමේන්තු සම්මතිය අනුව 1983 අගෝස්තු 25 වන බ්‍රහස්පතින්ද අ. භා. 3 වන තෙක් කල් ගියේය.*

*அதன்படி, பி. ப. 7.8 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க 1983 ஓகஸ்ட் 25, வியாழக்கிழமை பி. ப. 3 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 7.08 p.m. until 3 p.m. on Thursday, 25th August 1983 pursuant to tne Resolution of Parliament, this day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

**1983 අගෝස්තු 25 වන බ්‍රහස්පතින්ද**

**නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.**

**குறிப்பு**

***அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு***

***1983 ஓகஸ்ட் 25, வியாழக்கிழமைக்குப் பிந்தாமற்***

**கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.**

**NOTE**

**Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD,**

**not later than**

**Thursday, 25th August 1983**

* * * * * * * * * * *

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | : | **From 3.00 p.m. on 11.08.1983 to 7.08 p.m. on 11.08.1983** |
| **Final set of manuscripts received from Parliament** | : | **9.58 p.m. on 11.08.1983** |
| **Printed copies despatched** | : | **12.08.1983 evening** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org